අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

ඇගයීම් වාර්තාව

21 - ආර්ථික විද්‍යාව

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

අ.පො.ස.(උ.පෙළ) විභාගය -2018

ඇගයීම් වාර්තාව

21 - ආර්ථික විද්‍යාව

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්ව විද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2018 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 218191 ක් පාසල් අයදුම්කරුවෝ ද 48920ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නො අනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) ආර්ථික විද්‍යාව විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ආර්ථික විද්‍යාව විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2018 විභාගයේ ආර්ථික විද්‍යාව විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2020 මැයි 28
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

උපදේශකත්වය	:	බී. සනත් පූජිත විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා සංවිධානය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ/ සංවර්ධන හා ඇගයීම්)
සම්බන්ධීකරණය	:	එස්. ප්‍රනවදාසන් නියෝජ්‍ය විභාග කොමසාරිස්
විෂය සම්බන්ධීකරණය	:	ඩී. ආර්. එන්. කේ. ගමගේ මිය සහකාර විභාග කොමසාරිස් පී. ඒ. වෙනුර චන්දික සහකාර විභාග කොමසාරිස්
සංස්කරණය	:	සම්මානිත මහාචාර්ය ඩැනී අතපත්තු ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය රුහුණ විශ්ව විද්‍යාලය ආචාර්ය එම්. ගනේෂමූර්ති ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය කොළඹ විශ්ව විද්‍යාලය
සැකසුම් කමිටුව	:	ඩබ්ලිව්. ලයනල් වීරසිංහ ගුරු සේවය කො/විශාඛා විද්‍යාලය - කොළඹ ඩී.ජී. සුගත් ගුරු සේවය මාර/විජිත මධ්‍ය විද්‍යාලය - දික්වැල්ල එම්. ජී. තමරා ටී. කාරියවසම් ගුරු සේවය ගා/රිපන් බාලිකා විද්‍යාලය - ගාල්ල කේ.එන්. නිශාන්ත ගුරු සේවය ර/ඇඹි/ජනාධිපති විද්‍යාලය -ඇඹිලිපිටිය ආර්. එම්. කුලතුංග ගුරු සේවය ශ්‍රී ස්වර්නාජෝති ජාතික පාසල කිරිබත්කුඹුර පී. චන්ද්‍රලතා පුංචිමැණිකේ ගුරු සේවය ර/ සීවලී මධ්‍ය විද්‍යාලය හිඳැල්ලන රත්නපුර
පරිගණක පිටපත සැකසුම	:	ඕ.එම්. දර්ශනී සෙව්වන්දි දත්ත සටහන් ක්‍රියාකරු
පිටකවර නිර්මාණය	:	ඒ.එල්.කේ. චතුරාණි කළමනාකරණ සේවා නිලධාරි

ඇතුළත පිටු

පිටු අංකය

I කොටස

1. **විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු**

1.1 **විෂය අභිමතාර්ථ** 1

1.2 **විෂය සාධනය පිළිබඳ තොරතුරු**
1.2.1. විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. පළමුවන වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 **විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය**

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය (අ) කොටස 7
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය (ආ) කොටස 8

II කොටස

2. **ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1 **I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 9
2.1.2. I ප්‍රශ්න පත්‍රය 10
2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18
2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ 19
2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 20
2.1.6. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21

2.2 **II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 23
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 24
2.2.3. 2018 වර්ෂයේ සිසුන්ගේ පිළිතුරු පත්‍රවල දක්නට ලැබුණු පොදු දුර්වලතා හා ඒ සඳහා විසඳුම් යෝජනා 71
2.2.4. II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 84

III කොටස

3. **පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා**

3.1. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 85
3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 88

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1. විෂය අභිමතාර්ථ

- ★ සමාජයක මූලික ආර්ථික ප්‍රශ්න විද්‍යාත්මක ව විශ්ලේෂණය කිරීම හා එම මූලික ආර්ථික ප්‍රශ්න නිරාකරණය කිරීම පිණිස යොදා ගත හැකි විකල්ප ක්‍රම පිළිබඳ ව විචාරාත්මක අවබෝධයක් ලබාදීම.
- ★ ආර්ථික සංකල්ප හා න්‍යාය යොදා ගනිමින් ප්‍රායෝගික ආර්ථික ප්‍රශ්න හා උපනති විශ්ලේෂණය සඳහා අවශ්‍ය කුසලතා ලබාදීම.
- ★ සාර්ව ආර්ථික විචල්‍යවල හැසිරීම හා එම විචල්‍ය අතර පවතින අන්තර් සම්බන්ධතා තේරුම් ගැනීමට සැලැස්වීම.
- ★ වෙළෙඳපොළක ආයතන හා පුද්ගලයන් තාර්කික ව හැසිරෙන ආකාරය විමර්ශනය කිරීමට පෙළඹවීම.
- ★ ආර්ථික විද්‍යානුකූල ව සිතීම සඳහා අවශ්‍ය වන තාර්කික චින්තනය ඇති කිරීම.
- ★ විවිධ ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ ව පිළිගත් අර්ථකථන අධ්‍යයනයට අවස්ථා ලබාදීම.
- ★ වෙළෙඳපොළ ක්‍රමයක් ඔස්සේ සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය මැදිහත් වන ආකාරය පිළිබඳ ව විමසා බැලීමට යොමු කිරීම.
- ★ පවතින ආර්ථික ප්‍රතිපත්ති විචාරශීලී ව විග්‍රහ කිරීමේ හැකියාව ලබාදීම.
- ★ ආර්ථික සංවර්ධනයේ විවිධත්ව තුලනාත්මක ව විමසීමට අවශ්‍ය කුසලතා ලබාදීම.
- ★ ආර්ථික විද්‍යා විෂයය විශ්ලේෂණාත්මක ව පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය මූලික නිපුණතා ලබාදීම.
- ★ අන්තර්ජාතික වෙළෙඳාමේ, මූල්‍යයේ වැදගත්කම හා ගෝලීයකරණය අතර ඇති සම්බන්ධතාව පෙන්වා දීම.
- ★ ශ්‍රී ලංකා ආර්ථිකයේ කාර්ය සාධනය පිළිබඳ ව විචාරාත්මක ව දැකීමට හැකි කුසලතා වර්ධනය කිරීම.
- ★ සමාජයේ යහපැවැත්මට කටයුතු කිරීම සඳහා අවශ්‍ය පදනමක් ලබාදීම.
- ★ උසස් අධ්‍යාපනයට යොමු වීම සඳහා යෝග්‍ය පදනමක් ලබාදීම.

1.2. විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.2.1. විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

මාධ්‍යය	පාසල්	පෞද්ගලික	එකතුව
සිංහල	45204	4657	49861
දෙමළ	7462	1051	8513
ඉංග්‍රීසි	1973	920	2893
එකතුව	**54639**	**6628**	**61267**

වගුව 1

1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පාසල් අයදුම්කරුවන්		පෞද්ගලික අයදුම්කරුවන්		එකතුව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
A	8332	15.25	503	7.59	8835	14.42
B	7683	14.06	589	8.89	8272	13.50
C	12891	23.59	1071	16.16	13962	22.79
S	11969	21.91	1534	23.14	13503	22.04
F	13764	25.19	2931	44.22	16695	27.25
එකතුව	**54639**	**100.00**	**6628**	**100.00**	**61267**	**100.00**

වගුව 2

1.2.3. පළමුවන වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		අසමත් (F)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
1. කොළඹ	8703	1702	19.56	1189	13.66	2024	23.26	2144	24.64	7059	81.11	1644	18.89
2. ගම්පහ	5150	755	14.66	646	12.54	1187	23.05	1314	25.51	3902	75.77	1248	24.23
3. කළුතර	2720	405	14.89	413	15.18	641	23.57	637	23.42	2096	77.06	624	22.94
4. මහනුවර	3256	399	12.25	353	10.84	715	21.96	848	26.04	2315	71.10	941	28.90
5. මාතලේ	762	83	10.89	114	14.96	163	21.39	191	25.07	551	72.31	211	27.69
6. නුවරඑළිය	1050	123	11.71	160	15.24	264	25.14	264	25.14	811	77.24	239	22.76
7. ගාල්ල	2237	405	18.10	302	13.50	525	23.47	488	21.81	1720	76.89	517	23.11
8. මාතර	1578	238	15.08	198	12.55	323	20.47	398	25.22	1157	73.32	421	26.68
9. හම්බන්තොට	971	116	11.95	114	11.74	194	19.98	243	25.03	667	68.69	304	31.31
10. යාපනය	921	142	15.42	139	15.09	249	27.04	226	24.54	756	82.08	165	17.92
11. කිලිනොච්චි	178	22	12.36	28	15.73	47	26.40	47	26.40	144	80.90	34	19.10
12. මන්නාරම	182	28	15.38	18	9.89	56	30.77	46	25.27	148	81.32	34	18.68
13. වව්නියාව	294	56	19.05	41	13.95	77	26.19	67	22.79	241	81.97	53	18.03
14. මුලතිව්	154	22	14.29	28	18.18	31	20.13	43	27.92	124	80.52	30	19.48
15. මඩකලපුව	581	88	15.15	94	16.18	159	27.37	118	20.31	459	79.00	122	21.00
16. අම්පාර	872	88	10.09	120	13.76	224	25.69	239	27.41	671	76.95	201	23.05
17. ත්‍රිකුණාමලය	520	67	12.88	73	14.04	118	22.69	136	26.15	394	75.77	126	24.23
18. කුරුණෑගල	2606	411	15.77	337	12.93	646	24.79	639	24.52	2033	78.01	573	21.99
19. පුත්තලම	1330	215	16.17	204	15.34	298	22.41	347	26.09	1064	80.00	266	20.00
20. අනුරාධපුරය	1292	150	11.61	154	11.92	285	22.06	353	27.32	942	72.91	350	27.09
21. පොළොන්නරුව	601	60	9.98	79	13.14	139	23.13	166	27.62	444	73.88	157	26.12
22. බදුල්ල	1365	141	10.33	162	11.87	309	22.64	411	30.11	1023	74.95	342	25.05
23. මොණරාගල	631	95	15.06	92	14.58	176	27.89	145	22.98	508	80.51	123	19.49
24. රත්නපුරය	1762	310	17.59	242	13.73	397	22.53	413	23.44	1362	77.30	400	22.70
25. කෑගල්ල	1324	172	12.99	152	11.48	325	24.55	352	26.59	1001	75.60	323	24.40
සමස්ත දිවයින	**41040**	**6293**	**15.33**	**5452**	**13.28**	**9572**	**23.32**	**10275**	**25.04**	**31592**	**76.98**	**9448**	**23.02**

වගුව **3**

1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91 - 100	675	1.10	61267	100.00
81 - 90	3993	6.52	60592	98.90
71 - 80	7308	11.93	56599	92.38
61 - 70	8710	14.22	49291	80.45
51 - 60	9356	15.27	40581	66.24
41 - 50	10226	16.69	31225	50.97
31 - 40	9896	16.15	20999	34.27
21 - 30	7431	12.13	11103	18.12
11 - 20	3366	5.49	3672	5.99
01 - 10	306	0.50	306	0.50
00 - 00	0	0.00	0	0.00

වගුව 4

ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 9 896 ක් වන අතර, එය මුළු අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් 16.15% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 20 999 කි. එම සංඛ්‍යාව මුළු අපේක්ෂකයින්ගෙන් 34.27% කි.

1.3. විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව 3 සහ 4වන ප්‍රශ්නවලට ඉහළ පහසුතා දර්ශකයක් පෙන්වයි. අපේක්ෂකයින්ගෙන් 83%ක් එම ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත. එබැවින් මෙම ප්‍රශ්න අපේක්ෂකයන්ට පහසුතාව වැඩි ප්‍රශ්නයක් වන අතර ඒවායේ පහසුතා දර්ශකය 0.83කි. 44වන ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් වැඩි දුෂ්කරතාවක් දක්වන අතර එහි පහසුතා දර්ශකය 0.21කි.

1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය



ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරයට අනුව අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනකු 'අ' උප කොටසේ 1වන ප්‍රශ්නය තෝරා ගෙන ඇත. එම ප්‍රතිශතය 97.95%කි. 'ආ' උප කොටසේ ප්‍රශ්න අතුරෙන් වැඩි ම පිරිසක් තෝරාගෙන ඇත්තේ 7වන ප්‍රශ්නයයි. එම ප්‍රතිශතය 79.82%කි.

1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය



ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙහි 1වන ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20කි. මෙම ප්‍රස්තාරයට අනුව එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබාගත් ප්‍රතිශතය 29%කි. එමෙන්ම වෙන්කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබා ගත් ප්‍රතිශතය 14%ක් පමණ වේ.

1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018
21 - ආර්ථික විද්‍යාව - II පත්‍රය ('අ' කොටස)
එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වල අනුකොටස්වල පහසුතා දර්ශක



ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අපේක්ෂකයන් වැඩිම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 5(ii) (අ) අනු කොටසෙහි පහසුතා දර්ශකය 0.94කි. එනම් එම අනු කොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 94%ක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එහි පහසුතාව 94%කි. අපේක්ෂකයන් අතුරෙන් අවම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇත්තේ 4(iv) (ආ) අනු කොටස සඳහාය. එහි පහසුතා දර්ශකය 0.14කි. ඒ අනුව එම අනු කොටසෙහි පහසුතාව 14%කි.



ප්‍රස්තාරය 4.2 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව 7වන ප්‍රශ්නයේ (i) කොටසේ (අ) අනු කොටසට ඉහළ පහසුතා දර්ශකයක් පෙන්වයි. අපේක්ෂකයන්ගෙන් 95%ක් එම අනු කොටස සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත. එහි පහසුතා දර්ශකය 0.95කි. 10වන ප්‍රශ්නයෙහි (ii) වන කොටස සඳහා අපේක්ෂකයන් වැඩි දුෂ්කරතාවක් දක්වන අතර එහි පහසුතා දර්ශකය 0.05කි.

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

- කාලය පැය 02කි.
- වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි.

2.1.2. I ප්‍රශ්න පත්‍රය

1. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් අභිමතානුරූපී ප්‍රකාශයක් වනුයේ කවරක් ද?
(1) ඉන්ධන මිල ඉහළ යාම විදුලි මෝටර් රථ සඳහා ඉල්ලුම ධෛර්යමත් කරන්නේ ය.
(2) ආදායම වැඩි වන්නේ නම් සුඛෝපභෝගී භාණ්ඩ අලෙවිය පහළ වැටෙන්නේ ය.
(3) ලැප්ටොප් මිල පහළ වැටෙන විට මිනිස්සු ඒවා වැඩියෙන් මිල දී ගනිති.
(4) නිවාස හිමියන් අය කරන ගෙවල් කුලී රජය විසින් පාලනය කළ යුතු ය.
(5) භාණ්ඩයක ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය, එහි මිල වෙනස්වීම සමග ප්‍රතිවිරුද්ධ ලෙස සම්බන්ධව පවතී.
(……)

2. නිෂ්පාදන සාධකයක් ලෙස භූමියට උදාහරණයක් වශයෙන් පහත සඳහන් කවරක් දැක්විය හැකි ද?
(1) මාගම්පුර වරාය　　(2) දක්ෂිණ අධිවේගී මාර්ගය
(3) වික්ටෝරියා වේල්ල　　(4) අඹේවෙල කිරි ගොවිපොළ
(5) පාසික්කුඩා වෙරළ තීරය
(……)

3. නිෂ්පාදන හැකියා වක්‍රය මත කටයුතු කරන ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත සඳහන් කවරක් සැමවිටම නිවැරදි වන්නේ ද?
(1) එය නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක් විය යුතු ය.
(2) එය විධාන ආර්ථිකයක් විය යුතු ය.
(3) එහි සම්පත් පූර්ණ සේවා නියුක්තියෙහි පවතී.
(4) එය නිෂ්පාදන කාර්යක්ෂමතාව අත් කරගෙන ඇති නමුදු සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව එයට කිසිසේත් අත්කර ගත නොහැක.
(5) එයට රේඛීය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් තිබිය යුතු ය.
(……)

4. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පෙන්නුම් කෙරෙන රූපසටහනක, ආවස්ථික පිරිවැය නිරූපණය කෙරෙනුයේ,
(1) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ බෑවුමෙනි.
(2) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ඇතුළත ලක්ෂ්‍යයකිනි.
(3) මූලය හරහා අඳිනු ලබන සරල රේඛාවකිනි.
(4) සිරස් අක්ෂය මත ලක්ෂ්‍යයකිනි.
(5) තිරස් අක්ෂය මත ලක්ෂ්‍යයකිනි.
(……)

5. පහත සඳහන් දෑ අතුරෙන්, මනාව ක්‍රියාත්මක වන ධනේශ්වර ආර්ථිකයක් සඳහා අවශ්‍ය වන්නාවූත්, විධාන ආර්ථිකයක් සඳහා අවශ්‍ය **නොවන්නාවූත්** කරුණ කවරක් ද?
(1) මධ්‍යගත තීරණ ගැනීම　　(2) සම්පත් හිඟකම
(3) ඒකාධිකාරී ආයතන　　(4) දේපළ හිමිකම් සුරැකීම
(5) ධන බාහිරතා
(……)

6. කිසියම් ආයතනයක් සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව සහිත නිමැවුම් මට්ටමෙහි සිටින විට,
(1) මුළු අයභාරය මුළු පිරිවැයට සමාන වේ.
(2) ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වේ.
(3) ආන්තික අයභාරය ආන්තික පිරිවැය ඉක්මවා යයි.
(4) මිල සාමාන්‍ය මුළු පිරිවැයට සමාන වේ.
(5) මිල ආන්තික පිරිවැයට සමාන වේ.
(……)

7. අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී X භාණ්ඩයෙහි මිල පහළ බසී නම්, X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළෙහි සිදුවීමට බොහෝසෙයින් ඉඩකඩ ඇත්තේ පහත සඳහන් කවරක් ද?
(1) X භාණ්ඩයෙහි සැපයුම අඩු වන්නේ ය.
(2) X භාණ්ඩය සඳහා ඉල්ලුම වැඩි වන්නේ ය.
(3) X භාණ්ඩය සඳහා ඉල්ලුම අඩු වන්නේ ය.
(4) X භාණ්ඩය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වන්නේ ය.
(5) X භාණ්ඩය සැපයුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වන්නේ ය.
(……)

8. ඉල්ලුම් වක්‍රයක් ඇඳීමේදී පදනම් කරගනු ලබන උපකල්පනය වන්නේ,
(1) මිල අඩු වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය සැමවිටම වැඩි වන්නේය යන්න ය.
(2) මිල අඩු වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය සැමවිටම අඩු වන්නේය යන්න ය.
(3) මිලෙහි හටගන්නා වෙනස්කම්, සැපයුම කෙරෙහි බලපාන්නේ නැතැයි යන්න ය.
(4) ඉල්ලුමෙහි මිල නම්‍යතාව, ඉල්ලුම් වක්‍රය දිගේ වෙනස් නොවේය යන්න ය.
(5) මිල හැර ඉල්ලුම කෙරෙහි බලපාන සාධක ස්ථාවරව පවතීය යන්න ය.
(……)

9. කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳපොළක සපයනු ලබන ප්‍රමාණය (Q_S) හා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය (Q_D) පිළිවෙළින් $Q_S = -30 + P$ සහ $Q_D = 240 - 2P$ වශයෙන් දැක්වෙන අතර, P වලින් දැක්වෙන්නේ ඒකකයක මිල රුපියල්වලිනි. එම භාණ්ඩය මත පනවනු ලබන නිෂ්පාදන බද්දක වෙනස්වීමක් නිසා, සැපයුම $Q_S = -36 + P$ ස්වරූපය ගනී. බද්දේ හටගත් මෙම වෙනස සමතුලිත මිල කෙරෙහි බලපානුයේ කෙසේ ද?

(1) රුපියල් 2 කින් පහළ බසී.
(2) රුපියල් 6 කින් පහළ බසී.
(3) රුපියල් 2 කින් ඉහළ නගී.
(4) රුපියල් 6 කින් ඉහළ නගී.
(5) රුපියල් 90 කින් ඉහළ නගී.

(……)

10. තේ සඳහා ඉල්ලුමත් සැපයුමත් දෙකම එකවර වැඩි වන්නේ නම්, තේ වෙළෙඳපොළෙහි සමතුලිත මිල හා ප්‍රමාණය කෙරෙහි එය කෙසේ බලපානු ලැබේ ද?

	මිල	ප්‍රමාණය
(1)	වැඩි වේ.	වැඩි වේ.
(2)	අඩු වේ.	අඩු වේ.
(3)	අඩු වේ.	වැඩි වේ.
(4)	වැඩි වේ.	අවිනිශ්චිත ය.
(5)	අවිනිශ්චිත ය.	වැඩි වේ.

(……)

11. කිසියම් පුද්ගලයෙකුගේ ආදායම ඉහළ යන විට, කිරි සඳහා ඔහුගේ ඉල්ලුම වැඩි වේ නම්, කිරි උදාහරණයක් ලෙස ගත හැක්කේ,

(1) බාල භාණ්ඩයකට ය.
(2) නොමිල භාණ්ඩයකට ය.
(3) සාමාන්‍ය භාණ්ඩයකට ය.
(4) ශුභ සාධන භාණ්ඩයකට ය.
(5) ගිෆන් භාණ්ඩයකට ය.

(……)

12. කිසියම් ආයතනයක් නිපදවනු ලබන භාණ්ඩයක් සඳහා පූර්ණ අනම්‍ය ඉල්ලුමක් පවතී යැයි උපකල්පනය කරන්න. ආයතනය එම භාණ්ඩයේ මිල 6% කින් ඉහළ නංවනු ලැබුවහොත්, ආයතනයේ අයභාරය මත කෙබඳු බලපෑමක් ඇති වේ ද?

(1) අයභාරය නොවෙනස්ව පවතිනු ඇත.
(2) අයභාරය 6% කින් ඉහළ නගිනු ඇත.
(3) අයභාරය 6% කින් පහළ බසිනු ඇත.
(4) අයභාරය ශුන්‍ය කරා පහළ බසිනු ඇත.
(5) අයභාරය 6% කට වඩා අඩු ප්‍රමාණයකින් ඉහළ නගිනු ඇත.

(……)

13. 2016 වර්ෂයේදී තරගකාරී වෙළෙඳපොළක, කුරුඳු කිලෝග්‍රෑම් එකක් රුපියල් 900 බැගින් කිලෝග්‍රෑම් මිලියන 10ක් අලෙවි කරන ලදී. 2017 වර්ෂයේදී, එම වෙළෙඳපොළෙහි, කිලෝග්‍රෑම් එකක් රුපියල් 800ක් බැගින් කුරුඳු කිලෝග්‍රෑම් මිලියන 10ක් අලෙවි කරන ලදී. කුරුඳු ඉල්ලුමේ සහ සැපයුමේ පහත සඳහන් කෙබඳු වෙනස්කම්, මෙම ප්‍රතිඵලය ඇති කිරීමට හේතු වූයේ ද?

	ඉල්ලුම	සැපයුම
(1)	වැඩි වීම	වැඩි වීම
(2)	අඩු වීම	අඩු වීම
(3)	අඩු වීම	වැඩි වීම
(4)	වැඩි වීම	අඩු වීම
(5)	අඩු වීම	නොවෙනස්ව තිබීම

(……)

14. එක්තරා පාරිභෝගික භාණ්ඩයක් සඳහා වන වෙළෙඳපොළ සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන බවත්, වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වන බවත් සලකන්න. මෙම භාණ්ඩය සඳහා ඒකක සහනාධාරයක් ලබා දීම, පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය කෙරෙහි කෙසේ බලපානු ලබන්නේ ද?

	පාරිභෝගික අතිරික්තය	නිෂ්පාදක අතිරික්තය
(1)	අඩු වේ.	අඩු වේ.
(2)	අඩු වේ.	වැඩි වේ.
(3)	වැඩි වේ.	වැඩි වේ.
(4)	වැඩි වේ.	අඩු වේ.
(5)	වැඩි වේ.	නොවෙනස්ව පවතී.

(……)

15. තරගකාරී වෙළෙඳපොළක අලෙවි කෙරෙන භාණ්ඩයකට අදාළ වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර, පහත සඳහන් සමීකරණයන්ගෙන් නිරූපණය වේ යැයි සලකන්න.

$Q_D = 160 - 4P \qquad Q_S = -20 + 2P$

වෙළෙඳපොළ සමතුලිත වන විට මිල ඉල්ලුම් නම්‍යතාවය

(1) – 2.4 කි. (2) – 2.6 කි. (3) – 2.8 කි. (4) – 3.0 කි. (5) – 5.3 කි. (……)

16. ආයතනයක් තම කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේදී, එක් විචල්‍ය යෙදවුමක් පමණක් භාවිත කරනු ලැබේ යැයි උපකල්පනය කරන්න. මෙහිදී ආයතනය හීනවන ඵලයන්ට මුහුණ දෙනු ලැබේ නම්, එකී විචල්‍ය යෙදවුම වැඩි වැඩියෙන් භාවිත කරත්ම පහත සඳහන් කවරක් සිදු විය හැකි ද?

(1) ආන්තික පිරිවැය ස්ථාවර වේගයකින් පහළ වැටෙන්නේ ය.
(2) ආන්තික පිරිවැය අඩු වන වේගයකින් පහළ වැටෙන්නේ ය.
(3) ආන්තික පිරිවැය ඉහළ නගින්නේ ය.
(4) ආන්තික නිෂ්පාදිතය ස්ථාවර වේගයකින් ඉහළ නගින්නේ ය.
(5) ආන්තික නිෂ්පාදිතය අඩු වන වේගයකින් ඉහළ නගින්නේ ය. (……)

17. එක්තරා ආයතනයක නිමැවුම ශූන්‍ය වන විට, මුළු පිරිවැය රුපියල් 300ක් වේ. ඒකක 5ක් නිෂ්පාදනය කරන විට මුළු පිරිවැය රුපියල් 630ක් වේ. ඒකක 5ක් නිෂ්පාදනය කරන විට සාමාන්‍ය විචල්‍ය පිරිවැය කොපමණ ද?

(1) රුපියල් 60
(2) රුපියල් 66
(3) රුපියල් 122
(4) රුපියල් 126
(5) රුපියල් 330 (……)

18. පහත සඳහන් කවර ද පූර්ණ තරගකාරී වෙළෙඳපොළක ලක්ෂණ වන්නේ ද?

A - අලුත් ආයතනවලට ඉතා පහසුවෙන් වෙළෙඳපොළට ප්‍රවේශ විය හැකි ය.
B - භාණ්ඩ ප්‍රභේදනයක් නොමැත.
C - වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ.
D - වෙළෙඳපොළ තුළ සිටින එක් එක් ආයතනයේ සැපයුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ.

(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) A, B සහ C පමණි.
(4) A, B සහ D පමණි.
(5) B, C පමණි. (……)

19. පූර්ණ තරගකාරී ආයතනයක පවත්නා නිමැවුම් මට්ටමේදී ආන්තික පිරිවැය රුපියල් 80කි. සාමාන්‍ය විචල්‍ය පිරිවැය රුපියල් 50කි. සාමාන්‍ය ස්ථාවර පිරිවැය රුපියල් 30ක් සහ භාණ්ඩයේ මිල රුපියල් 80ක් වේ. මෙම ආයතනය සම්බන්ධයෙන් පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?

(1) ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වන බැවින් ආර්ථික ලාභ ශූන්‍ය වේ.
(2) මුළු අයභාරය මුළු පිරිවැයට වඩා අඩු බැවින් ආර්ථික ලාභ සෘණ වේ.
(3) මුළු අයභාරය මුළු පිරිවැයට වඩා වැඩි බැවින් ආර්ථික ලාභ ධන වේ.
(4) මිල, සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩි බැවින් ආර්ථික ලාභ සෘණ වේ.
(5) මිල, සාමාන්‍ය මුළු පිරිවැයට සමාන බැවින් ආර්ථික ලාභ ශූන්‍ය වේ. (……)

20. ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාවක් පැවතිය හැක්කේ පහත සඳහන් කවර වෙළෙඳපොළ ව්‍යුහයක් තුළ ද?

(1) කතිපයාධිකාරය
(2) ඒකාධිකාරය
(3) පූර්ණ තරගය
(4) ස්වාභාවික ඒකාධිකාරය
(5) ඒකාධිකාරී තරගය (……)

21. කුටුම්බ හා ව්‍යාපාරික ආයතනවලින් පමණක් සමන්විත ආර්ථිකයක, ආදායමේ චක්‍රීය ප්‍රවාහය සම්බන්ධයෙන් පහත සඳහන් කවරක් අනුකූල වන්නේ ද?

(1) කුටුම්බ, භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන්නන් වන අතර ව්‍යාපාරික ආයතන, නිෂ්පාදන සම්පත් පරිභෝජනය කරන්නෝ වෙති.
(2) කුටුම්බ, නිෂ්පාදන සම්පත් භාවිත කරන්නන් වන අතර ව්‍යාපාරික ආයතන, ඉතුරුම් ජනනය කරන්නෝ වෙති.
(3) කුටුම්බ, නිෂ්පාදන සම්පත් සපයන්නන් වන අතර ව්‍යාපාරික ආයතන, භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන්නෝ වෙති.
(4) ව්‍යාපාරික ආයතන, බදු එකතු කරන්නන් වන අතර කුටුම්බ, බදු ආදායම ජනනය කරන්නෝ වෙති.
(5) ව්‍යාපාරික ආයතන, නිෂ්පාදන සම්පත් සපයන්නන් වන අතර කුටුම්බ, භාණ්ඩ හා සේවා පරිභෝජනය කරන්නෝ වෙති. (……)

22. දළ දේශීය නිෂ්පාදිතය නිර්වචනය කරනු ලබනුයේ පහත සඳහන් කවර ප්‍රකාශයකින් ද?
(1) දෙන ලද කාලපරිච්ඡේදයක් තුළදී, ආර්ථිකයක් විසින් නිෂ්පාදනය කරනු ලබන මුළු නිමැවුමේ ප්‍රමාණයයි.
(2) දෙන ලද කාලපරිච්ඡේදයක් තුළදී, ආර්ථිකයක් විසින් නිෂ්පාදනය කරනු ලබන සියලුම නිමැවුම්වල මුළු වෙළෙඳපොළ වටිනාකමයි.
(3) දෙන ලද කාලපරිච්ඡේදයක් තුළදී, ආර්ථිකයක් විසින් නිෂ්පාදනය කරනු ලබන සියලුම අවසාන භාණ්ඩ හා සේවාවල මුළු වෙළෙඳපොළ වටිනාකමයි.
(4) දෙන ලද කාලපරිච්ඡේදයක් තුළදී, දේශීය වෙළෙඳපොළෙහි අලෙවි කරන ලද අවසාන භාණ්ඩ හා සේවාවල මුළු වටිනාකමයි.
(5) දෙන ලද කාලපරිච්ඡේදයක් තුළදී, ආර්ථිකයක් විසින් නිෂ්පාදනය කරන ලද සියලුම අවසාන භාණ්ඩ හා සේවාවල මුළු වෙළෙඳපොළ වටිනාකමින්, අපනයන භාණ්ඩ හා සේවාවල වෙළෙඳපොළ වටිනාකම අඩු කළ විට ලැබෙන අගයයි. (……)

23. දළ ජාතික ආදායම මිනුම් කිරීමේදී එයට ඇතුළත් **නොවනුයේ** කවරක් ද?
(1) සේවා වියුක්තිකයන් සඳහා ලබා දෙන මූල්‍යාධාර
(2) කොටස් හිමියන් වෙත ගෙවනු ලබන ලාභාංශ
(3) සමාගම් විසින් රඳවාගනු ලබන ලාභ
(4) ඉඩම් හිමියන් වෙත ගෙවනු ලබන බදු කුලී
(5) සම්පත් හිමිකරුවන් වෙත ගෙවනු ලබන දේපොළ ආදායම් (……)

24. කර්මාන්ත තුනකින් පමණක් සමන්විත කල්පිත ආර්ථිකයක් පිළිබඳ උපකල්පනය කරන්න. A කර්මාන්තය, රුපියල් මිලියන 30ක ආනයන යෙදවුම් භාවිත කරමින් නිෂ්පාදනය කරනු ලබන තම නිමැවුම, රුපියල් මිලියන 100කට B කර්මාන්තය වෙත අලෙවි කරයි. B කර්මාන්තය, ආනයන කිසිවක් භාවිත නොකොට රුපියල් මිලියන 300ක් වටිනා නිමැවුම් ප්‍රමාණයක් C කර්මාන්තය වෙත අලෙවි කරන අතර, තවත් රුපියල් මිලියන 60ක් වටිනා නිමැවුම් විදේශීය රටකට අපනයනය කරයි. C කර්මාන්තය, රුපියල් මිලියන 30ක ආනයන යෙදවුම් භාවිත කරමින් නිෂ්පාදනය කළ තම නිමැවුම, රුපියල් මිලියන 500කට අවසාන පරිභෝජකයන්ට අලෙවි කරයි.
මෙම ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය කොපමණ ද?
(1) රුපියල් මිලියන 440 (2) රුපියල් මිලියන 500
(3) රුපියල් මිලියන 900 (4) රුපියල් මිලියන 960
(5) රුපියල් මිලියන 990 (……)

25. ආදායම් මට්ටම රුපියල් 5 000 සිට රුපියල් 10 000 දක්වා වැඩි වන විට, පරිභෝජන වියදම රුපියල් 7 000ක සිට රුපියල් 11 000ක් දක්වා ඉහළ නගී. මෙහිදී ආන්තික පරිභෝජන නැමියාව
(1) 0.8කි. (2) 0.9කි. (3) 1.0කි. (4) 1.2කි. (5) 1.4කි. (……)

26. දළ දේශීය නිෂ්පාදිතයේ විශාලතම අඩුවීමකට බලපානුයේ පහත සඳහන් කවරක් ද?
(1) ආණ්ඩුවේ මිල දී ගැනීම් හා බදු අය කිරීම් යන දෙකම රුපියල් බිලියන 50කින් ඉහළ යාම
(2) ආණ්ඩුවේ මිල දී ගැනීම් හා බදු අය කිරීම් යන දෙකම රුපියල් බිලියන 50කින් අඩු වීම
(3) රුපියල් බිලියන 50කින් බදු වැඩි කිරීම
(4) රුපියල් බිලියන 50කින් ආණ්ඩුවේ මිල දී ගැනීම් අඩු වීම
(5) රුපියල් බිලියන 50කින් ශුද්ධ අපනයන ඉහළ යාම (……)

27. රාජ්‍ය අංශයක් නොමැති ආර්ථිකයක, පරිභෝජනය (C), ආයෝජනය (I), අපනයන (X) සහ ආනයන (M) අගයන් පහත දැක් වේ.

$C = 200 + 0.75Y \quad I = 500 \quad X = 150 \quad M = 100$

මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම් මට්ටම (Y) කොපමණ ද?
(1) 3 000 (2) 3 400 (3) 3 600 (4) 3 750 (5) 3 800 (……)

28. පහත දැක්වෙන රූපසටහනෙහි සමතුලිත ජාතික ආදායම් මට්ටම $0Y_1$ ලෙසත්, පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම් මට්ටම $0Y^*$ ලෙසත් පෙන්නුම් කරයි.



මෙම ආර්ථිකයේ අවධමනාත්මක පරතරය කොපමණ ද?
(1) Y*U
(2) UV
(3) KV
(4) MV
(5) Y_1Y^* (......)

29. ශ්‍රී ලංකාවේ ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි පාද වර්ෂය කුමක් ද?
(1) 1951 (2) 2006/07 (3) 2010 (4) 2012/13 (5) 2014 (......)

30. පහත සඳහන් කවරක් පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනයට හේතු වේ ද?
(1) ශ්‍රමයේ මිල ඉහළ යාමක්
(2) විදුලිබලයේ මිල පහළ බැසීමක්
(3) කුටුම්බ පරිභෝජනයේ ඉහළ යාමක්
(4) රජයේ මිල දී ගැනීම් පහළ බැසීමක්
(5) මුදල් සැපයුමෙහි වැඩි වීමක් (......)

31. කිසියම් රටක මුදල් සැපයුමෙහි වැඩි වීමක් ඇති වීමට බොහෝ දුරට හේතු වනුයේ පහත සඳහන් කවරක් ද?
(1) ගෙවුම් ශේෂ අතිරික්තයක්
(2) ආණ්ඩුවේ අයවැය ලේඛනයේ අතිරික්තයක්
(3) වාණිජ බැංකු තැන්පත්කරුවන් විසින් මුදල් ඉවත් කර ගැනීමක්
(4) වාණිජ බැංකු විසින් දෙන ලද ණය ආපසු කැඳවීමක්
(5) මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත සුරැකුම්පත් අලෙවි කිරීමක් (......)

32. මුදල් සඳහා වන ගනුදෙනු ඉල්ලුම, ඉතා කිට්ටුවෙන් බැඳී පවත්නා මුදලේ කාර්යය වනුයේ,
(1) වටිනාකම් සන්නිධියක් වීම ය.
(2) සම්මත ගිණුම් ඒකකයක් වීම ය.
(3) වටිනාකම පිළිබඳ මිනුමක් වීම ය.
(4) හුවමාරු මාධ්‍යයක් වීම ය.
(5) විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වීම ය. (......)

33. වාණිජ බැංකු ශේෂ පත්‍රයක වගකීමක් වනුයේ පහත සඳහන් කවරක් ද?
(1) භාණ්ඩාගාර බිල්පත්
(2) ගනුදෙනුකරුවන්ගේ තැන්පතු
(3) ණය හා අත්තිකාරම්
(4) ඒක්ෂණ ණය
(5) වට්ටම් කළ බිල්පත් (......)

34. ශ්‍රී ලංකා මහ බැංකුව වර්තමානයේ සිය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී, භාවිත කරනු ලබන ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණ කවරේ ද?
(1) බැංකු අනුපාතිකය හා ප්‍රතිපත්ති පොලී අනුපාතික
(2) ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා හා විවට වෙළෙඳපොළ කටයුතු
(3) යහපෙළඹුම (ශිෂ්ට ප්‍රයෝග) හා ප්‍රතිපත්ති පොලී අනුපාතික
(4) ණය සීමා කිරීම හා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා
(5) ප්‍රතිපත්ති පොලී අනුපාතික හා විවට වෙළෙඳපොළ කටයුතු (......)

35. කිසියම් භාණ්ඩයක් පරිභෝජනය කිරීමේදී ධන බාහිරතා ජනනය කෙරෙන විට, එබඳු භාණ්ඩයක වෙළෙඳපොළ සමතුලිතය පිළිබඳව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?
(1) ආන්තික සමාජ ප්‍රතිලාභය, ආන්තික පෞද්ගලික පිරිවැයට වඩා අඩු ය.
(2) ආන්තික සමාජ ප්‍රතිලාභය, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභයට වඩා විශාල ය.
(3) ආන්තික සමාජ පිරිවැය, ආන්තික සමාජ ප්‍රතිලාභයට වඩා වැඩි ය.
(4) ආන්තික සමාජ පිරිවැය, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභයට වඩා අඩු ය.
(5) ආන්තික සමාජ පිරිවැය, ආන්තික සමාජ ප්‍රතිලාභයට සමාන වේ. (......)

36. 'ආණ්ඩුව අසමත් වීම' නමින් ආර්ථික විද්‍යාඥයින් විසින් හඳුන්වනු ලබන සංසිද්ධියට වඩාත් ම බලපෑ හැකි හේතුව වන්නේ පහත සඳහන් ඇ අතුරෙන් කවරක් ද?
(1) ඇතැම් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේදී සෘණ බාහිරතා හටගැනීම
(2) අවගුණ භාණ්ඩ (demerit goods) අධි පරිභෝජනය
(3) ආදායම් හා ධන ව්‍යාප්තිය අසමාන වීම
(4) වෙළෙඳපොළවල අපූර්ණ තරගය පැවතීම
(5) දේශපාලනඥයින් ස්වාර්ථය උදෙසා යොමු වීම (......)

37. ශුද්ධ පොදු භාණ්ඩයක්, තවත් එක් අතිරේක පාරිභෝගිකයකු වෙත සැපයීමේ ආන්තික පිරිවැය පිළිබඳව පහත සඳහන් කවරක් නිවැරදි වේ ද?
(1) ධන අගයක් ගනියි.
(2) ශුන්‍යයට සමාන ය.
(3) භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආරම්භක පිරිවැයට සමාන වේ.
(4) පාරිභෝගිකයන් සංඛ්‍යාව අඩුවෙත්ම අඩු වේ.
(5) පාරිභෝගිකයන් සංඛ්‍යාව අඩුවෙත්ම වැඩි වේ. (……)

38. ශ්‍රී ලංකාවේ බදු අයභාරයේ ප්‍රධාන මූලාශ්‍ර වනුයේ,
(1) ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද හා නිෂ්පාදන බදු වේ.
(2) එකතු කළ අගය මත බද්ද, පිරිවැටුම් බද්ද හා ආර්ථික සේවා ගාස්තු වේ.
(3) ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද හා මුද්දර බද්ද වේ.
(4) එකතු කළ අගය මත බද්ද, ආනයන බද්ද හා ජාතිය ගොඩගැනීමේ බද්ද වේ.
(5) එකතු කළ අගය මත බද්ද, වරාය හා ගුවන්තොටුපළ ගාස්තු හා ආර්ථික සේවා ගාස්තු වේ. (……)

39. ආර්ථික පසු බැසීමක් (ප්‍රතිගමනය) සමනය කිරීම සඳහා වඩාත් යෝග්‍ය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් වනුයේ පහත සඳහන් කවරක ඉහළ නැංවීමක් ද?
(1) පොලී අනුපාතික
(2) මුදල් සැපයුම
(3) බදු
(4) ආණ්ඩුවේ බැඳුම්කර අලෙවි කිරීම
(5) ආණ්ඩුවේ වියදම් (……)

40. වර්තමානයේ ශ්‍රී ලංකාවේ අපනයනවල ප්‍රධාන දිශානතිය හා ආනයනවල ප්‍රධාන මූලාශ්‍රය වනුයේ පිළිවෙළින්,
(1) ඇමරිකා එක්සත් ජනපදය හා එක්සත් රාජධානියයි.
(2) ඇමරිකා එක්සත් ජනපදය හා චීනයයි.
(3) යුරෝපීය සංගමය හා ඉන්දියාවයි.
(4) එක්සත් රාජධානිය හා චීනයයි.
(5) එක්සත් රාජධානිය හා ඉන්දියාවයි. (……)

41. කිසියම් රටක වෙළෙඳ අනුපාතය, එහි පාද වර්ෂ අගය වන 100 සිට පසු වර්ෂයේදී 130 දක්වා වැඩි වූයේ ය. අපනයන මිලයන්හි හා ආනයන මිලයන්හි කවර වෙනසක් මේ තත්ත්වය ඇති වීමෙහි ලා හේතු වී ඇත් ද?

	අපනයන මිල දර්ශකය	**ආනයන මිල දර්ශකය**
(1)	30% කින් අඩු විය.	10% කින් වැඩි විය.
(2)	20% කින් අඩු විය.	10% කින් අඩු විය.
(3)	30% කින් වැඩි විය.	වෙනස් නොවී ය.
(4)	10% කින් වැඩි විය.	20% කින් අඩු විය.
(5)	වෙනස් නොවී ය.	30% කින් වැඩි විය.

(……)

42. කිසියම් රටක වෙළෙඳ ශේෂ අතිරික්තය ඉහළ යාමට හේතුවක් වනුයේ,
(1) දේශීය උද්ධමනය ඉහළ යාමයි.
(2) ආනයන පහළ යාම හා අපනයන ඉහළ යාමයි.
(3) වෙළෙඳ හවුල්කාර රටවල් විසින් ඉහළ තීරු බදු පැනවීමයි.
(4) රට තුළට ගලා එන සෘජු විදේශ ආයෝජන ප්‍රවාහ ඉහළ යාමයි.
(5) ව්‍යවහාර මුදල් ඒකකයේ අගය ඉහළ යාමයි. (……)

43. 2016/17 වර්ෂයේදී මානව සංවර්ධන දර්ශකය සහ ගෝලීය තරගකාරිත්ව දර්ශකය තුළ, ශ්‍රී ලංකාව හිමිකර ගත් ස්ථාන නිවැරදිව දැක්වෙන්නේ පහත සඳහන් කවර සංයෝජනයක් මගින් ද?

	මානව සංවර්ධන දර්ශකය	**ගෝලීය තරගකාරිත්ව දර්ශකය**
(1)	73	71
(2)	73	60
(3)	72	58
(4)	70	68
(5)	68	85

(……)

44. පහත දැක්වෙන රූපසටහන පෙන්නුම් කරනුයේ, ජපන් යෙන් සඳහා ඇති විදේශ විනිමය වෙළෙඳපොළෙහි ශ්‍රී ලංකා රුපියල් සඳහා ඇති ඉල්ලුම හා ශ්‍රී ලංකා රුපියල් සැපයුමයි. K ලක්ෂ්‍යයේදී ආරම්භක වශයෙන් වෙළෙඳපොළ සමතුලිත වී ඇත. ශ්‍රී ලංකාව, මෝටර් රථ ආනයනය මත අය කරන තීරු බදු සැලකිය යුතු පරිදි පහළ හෙළීම නිසා, ආනයනය කරනු ලබන මෝටර් රථ සඳහා ඉල්ලුම වැඩිවීමෙන් විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඇති විය හැකි අළුත් සමතුලිත ලක්ෂ්‍යය කවරක් ද?



(1) A (2) B (3) C (4) D (5) E (……)

45. ආදායම් විෂමතාව මිනිය හැක්කේ,
(1) දළ දේශීය නිෂ්පාදිතය සහ දළ ජාතික ආදායම අතර වෙනස මගිනි.
(2) ජිනි සංගුණකය මගිනි.
(3) මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකය මගිනි.
(4) ජාතික දරිද්‍රතා ඉම මගිනි.
(5) ප්‍රතිශීර්ෂ ආදායම මගිනි. (……)

46. පහත සඳහන් දර්ශක අතුරෙන් වර්තමානයේ මානව සංවර්ධන දර්ශකය සැකසීම සඳහා යොදා ගැනෙන දර්ශක තුන තෝරන්න.
A - ක්‍රය ශක්ති සාම්‍යයට ගළපන ලද ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම් දර්ශකය
B - උපත් අනුපාතික දර්ශකය
C - ආයු අපේක්ෂා දර්ශකය
D - වැඩිහිටි සාක්ෂරතා දර්ශකය
E - අධ්‍යාපන දර්ශකය

(1) A, B සහ C (2) A, C සහ D (3) A, C සහ E
(4) A, D සහ E (5) C, D සහ E (……)

47. රටවල් අතර ජීවන තත්ත්වයේ වෙනස්කම් පෙන්නුම් කිරීමෙහි ලා ප්‍රතිශීර්ෂ මූර්ත දළ ජාතික ආදායම් මිනුම, නොමග යවනසුළු දර්ශකයක් වේය යන්න ඇඟවෙන්නේ පහත සඳහන් කවර තර්ක දෙකක් මගින් ද?
A - උද්ධමන අනුපාතිකයන්ගේ වෙනස්කම් සැලකිල්ලට නොගනී.
B - වෙළෙඳපොළ නොවන ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳව, රටවල් අතර විවිධ මට්ටම්න් වෙනස්කම් පවතී.
C - පාරිභෝගික අභිරුචීන්හි පවත්නා වෙනස්කම් සැලකිල්ලට නොගනී.
D - විනිමය අනුපාතිකය විකෘතිවීම් සැලකිල්ලට නොගනී. එබැවින් එම මිනුම ප්‍රකාශ කළ යුත්තේ 'ක්‍රය ශක්ති සාම්‍යයන්' පදනම් කර ගනිමිනි.
E - 'ආදායම් ප්‍රවේශය' ඔස්සේ ගණනය කරන දළ ජාතික ආදායම් මිනුම 'වියදම් ප්‍රවේශය' ඔස්සේ ගණනය කෙරෙන අගයට වඩා වෙනස් විය හැකි ය.

(1) A සහ B (2) B සහ C (3) B සහ D
(4) C සහ D (5) D සහ E (……)

48. තිරසාර සංවර්ධන අභිමතාර්ථ අතුරෙන් පළමුවන අභිමතාර්ථය දරිද්‍රතාවය පිළිබඳව ය. එම අභිමතාර්ථයෙන් අරමුණු කරනුයේ,
(1) 2030 වන විට දරිද්‍රතාවය අඩකින් කපා හැරීම ය.
(2) 2030 වන විට සෑම තැනම සෑම ස්වරූපයකම දරිද්‍රතාවය අවසන් කිරීම ය.
(3) 2030 වන විට දරිද්‍රතාවය 75% කින් අඩු කිරීම ය.
(4) කුසගින්න නිමා කොට සෑම පුද්ගලයකුටම ප්‍රමාණවත් ලෙස ආහාර ලබා ගැනීමට ඇති හැකියාව සහතික කරලීම ය.
(5) දරිද්‍රතාවය අඩුකර ගැනීමෙහි ලා ප්‍රගතියක් අත්කර ගැනීමට සෑම රටකටම ආධාර කිරීම ය. (……)

49. කිසියම් රටක ජනගහනය ප්‍රධාන වයස් කාණ්ඩ තුනක් අතර ව්‍යාප්ත වී ඇති ආකාරය පහත වගුවෙහි දැක්වේ.

වයස් කාණ්ඩය	**ජනගහනය (මිලියන)**
අවුරුදු 0 - 14	6
අවුරුදු 15 - 64	20
අවුරුදු 65 සහ ඊට වැඩි	4

මෙම රටෙහි මුළු යැපුම් අනුපාතිකය,

(1) 10% කි. (2) 20% කි. (3) 30% කි. (4) 33% කි. (5) 50% කි. (……)

50. වර්තමානයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙහි ආංශික සංයුතිය නිවැරදිව දැක්වෙන්නේ පහත සඳහන් වගුවේ කවර දත්ත පෙළකින් ද?

	කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය (%)	**කර්මාන්ත** (%)	**සේවා** (%)
(1)	5	20	64
(2)	7	27	57
(3)	10	25	50
(4)	12	28	48
(5)	15	30	45

(……)

❊ ❊ ❊

2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01.	4	26.	4
02.	5	27.	1
03.	3	28.	2
04.	1	29.	4
05.	4	30.	1
06.	5	31.	1
07.	4	32.	4
08.	5	33.	2
09.	3	34.	5
10.	5	35.	2
11.	3	36.	5
12.	2	37.	2
13.	3	38.	1
14.	3	39.	5
15.	4	40.	2
16.	3	41.	3
17.	2	42.	2
18.	1	43.	1
19.	5	44.	4
20.	1	45.	2
21.	3	46.	3
22.	3	47.	3
23.	1	48.	2
24.	2	49.	5
25.	1	50.	2

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **02** බැගින් ලකුණු **100**කි.

2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ



ඉහත ප්‍රස්තාරයට අනුව, I ප්‍රශ්න පත්‍රය සැලකීමේදී පහසුතාව අඩු ම ප්‍රශ්නය වන්නේ 44 ප්‍රශ්නය වේ. එහි පහසුතාව 21%කි. එනම්, අපේක්ෂකයන් අතුරෙන් අඩු ම ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 44 ප්‍රශ්නයට වේ. එසේම පහසුතාව වැඩි ම ප්‍රශ්න වන්නේ, 3 හා 4 ප්‍රශ්න වන අතර, පහසුතාව 83%කි. එනම්, අපේක්ෂකයන් අතුරෙන් වැඩි ම ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇති ප්‍රශ්න 3 හා 4 ප්‍රශ්න වේ.

සමස්ත ප්‍රශ්න පත්‍රය සැලකීමේදී I ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 55.67%ක් වේ.

2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය	එක් එක් වරණය තෝරා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය					
		1	2	3	4	5	ප්‍රතිචාර නොදැක්වූ
1	4	3.1	5.6	7.1	77.6	6.3	0.3
2	5	1.5	3.9	2.8	12.7	78.8	0.3
3	3	2.2	2.1	83.0	10.0	2.3	0.3
4	1	83.2	9.4	4.1	1.5	1.4	0.4
5	4	10.6	4.4	34.5	38.2	11.5	0.8
6	5	9.4	36.5	11.7	4.4	37.0	1.0
7	4	2.4	18.9	6.4	67.2	4.5	0.7
8	5	11.6	2.1	1.7	2.7	81.4	0.5
9	3	2.5	9.9	68.3	14.6	4.0	0.7
10	5	19.2	2.2	15.4	11.3	51.1	0.7
11	3	4.4	2.0	81.5	2.9	8.8	0.3
12	2	14.8	62.6	6.4	5.3	10.2	0.8
13	3	3.6	7.4	25.9	11.0	51.0	1.0
14	3	6.2	14.6	44.2	27.7	6.5	0.8
15	4	4.9	7.3	6.9	77.0	3.1	0.9
16	3	7.6	25.9	34.9	6.2	24.3	1.0
17	2	3.7	65.4	2.9	11.8	15.5	0.7
18	1	24.3	12.0	35.6	20.7	6.5	0.8
19	5	35.3	6.3	8.5	5.1	43.8	1.0
20	1	61.0	5.9	18.8	4.5	9.1	0.7
21	3	4.3	3.4	72.6	1.7	17.7	0.3
22	3	9.4	10.8	45.0	11.2	22.7	0.8
23	1	64.0	10.6	13.5	6.8	4.6	0.5
24	2	14.9	32.8	28.5	18.1	4.4	1.3
25	1	65.0	5.8	4.8	20.5	2.9	1.0
26	4	10.1	20.3	19.7	38.3	10.8	0.8
27	1	73.9	6.1	6.0	9.6	3.7	0.7
28	2	7.9	46.5	13.9	10.2	20.5	1.1
29	4	4.3	14.0	24.9	51.6	4.3	0.9
30	1	58.5	6.5	12.6	7.1	14.6	0.7
31	1	23.3	14.3	26.0	11.7	23.4	1.3
32	4	10.2	5.4	6.1	70.3	7.4	0.6
33	2	5.2	78.4	9.0	5.1	1.8	0.5
34	5	19.1	27.1	6.6	7.6	38.5	1.1
35	2	4.8	70.7	7.2	8.7	7.7	1.0
36	5	11.4	10.3	25.4	7.4	44.5	1.0
37	2	9.2	71.3	8.9	4.7	5.1	0.8
38	1	77.6	4.5	3.8	8.2	5.3	0.6
39	5	12.5	14.9	17.9	13.5	40.2	1.0
40	2	6.1	58.3	14.9	10.1	9.5	1.2
41	3	5.0	5.0	66.8	6.2	16.2	0.9
42	2	6.6	65.3	5.1	15.6	6.7	0.7
43	1	43.3	28.8	12.8	5.6	8.6	0.9
44	4	5.5	23.4	35.5	21.0	13.3	1.3
45	2	7.8	67.9	4.8	8.7	10.0	0.9
46	3	15.3	16.9	44.2	10.2	12.6	0.8
47	3	11.6	17.9	41.3	12.9	15.0	1.3
48	2	10.3	23.9	21.3	35.6	7.5	1.5
49	5	8.4	8.2	13.3	24.7	44.6	0.9
50	2	10.8	57.7	5.0	18.6	6.4	1.5

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය අඳුරු පසුබිමෙහි දක්වා ඇත.
* ප්‍රතිශතය නොදැක්වූ යනුවෙන් දක්වා ඇත්තේ, ප්‍රශ්නය සඳහා වරණ තෝරා නැති හෝ එක් වරණයකට වඩා වැඩියෙන් වරණ තෝරා ඇති හෝ ශිෂ්‍ය ප්‍රතිශතයයි.

2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

- සමස්තයක් ලෙස සලකා බලන විට, I ප්‍රශ්න පත්‍රයේ අංක 1, 2, 3, 4, 7, 8, 9, 11, 12, 15, 17, 20, 21, 23, 25, 27, 32, 33, 35, 37, 38, 41, 42 සහ 45 යන බහුවරණ ප්‍රශ්න සඳහා අපේක්ෂකයින්ගෙන් 60% හෝ 60% ඉක්මවූ හෝ ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු සපයා ඇත.

- අපේක්ෂකයන්ගෙන් 83%ක් වූ වැඩි ම ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 3 සහ 4 ප්‍රශ්නවලට ය.

- 44වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 21%ක් වැනි ඉතා ම අඩු ප්‍රතිශතයකි.

- ප්‍රශ්න අංක 5, 6, 13, 16, 18, 24, 26, 31, 34, 44, 48 යන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ සමස්ත අපේක්ෂකයින්ගෙන් 40%ට අඩු ප්‍රතිශතයකි.

- 44 ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 21%කි. එම ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ රුපියල් ඉල්ලුම හා රුපියල් සැපයුම මත තීරණය වන විනිමය අනුපාතිකය වෙනස් වන ආකාරය පිළිබඳව ය. තීරුබදු පහත හෙළීම නිසා මෝටර් රථ ආනයන ඉහළ යාම ඔස්සේ රුපියල් සැපයුම වැඩි වී රුපියලේ විදේශ අගය ක්ෂය වීමක් සිදු විය යුතුය. නමුත් තීරු බදු ඉවත් කිරීම මත මෝටර් රථ ආනයන ඉල්ලුම ඉහළ යාම, රුපියල් ඉල්ලුම ඉහළ යාමට හේතුව ලෙස ගෙන අපේක්ෂකයින්ගෙන් 35%ක් පමණ 3වන වරණය වෙත යොමු වී ඇත. මේ නිසා ආනයන මත රුපියල් සැපයුම වෙනස් වන බවත් අපනයන මත රුපියල් ඉල්ලුම වෙනස්වන බවත් සිසුන්ට අවබෝධ කර දිය යුතුය.

- 31 ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 23%ක් පමණි. දී ඇති පිළිතුරු අතුරෙන් නිශ්චිත වශයෙන් ම මුදල් සැපයුම වැඩි වීමට බලපාන්නේ ගෙවුම් ශේෂ ලේඛනයේ අතිරික්තයක් ඇති වීම පමණි. එවිට බැංකු පද්ධතියේ ශුද්ධ විදේශ වත්කම් ප්‍රමාණය වැඩි වී මුදල් සැපයුම ප්‍රසාරණය වේ. නමුත් අපේක්ෂකයින් 26%ක් 3වන වරණය වෙත යොමු වී ඇත්තේ බැංකු මුදල් ආපසු ඉවත් කර ගැනීමෙන් මහජනයා සතු ව්‍යවහාර මුදල් වැඩි වන බව වැරදි ලෙස වටහා ගැනීම මතය. එහිදී සිදුවන්නේ ද, බැංකු සංචිත අඩු වීම හා මුදල් ගුණකය අඩු වීම ඔස්සේ මුදල් සැපයුම පහත වැටීම ය.

- 48වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 24%කි. අදාළ ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ පළමු තිරසාර සංවර්ධන අභිමතාර්ථය පිළිබඳව ය. නමුත් අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයකට තිරසාර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ සුවිශේෂ දැනුමක් නොමැත. ගෝලීය ආර්ථිකයේ ප්‍රවණතා සහ ගෝලීය මට්ටමින් සිදුවන කාලීන සංවර්ධන වැඩසටහන් හා ඒවායේ ඉලක්ක පිළිබඳ සිසුන්ගේ දැනුම යාවත්කාලීන කළ යුතුය.

- 18වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 24%ක් පමණි. මෙහි දී විශේෂයෙන් ම පූර්ණ තරගකාරී වෙළෙඳපොළක ලක්ෂණ හා පූර්ණ තරගකාරී ආයතනයක ලක්ෂණ නිවැරදිව අවබෝධ කර නො ගැනීම වැරදි වරණ කරා යොමු වීමට හේතුව වී ඇත. විශේෂයෙන් ආයතනයේ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වන බව අවබෝධ කර නො ගැනීම නිසා අපේක්ෂකයින් බහුතරය 3වන වැරදි වරණය තෝරා ඇත. මේ නිසා සිසුන් හට පූර්ණ තරගකාරී ආයතනයක හා වෙළෙඳපොළක ලක්ෂණ වෙන් වශයෙන් නිවැරදි අවබෝධයක් ලබා දිය යුතුය.

- 13 ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 26%ක් පමණි. අදාළ ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ ඉල්ලුම හා සැපයුම වෙනස් වීම මත වෙළෙඳපොළ සමතුලිතය වෙනස් වන ආකාරය පිළිබඳව ය. අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක් 5වන වැරදි වරණය වෙත යොමු වී ඇත්තේ සමතුලිත මිල පහළ යාම හා සමතුලිත ප්‍රමාණය ස්ථාවරව පැවතීම සඳහා ඉල්ලුම පමණක් නොව සැපයුම ද වෙනස් වීම කෙරෙහි අවධානය යොමු කර නොමැති නිසා ය. පූර්ණ අනම්‍ය සැපයුම ස්ථාවරව තිබිය දී ඉල්ලුම පමණක් පහළ ගිය විට ද ගැටලුවෙහි දී ඇති පරිදි මිල අඩුවී ප්‍රමාණය ස්ථාවරව තිබිය හැකි නමුත් එය අපේක්ෂිත නිවැරදි පිළිතුර නො වේ. නිවැරදි වරණය තේරීමේදී ඉල්ලුම හා සැපයුම යන දෙක ම වෙනස් වීම කෙරෙහි අවධානය යොමු විය යුතුය.

නිවැරදි පිළිතුර රූප සටහනකින්	අපේක්ෂකයින් වැරදි ලෙස අවබෝධ කරගෙන ඇති තත්ත්වය රූප සටහනකින්
	

- 24 ප්‍රශ්නයට අපේක්ෂකයින් 33%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමෙහිලා එකතු කළ වටිනාකම හෝ අවසාන නිෂ්පාදිතයේ වටිනාකම හෝ කොපමණද යන්න පිළිබඳව ය. 67%ක් පමණ වැරදි වරණ වෙත යොමු වීම මගින් පෙනී යන්නේ දළ දේශිය නිෂ්පාදිතය ගණනය කිරීමට පහසුවෙන් යොමු විය හැකි අවසාන නිෂ්පාදිත ප්‍රවේශය කෙරෙහි අවධානය යොමු නො කිරීමය.

- 16 ප්‍රශ්නයට අපේක්ෂකයන්ගෙන් 35%ක් පමණක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. අදාළ ගැටලුව මගින් විමසා තිබුණේ කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියක හීනවන ආන්තික ඵලදාව පවතින විට ආන්තික පිරිවැය හැසිරෙන ආකාරය පිළිබඳව ය. නමුත් අපේක්ෂකයින් වැඩි පිරිසකට හීනවන ඵල ක්‍රියාත්මක වන විට ආන්තික පිරිවැය හැසිරෙන ආකාරය පිළිබඳ නිවැරදි අවබෝධයක් නැත. කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියක ආන්තික ඵලදාව පහළ බසින විට ආන්තික පිරිවැය ඉහළ නගින බව වටහා ගත යුතුය.

- 6 ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන් අතුරෙන් 37%ක් පමණි. මෙම ගැටලුව මගින් විමසා ඇත්තේ සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව ඉටුවීමේදී පැවතිය යුතු කොන්දේසිය පිළිබඳව ය. මෙම ගැටලුව පිළිබඳව පසුගිය වසර කීපයකදී ම විභාගවලදී විමසා ඇති නමුත් අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක් වැරදි පිළිතුරු වෙත යොමු වීම මගින් පෙනී යන්නේ පසුගිය විභාග ප්‍රශ්න හා පිළිතුරු කෙරේ අවධානය යොමු කොට නැති බවයි.

- 5 ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින් අතුරෙන් 38%ක් පමණි. අදාළ ගැටලුව මගින් විමසා ඇත්තේ ධනේශ්වර ආර්ථිකයකට අවශ්‍යවන හා විධාන ආර්ථිකයකට අවශ්‍ය නො වන ලක්ෂණයක් පිළිබඳව ය. පහසුවෙන් පිළිතුර වෙත ළඟා විය හැකි ප්‍රශ්නයක් වුවත් අදාළ අර්ථ ක්‍රමවල ලක්ෂණ නිවැරදිව දැක්වීමට නො හැකි වී ඇත.

- 26 ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර ලබා දී ඇත්තේ අපේක්ෂකයින් අතුරෙන් 38%ක් පමණි. මෙම ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ දී ඇති සිදුවීම් අතුරින් දළ දේශීය නිෂ්පාදිතයේ විශාලතම අඩුවීමකට හේතුවන සමාහාර ඉල්ලුම් සංරචකය පිළිබඳව ය. වැඩි ප්‍රතිශතයක් නිවැරදි පිළිතුර තෝරා ගැනීමට අපොහොසත් වීම මගින් පෙනී යන්නේ අපේක්ෂකයින් සමාහාර ඉල්ලුම් සංරචකයන්හි වෙනස්කම් මත දළ දේශීය නිෂ්පාදිතයට වන බලපෑම නිවැරදිව අවබෝධ කොට ගෙන නොමැති වීම හා ඒ ඒ සමාහාර ඉල්ලුම් සංරචක වෙනස්වීම් දළ දේශීය නිෂ්පාදිතයේ වෙනස්වීමට කවර සීඝ්‍රතාවකින් බලපානවාද යන්න අපේක්ෂකයින්ට විග්‍රහ කර ගැනීමට නො හැකි වීමය. එම දැනුම හා අවබෝධය පුළුල් වන පරිදි සමාහාර ඉල්ලුම් සංරචක විවිධ ආකාරයෙන් වෙනස් කරමින් දළ දේශීය නිෂ්පාදිතය වෙනස් වන ආකාරය අභ්‍යාස මගින් ප්‍රගුණ කළ යුතුය.

- 34 ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර ලබා දී ඇත්තේ 38% කි. මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණේ මහ බැංකුව සිය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී භාවිත කරනු ලබන ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණ කවරේද යන්නයි. 62%ක් පමණ වූ අපේක්ෂකයින් වැරදි වරණ වෙත යොමු වීම මගින් අනාවරණය වන්නේ මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ භාවිතයේ කාලීන ප්‍රවණතා පිළිබඳ දැනුවත්ව නොමැති බවයි. කාලීන ප්‍රවණතා අළලා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩි දියුණු කළ යුතුය.

2.2. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03කි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත ය.

'අ' කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 05කි.

'ආ' කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 05කි.

අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න 02 බැගින් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100කි.

අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රය සඳහා ලකුණු	=	100
II පත්‍රය සඳහා ලකුණු	=	100
අවසාන ලකුණ = 200 ÷ 2	=	100

2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

★ **II** පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක **2, 3, 4.1** සහ **4.2** ඇසුරින් ඉදිරිපත් කර ඇත.

"අ" කොටස

01 ප්‍රශ්නය

1. (i) නිෂ්පාදන සාධකයක් වශයෙන් ව්‍යවසායකත්වය, ශ්‍රමයෙන් වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 04යි)

(ii) "වැඩෙන ආවස්ථික පිරිවැය නීතිය" පැහැදිලි කරන්න. ආවස්ථික පිරිවැය ඉහළ යාමට හේතු වන කරුණු කවරේ ද? (ලකුණු 04යි)

(iii) ඕනෑම ආර්ථික පද්ධතියක් විසින් විසඳා ගත යුතු මූලික ආර්ථික ප්‍රශ්න **තුන** නම් කොට, එම ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සැකසී ඇති ප්‍රධාන ආර්ථික පද්ධති **තුන** සැකෙවින් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iv) සේවා වියුක්ති අනුපාතිකයේ ඉහළ යාමක් සහ වැඩ කරන වයසේ ජනගහනයේ ඉහළ යාමක් නිසා ආර්ථිකය මත ඇති කරන බලපෑම, නිෂ්පාදන හැකියා වක්‍ර භාවිත කරමින් වෙන් වෙන්ව පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) "කිසියම් භාණ්ඩයක් පරිභෝජනය කරන විට, ඒ සඳහා ඔබගෙන් මිලක් අයකරනු නොලැබුවේ නම්, එම භාණ්ඩය ආර්ථික නොවන භාණ්ඩයක් විය යුතු ය."
මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

01. (i) - භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය කිරීම පිණිස ශ්‍රමය, භූමිය සහ ප්‍රාග්ධනය යන නිෂ්පාදන සම්පත් සංවිධානය කොට මෙහෙයවීමේ ලා ඇතැම් පුද්ගලයන් සතු සුවිශේෂ හැකියාව ව්‍යවසායකත්වය වශයෙන් දැක්විය හැකිය. **(ලකුණු 01 යි)**

- ශ්‍රමය යනුවෙන් අදහස් කෙරෙනුයේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේදී යොදාගත හැකි මිනිසුන්ගේ කායික හා මානසික ප්‍රයත්නයයි. **(ලකුණු 01 යි)**

- ව්‍යවසායකත්වය සඳහා හිමිවන ප්‍රතිලාභය, ලාභාංශ හෝ ලාභ වශයෙන් හඳුන්වනු ලබන අතර, ශ්‍රමය සඳහා ලැබෙන ප්‍රතිලාභය, වැටුප් හෝ වේතන වශයෙන් නම් කෙරේ.

- ව්‍යවසායකයා, අළුත් නිෂ්පාදිත, ක්‍රම ශිල්ප, හෝ එසේත් නැත්නම් ව්‍යාපාර සංවිධාන කිරීමේ නව ආකෘති වැනි දෑ වාණිජ පදනමකින් හඳුන්වා දීමට වෙහෙසෙන නවෝත්පාදකයකි. එහෙත් ශ්‍රමිකයෙක් වූ කලී වාණිජ පදනමකින් නව්‍යතාවන් හඳුන්වා දීමට වෙහෙසෙන්නෙක් නොවේ.

- **ව්‍යවසායකයන් අවදානම් දරන්නන් වන අතර, ඔවුහු අවදානම තුළින්ම සමෘද්ධිමත් වෙති. අනික් අතට කම්කරුවෝ හැමවිටම අවදානමෙන් වැළැකීමට කටයුතු කරති.**

- **එදිනෙදා කටයුතු සඳහා අදාළ නොවන, එහෙත් ව්‍යාපාරික ආයතනයේ දිශානතිය හා ගමන්මග තීරණය කෙරෙන, මූලික ප්‍රතිපත්තිමය තීරණ ව්‍යවසායකයන් විසින් ගනු ලබන අතර එකී තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවසායකයා ශ්‍රමිකයන් කුලියට ගනී.**

(වෙනස්කම් දැක්වෙන ඕනෑම කරුණු දෙකක් සඳහා එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 02යි)

(ii) - "වැඩිවන ආවස්ථික පිරිවැය නීතියෙන්" අදහස් කෙරෙනුයේ නිෂ්පාදන හැකියා වක්‍රයක් මත, එක් භාණ්ඩයක නිෂ්පාදනය සමාන ඒකකවලින් ක්‍රමයෙන් වැඩි කරන විට, ඒ වෙනුවෙන් කැප කිරීමට සිදුවන අනික් භාණ්ඩයේ ප්‍රමාණය හෙවත් ආවස්ථික පිරිවැය, ක්‍රමයෙන් ඉහළ නගින බවය.

(ලකුණු 02 යි)

(**විකල්ප පිළිතුරක් :** වැඩිවන ආවස්ථික පිරිවැය නීතියෙන් අදහස් කෙරෙනුයේ සම්පත් පූර්ණ ලෙස උපයෝජනය කර ඇති විටක කිසියම් භාණ්ඩයක නිෂ්පාදනය වැඩි කිරීමේ දී එහි ආවස්ථික පිරිවැය හෙවත් එම භාණ්ඩය වෙනුවෙන් කැප කිරීමට සිදුවන අනිත් භාණ්ඩයේ නිෂ්පාදනය ක්‍රමයෙන් ඉහළ නගින බවය)

වැඩිවන ආවස්ථික පිරිවැය නීතියට බලපාන සාධක තුනකි.

- නිෂ්පාදන සම්පත් (සාධක) සමජාතීය නොවීම (එබැවින් එක් සාධකයක් වෙනුවෙන් වෙනත් සාධකයක් පූර්ණ වශයෙන් ආදේශකයක් ලෙස යොදාගත හැකි නොවේ).
- විවිධ භාණ්ඩ හා සේවා නිෂ්පාදය කිරීමේ දී යොදා ගනු ලබන නිෂ්පාදන ක්‍රම ශිල්ප වෙනස් වීම (වෙනස් තාක්ෂණය යොදා ගැනීම).
- කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා වඩාත් යෝග්‍ය සාධකයක්, වෙනස් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ ලා එතරම් යෝග්‍ය නොවීම.

(ඕනෑම හේතු දෙකක් සඳහා එක් හේතුවකට ලකුණු 01 බැගින් ලකුණු 02 යි)

(iii) - කුමක් කොපමණ ප්‍රමාණයකින් නිෂ්පාදනය කරන්නේ ද?
- කෙසේ නිෂ්පාදනය කරන්නේ ද?
- කා සඳහා නිෂ්පාදනය කරන්නේ ද? (ලකුණු 01 යි)

- වෙළෙඳපොළ ආර්ථික පද්ධතිය (ලකුණු 01 යි)
- විධාන ආර්ථික පද්ධතිය (ලකුණු 01 යි)
- සාම්ප්‍රදායික ආර්ථික පද්ධතිය (ලකුණු 01 යි)

('ධනේශ්වර ක්‍රමය' සහ 'සමාජවාදී ක්‍රමය' ලෙස ආර්ථික පද්ධති නම් කොට ඇත්නම් ලකුණු නොලැබේ)

(iv) - සේවා වියුක්ති අනුපාතිකයේ ඉහළ යාම.



- සේවා වියුක්තිය පවතින ආර්ථිකයක සේවා වියුක්ති අනුපාතිකය තවදුරටත් ඉහළ ගියහොත්, පවත්නා සම්පත් ඌන උපයෝජනය නිසා මූර්ත නිෂ්පාදිතය සංකෝචනය වේ. සැබෑ නිමැවුම දැක්වෙන ලක්ෂ්‍යය A සිට B දක්වා විතැන්වේ.

- වැඩකරන වයසේ ජනගහනය ඉහළ යාම.



- වැඩකරන වයසේ ජනගහනය ඉහළ යාමක් නිසා ආර්ථිකයේ සම්පත් සම්භාරයේ ප්‍රසාරණයක් හටගනී.

මේ නිසා නිෂ්පාදන ධාරිතාව හෙවත් විභව නිමැවුම ඉහළ නගී. ප්‍රස්තාර සටහනෙහි මෙය පෙන්නුම් කෙරෙනුයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය AB සිට CD දක්වා දකුණට විතැන් වීමක් මගිනි.

(අක්ෂ නම් කොට සිදුවන වෙනස නිවැරදිව පෙන්නුම් කෙරෙන රූප සටහනට ලකුණු 01 යි. පැහැදිලි කිරීමට ලකුණු 01යි)

(v) - ආර්ථික නොවන භාණ්ඩයක් හෙවත් නොමිල භාණ්ඩයක් ලෙස හඳුන්වනුයේ හිඟකමක් නොමැති භාණ්ඩයක්ය. එවැනි භාණ්ඩයක් අප සියලු දෙනාගේම වුවමනා සපුරාලීමට ප්‍රමාණවත් තරම් අතිශය සුලබව දක්නට ලැබේ. එම නිසා එවැනි භාණ්ඩයක් කිසිදු කැප කිරීමකින් තොරව ලබාගත හැකිය. ආවස්ථික පිරිවැයක් නොමැත.

(ආර්ථික නොවන භාණ්ඩ නිර්වචනයට ලකුණු 02 යි)

- කිසියම් භාණ්ඩයක් හිඟකමක් රහිත භාණ්ඩයක් හෙවත් ආර්ථික නොවන භාණ්ඩයක් ද යන්න නිර්ණය කෙරෙනුයේ, එම භාණ්ඩයට මිලක් අය කරනවා ද එසේ නැතහොත් මිලක් අය නොකොට නොමිලයේ ලබා දෙනවා ද යන්න මත නොවේ. බොහෝ අවස්ථාවල සමාජ ශුභසාධනය හෝ ව්‍යාපාරික ප්‍රචාරණය වැනි හේතු මත ඇතැම් භාණ්ඩ හා සේවා මිලක් අය නොකොට මහජනයාට ලබා දෙන ආකාරය දැකිය හැකි ය. ඒවා නොමිලයේ ලබා දුන්නද, ඒවා නිෂ්පාදනය කිරීම සඳහා විකල්ප භාවිත සහිත හිඟ සම්පත් භාවිත කෙරේ. ඒවායේ නිෂ්පාදනය නිසා ආවස්ථික පිරිවැයක් හටගනී. ඒ බැවින් එම භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ නොවේ. ඒවා ආර්ථික භාණ්ඩ වේ.

(ලකුණු 02 යි)

1 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



1 ප්‍රශ්නයට අපේක්ෂකයන්ගෙන් 98%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 14%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 22%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 35%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 29%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයට කොටස් 5ක් ඇත. පහසුතාව අඩු ම කොටස (iv) වී ඇති අතර, එහි පහසුතාව 49%කි. එමෙන්ම (iii) කොටස පහසු ම කොටස වී ඇති අතර එහි පහසුතාව 79%කි.

- පළමු ප්‍රශ්නයේ (i) කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 62%ක් නිවැරදි පිළිතුරු සපයා ඇත. ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ නිෂ්පාදන සාධක ලෙස ව්‍යවසායකත්වය හා ශ්‍රමය අතර වෙනසය. නිෂ්පාදන සාධක නිර්වචනය කිරීමට හැකියාව තිබුණද **එම සාධක අතර වෙනස්කම්** මතුකර නො දැක්වීම හේතුවෙන් උපරිම ලකුණු ලබා ගැනීම සඳහා අපේක්ෂකයින් අපොහොසත් වී ඇත.
- පළමු ප්‍රශ්නයේ (ii) කොටස සඳහා අපේක්ෂකයින් 57%ක් නිවැරදි පිළිතුරු ලබා දී තිබුණි. එම කොටස මගින් විමසා තිබුණේ වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය පැහැදිළි කිරීම සහ ආවස්ථික පිරිවැය ඉහළ යාමට හේතුවන කරුණු පිළිබඳව ය. වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය නිර්වචනය කිරීමේදී, **නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත නිෂ්පාදනයේ නිරත වන බව** අවධාරණය නො කිරීම මෙම කොටස සඳහා උපරිම ලකුණු නො ලැබීමට හේතු විය.
- (iii) කොටස සඳහා අපේක්ෂකයින් 79%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එම කොටස මගින් විමසා තිබුණේ මූලික ආර්ථික ප්‍රශ්න තුන සහ එම ප්‍රශ්න විසඳා ගැනීමට සංවිධානය වී ඇති ප්‍රධාන ආර්ථික පද්ධති තුන පිළිබඳව ය. අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු සැපයීම මගින් අනාවරණය වන්නේ අදාළ සංකල්ප පිළිබඳ ව ප්‍රමාණවත් දැනුමක් හා අවබෝධයක් පැවති බවය.
- (iv) කොටස සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 49%කි. මෙම කොටස මගින් විමසා තිබුණේ සේවා වියුක්ති අනුපාතිකයේ ඉහළ යාම සහ වැඩ කරන වයසේ ජනගහණය ඉහළ යාම නිෂ්පාදන හැකියා මායිම භාවිත කරමින් පැහැදිළි කිරීම පිළිබඳවයි. නමුත් අපේක්ෂකයින් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් වැරදි පිළිතුරු සැපයීම මගින් සනාථ වන්නේ අදාළ නිපුණතාවය ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය ඔස්සේ තව දුරටත් සංවර්ධනය කළ යුතු බවයි. වැඩ කරන වයසේ ජනගහණය ආර්ථිකයේ සම්පත් සම්භාරයේ සංරචකයකි. එය ඉහළ යාම නිෂ්පාදන ධාරිතාව ඉහළ නැගීමට හා මායිම් වක්‍රය දකුණු පසට විතැන් වීමට හේතු වන බව සිසුන් දැනුවත් කළ යුතුය. **නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය අඳින විට අක්ෂ නම් කිරීමේදී භාණ්ඩ වර්ග දෙකක් යොදා ගනිමින් නම් කිරීම අනිවාර්ය බව** අවධාරණය කළ යුතුය.
- (v) කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 54%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එම කොටස මගින් විමසා තිබුණේ මිලක් අය නො කෙරෙන භාණ්ඩ, ආර්ථික නො වන භාණ්ඩ ලෙස සැලකේ ද යන්න පිළිබඳව ය. අඩකට ආසන්න අපේක්ෂකයින් ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වූයේ මිලක් නො ගෙවන සියලු දෑ ආර්ථික නො වන භාණ්ඩ නො වේ යැයි තර්ක ඉදිරිපත් කර ගැනීමට අපොහොසත් වූ හෙයිනි. මෙහි දී ආර්ථික නො වන භාණ්ඩ ලෙස සැලකෙන්නේ හිඟ කමක් රහිත ආවස්ථික පිරිවැයක් නොමැති භාණ්ඩ බව අවධාරණය කළ යුතුයි.

02 ප්‍රශ්නය

2. (i) පෞද්ගලික ඉල්ලුම් වක්‍රය සහ වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය අතර වෙනස දක්වන්න. (ලකුණු 02යි)

(ii) "ගිෆන් භාණ්ඩයක් බාල භාණ්ඩයක් වන අතර, බාල භාණ්ඩයක් අවශ්‍යයෙන්ම ගිෆන් භාණ්ඩයක් නොවේ." පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) මිල ඉල්ලුම් නම්‍යතාව යන්නෙන් කවරක් අදහස් වේ ද? (ලකුණු 02යි)

(iv) කිසියම් රටක වට්ටක්කා වගාවේ නිරත ගොවීන්ට, වට්ටක්කා අලෙවියෙන් දිවි රැකගැනීම අතිශයින් දුෂ්කර කාර්යයක් බවට පත්ව ඇතැයි සලකන්න. වට්ටක්කා වෙළෙඳපොළේ පවත්නා ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් පහත සමීකරණයන්ගෙන් දැක්වේ.

ඉල්ලුම $(Q_D) = 350 - 10P$ සැපයුම $(Q_S) = -40 + 5P$

මෙහි P යන්නෙන් කිලෝග්‍රෑමයක මිල රුපියල්වලින් ද, Q යන්නෙන් ඒකක ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් ද අදහස් කෙරේ.

(අ) වෙළෙඳපොළේ සමතුලිත මිල හා ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02යි)

(ආ) ගොවීන්ට සහනයක් සැපයීමේ අරමුණින්, රජය ඌනපූරණ ගෙවීම් ක්‍රමයක් (deficiency payment scheme) හඳුන්වා දෙනු ලැබේ යැයි සලකන්න. ඒ යටතේ වට්ටක්කා කිලෝග්‍රෑමයකට රුපියල් 30ක්, ගොවීන් වෙත ලබා දීමට රජය සහතික කරන අතර, තම මුළු අස්වැන්නම වෙළෙඳපොළේ පවත්නා කවර මිලකට වුව ද අලෙවි කරගන්නා ලෙස ගොවීන් හට දැනුම් දෙනු ලැබේ.

දැන් කොපමණ වට්ටක්කා ප්‍රමාණයක් ගොවීන් විසින් වෙළෙඳපොළට සපයනු ලැබේ ද? (ලකුණු 02යි)

(ඉ) තමන්ගේ මුළු සැපයුම අලෙවිකර ගැනීමට ගොවීන් විසින් කවර මිලක් අය කළ යුතු වේ ද? (ලකුණු 02යි)

(ඊ) ඌනපූරණ ගෙවීම් වශයෙන් කොතරම් මුදලක් රජයෙන් ගොවීන් වෙත ලැබේ ද? (ලකුණු 02යි)

(උ) ඌනපූරණ ගෙවීම් ක්‍රමය හඳුන්වා දුන් පසු, පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 04යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

02. (i) - කිසියම් පරිභෝජකයෙකු යම් දෙන ලද අවස්ථාවක අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී, භාණ්ඩය සඳහා පැවතිය හැකි විකල්ප මිලයන්හිදී මිලදී ගැනීමට කැමැති හා මිලදී ගැනීමට හැකියාව ඇති ප්‍රමාණ පෙන්නුම් කෙරෙ සරල රූප සටහනක් පෞද්ගලික ඉල්ලුම් වක්‍රය ලෙස සඳහන් කළ හැකිය.

(ලකුණු 01 යි)

- යම් දෙන ලද අවස්ථාවක, අනිකුත් කරුණු නොවෙනස්ව තිබියදී කිසියම් භාණ්ඩයක විකල්ප මිලයන්හි දී වෙළෙඳපොළෙහි සියලුම පාරිභෝගිකයන් විසින් මිලදී ගැනීමට කැමැති හා මිලදී ගැනීමට හැකියාව ඇති මුළු ප්‍රමාණයක් පෙන්නුම් කෙරෙන රූප සටහනක් වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය ලෙස සඳහන් කළ හැකිය.

(ලකුණු 01 යි)

(විකල්ප පිළිතුර : පෞද්ගලික ඉල්ලුම් වක්‍ර සියල්ලේම තිරස් එකතුව වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය වන අතර, එය නිර්මාණය කරගනු ලබනුයේ එක් එක් පාරිභෝගිකයා විසින් එක් එක් මිලයන්හිදී ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණ සියල්ල එකට එකතු කිරීම මගිනි)

(ii) - මිලෙහි හටගන්නා වෙනසක් බාල භාණ්ඩයක් මත ඇති කරන බලපෑම වෙනස් ය. බාල භාණ්ඩයක ආදායම් ප්‍රතිවිපාකය ඍණ අගයක් ගනී. මේ නිසා බාල භාණ්ඩයක් පිළිබඳව සලකන විට, මිලෙහි ඇතිවන අඩුවීමක් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ වැඩිවීමකට හැමවිටම හේතු වන්නේ නැත.

- මිල අඩු වීමක ආදේශන ප්‍රතිවිපාකය හැම විටම ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි කරයි. ආදේශන ප්‍රතිවිපාකයේ එම බලපෑම, සෘණ ආදායම් ප්‍රතිවිපාකය විසින් කිසියම් දුරකට නිශේධනය කෙරේ. මෙම ප්‍රතිවිපාක දෙකෙහි සාපේක්ෂ බලවත්කම මත අවසාන ප්‍රතිඵලය තීරණය වේ.

- ඇතැම් බාල භාණ්ඩවලදී ආදේශන ප්‍රතිවිපාකයේ බලපෑම මුළුමනින්ම නිශේධනය කිරීමට සෘණ ආදායම් ප්‍රතිවිපාකය අසමත් වේ. එවිට මිල අඩුවීමක ප්‍රතිඵල වශයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය තවදුරටත් ඉහළ නගී. එහෙත් එම වැඩිවීම සාමාන්‍ය භාණ්ඩයකදී සිදුවන තරම් විශාල ප්‍රමාණයක් නොවේ. බාල භාණ්ඩයක සාමාන්‍ය රටාව මෙයයි. එබැවින් එය පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයේ හැඩය තහවුරු කරයි.

- සෘණ ආදායම් ප්‍රතිවිපාකය, ආදේශන ප්‍රතිවිපාකයේ බලපෑම අභිබවා යන විටකදී ඉල්ලුම් වක්‍රයේ හැඩය ධන බෑවුමකට අනුරූපීවේ. ගිෆන් භාණ්ඩ නමින් හඳුන්වනුයේ මෙම තත්ත්වයයි. මෙය සිදු වීමට නම් අදාළ භාණ්ඩය බාල භාණ්ඩයක් විය යුතු වේ. එහෙත් එය පමණක් ප්‍රමාණවත් නොවේ. මිල වෙනස් වීමේ සෘණ ආදායම් ප්‍රතිවිපාකය ආදේශන ප්‍රතිවිපාකය මුළුමනින් ම නිශේධනය කිරීමට සමත් ප්‍රමාණයටත් වඩා බලගතු එකක් විය යුතුය. එබැවින් සෑම බාල භාණ්ඩයක්ම ගිෆන් භාණ්ඩයක් නොවේ.

(එක් එක් පියවර සඳහා ලකුණු 01
බැගින් ලකුණු 04 යි)

(iii) - කිසියම් භාණ්ඩයක මිලෙහි හටගන්නා වෙනසක් කෙරෙහි, එම භාණ්ඩයෙහි ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය දක්වන සංවේදිතාව මිල ඉල්ලුම් නම්‍යතාවෙන් මැනේ.

- මෙය ගණනය කරනු ලබන්නේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයෙහි හටගත් ප්‍රතිශතාත්මක වෙනස, එම වෙනස ඇති කිරීමට බලපෑ මිලෙහි ප්‍රතිශතාත්මක වෙනසෙන් බෙදීමෙනි. එය පහත දැක්වෙන ආකාරයට ප්‍රකාශ කළ හැකි ය.

$$\text{මිල ඉල්ලුම් නම්‍යතාව} = \frac{\text{ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ ප්‍රතිශතාත්මක වෙනස}}{\text{මිලෙහි ප්‍රතිශතාත්මක වෙනස}}$$

(නිර්වචනයට ලකුණු 01 යි: ගණනය කෙරෙන
සූත්‍රයට ලකුණු 01 යි මුළු ලකුණු 02 යි)

(iv) (අ) - **සමතුලිත මිල හා ප්‍රමාණය**

$$Q_D = Q_S$$
$$350 - 10P = -40 + 5P$$
$$390 = 15P$$
P = කිලෝග්‍රෑමයක් රුපි. 26 (ලකුණු 01 යි)

$$Q_D = 350 - 10(26)$$
$$Q_D = 350 - 260$$
Q_D = මෙට්‍රික් ටොන් 90 (ලකුණු 01 යි)

(ආ) - කිලෝග්‍රෑමයකට රුපි 30ක් වන සහතික මිල මත සපයනු ලබන මුළු ප්‍රමාණය :

$$Q_s = -40 + 5P$$
$$Q_s = -40 + 5(30)$$
$$Q_s = -40 + 150$$ = මෙට්‍රික් ටොන් 110 (ලකුණු 02 යි)

(ඉ) - මුළු සැපයුමම අලෙවිකර ගැනීම සඳහා අයකළ යුතු වෙළෙඳපොළ මිල තීරණය වන්නේ එම ප්‍රමාණය මිලදී ගැනීමට පාරිභෝගිකයන් ගෙවීමට කැමැති මිල මතය.

$$Q_D = 350 - 10P$$
$$Q_D = 110$$

එමනිසා:

$$110 = 350 - 10P$$
$$10P = 350 - 110$$
P = කිලෝග්‍රෑමය රුපි. 24

(ලකුණු 02 යි)

(ඊ) උදාහරණය සඳහා රජයෙන් ගොවීන්ට ලැබෙන මුදල:
කිලෝ ග්‍රෑමයක් සඳහා ඌන පූරණය කළ යුතු ප්‍රමාණය

= සහතික මිල (= රුපි. 30) - වෙළෙඳපොළ මිල (රුපි. 24)

= 30 - 24 = කිලෝග්‍රෑමයකට රුපි. 6කි.

ඌනපූරණය කළ යුතු මුළු මුදල } = රුපි. 6 x (110 x 1000)
= රුපි. 660,000

(ලකුණු 02 යි)

(විකල්ප පිළිතුර : 660)

(උ) (2) - පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තය

පාරිභෝගික අතිරික්තය } = $\frac{(\text{උපරිම ඉල්ලුම් මිල - වෙළෙඳපොළ මිල}) \times \text{මිලදීගත් ප්‍රමාණය}}{2}$

$$= \frac{(35 - 24) \times 110,000}{2} = \frac{1210,000}{2}$$

= රුපි. 605,000 (ලකුණු 02 යි)

(විකල්ප පිළිතුර : 605)

නිෂ්පාදක අතිරික්තය = (ගොවීන්ට ලැබුණු මිල - අවම සැපයුම් මිල) x අලෙවි මිල ප්‍රමාණය

$$= \frac{(30 - 8) \times (110,000)}{2} = \frac{1210,000}{2}$$

= රුපි. 1,210,000 (ලකුණු 02 යි)

(විකල්ප පිළිතුර : 1210)

2වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



2 ප්‍රශ්නයට අපේක්ෂකයන්ගෙන් 84%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 37%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 30%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 20%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 13%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නය කොටස් 4කින් සමන්විත වන අතර ඉන් පහසුතාව වැඩි ම කොටස iv කොටසේ "අ" අනු කොටසය. එහි පහසුතාව 93%කි. (ii) කොටසේ පහසුතාව 26%කි. එය පහසුතාව අඩු ම කොටසයි.

- 2 ප්‍රශ්නයේ (i) කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 34%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. මෙම කොටස මගින් විමසා තිබුණේ පෞද්ගලික ඉල්ලුම් වක්‍රය සහ වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය අතර වෙනසය. අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක් උපරිම ලකුණු ලබා ගැනීමට අපොහොසත් වූයේ **පෞද්ගලික ඉල්ලුම් වක්‍රය හා වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය නිර්වචනය කිරීමේදී තිබිය යුතු සියලු කරුණු** අන්තර්ගත කිරීමට නොහැකි වීම නිසාය. සංකල්ප නිර්වචනය කිරීමේදී සියලු කරුණු ඇතුලත් කිරීමට සුපරීක්ෂාකාරී විය යුතුය.

- (ii) වන කොටස සඳහා නිවැරදි පිළිතුරු ලබා දී තිබුණේ 26%ක් වැනි අඩුම අපේක්ෂකයින් සංඛ්‍යාවකි. අදාළ කොටස මගින් විමසා තිබුණේ ගිෆන් භාණ්ඩයක් බාල භාණ්ඩයක් වන අතර බාල භාණ්ඩයක් ගිෆන් භාණ්ඩයක් නො වන බව පැහැදිළි කිරීමය. අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු ඉදිරිපත් කිරීමට නො හැකි වීමෙන් අනාවරණය වන්නේ මෙම **සිද්ධාන්තය පිළිබඳ දැනුම ප්‍රමාණවත් නො වන බවයි.** මිල පහළ යාමක් මත ආදේශන ප්‍රතිවිපාකය ඔස්සේ බාල භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය ඉහළ යන බැවින් ආදේශන ප්‍රතිවිපාකය ඍණ සබඳතාවයක් ගන්නා අතර මිල පහළ යාම හේතුවෙන් ආදායම් ප්‍රතිවිපාකය ඔස්සේ ඉල්ලුම් ප්‍රමාණය පහළ යාමක් සිදු වන බැවින් ආදායම් ප්‍රතිවිපාකය ඍණ සබඳතාවක් පෙන්නුම් කරයි. නමුත් ආදේශන ප්‍රතිවිපාකය නිසා ඉල්ලුම් ප්‍රමාණය ප්‍රසාරණය වූ තරමට වඩා ආදායම් ප්‍රතිවිපාකය නිසා ඉල්ලුම් ප්‍රමාණය සංකෝචනය වූ තරම කුඩා අගයක් ගන්නා බැවින් බාල භාණ්ඩයක මිල ප්‍රතිවිපාකය ඍණ සබඳතාවයක් ගනී.

නමුත් ගිෆන් භාණ්ඩයක මිල පහළ යාමකදී ආදේශන ප්‍රතිවිපාකය මත ඉල්ලුම් ප්‍රමාණය ඉහළ ගිය තරමට වඩා ආදායම් ප්‍රතිවිපාකය නිසා ඉල්ලුම් ප්‍රමාණය පහළ ගිය තරම ප්‍රබල වන බැවින් ගිෆන් භාණ්ඩයක මිල ප්‍රතිවිපාකය ධන සබඳතාවයක් ගනී. මේ නිසා ගිෆන් භාණ්ඩ බාල භාණ්ඩ වුවත් සෑම බාල භාණ්ඩයක්ම ගිෆන් භාණ්ඩයක් නො වන බව අවධාරණය කළ යුතුයි.

★ (iii) වන කොටස සඳහා නිවැරදි පිළිතුරු ලබා දී තිබුණේ අපේක්‍ෂකයින් අතුරෙන් 52% ක් පමණි. මෙම කොටස මගින් විමසා තිබුණේ මිල ඉල්ලුම් නම්‍යතාව යන්නෙන් කවරක් අදහස්වේද යන්නයි. නමුත් අපේක්‍ෂකයින් අතුරෙන් 50%කට ආසන්න ප්‍රතිශතයක් මිල ඉල්ලුම් නම්‍යතාව නිවැරදි ව නිර්වචනය කොට තිබූ නමුත් එය ගණනය කරන ආකාරය දක්වා නොමැති බැවින් උපරිම ලකුණු ලබා ගැනීමට අපොහොසත් විය.

★ (iv) වන කොටස අනු කොටස් පහකින් යුක්ත වේ. එහි (අ) අනු කොටස සඳහා අපේක්‍ෂකයින්ගෙන් 93% ක ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු ලබා දී තිබුණු බැවින් එම කොටස මගින් අසා තිබූ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ විසඳා සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ලබා ගැනීමේ නිපුණතාව අපේක්ෂකයින් වැඩි දෙනෙකු හට පැවති බව පැහැදිලි වේ.

● (iv) වන කොටසේ "ආ" අනු කොටස සඳහා අපේක්‍ෂකයින් අතුරින් 66%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. ගැටලුව මගින් විමසා තිබුණේ සහතික මිලක් නියම කොට ඌන පූර්ණ ගෙවීමක් සිදු කළ විට වෙළෙඳපොළට සපයන ඒකක ප්‍රමාණය කොපමණද යන්නය. දෙවන ප්‍රශ්නයේ (iv) වන කොටසේ "අ" උප කොටස සඳහා 93%ක් වැනි අපේක්ෂකයින් ප්‍රමාණයක් සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණද "ආ" කොටස මගින් විමසා තිබූ සහතික මිල යටතේ වෙළෙඳපොළට සපයන ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමට අපේක්‍ෂකයින් අතුරින් 1/3කට ආසන්න පිරිසකට නොහැකි වූයේ මෙවැනි ගැටලු විසඳීමට අභ්‍යාස මගින් ප්‍රගුණකොට නොමැති නිසාය.

● (iv) වන කොටසේ "ඉ" අනු කොටස සඳහා අපේක්‍ෂකයින් අතරෙන් 41%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. ගැටලුව මගින් විමසා තිබුණේ ඌන පූර්ණ ගෙවීමෙන් පසු වෙළෙඳපොළ සැපයුම් ප්‍රමාණය අලෙවි කිරීමට අය කළ යුතු මිල කවරේද යන්නය. අපේක්‍ෂකයින් වැඩි ප්‍රතිශතයකට සහතික මිල යටතේ වූ මුළු සැපයුම් ප්‍රමාණය, වෙළෙඳපොළේ අලෙවි වන මිල ගණනය කර ගැනීමට නො හැකි වී ඇත.

● (iv) වන කොටසේ "ඊ" අනු කොටසට අපේක්‍ෂකයින් 29%ක් පමණ නිවැරදි පිළිතුරු සපයා තිබුණි. අදාළ ගැටලුව මගින් විමසා තිබුණේ ඌන පූර්ණ ගෙවීම් සඳහා රජය ගොවීන් වෙත ලබා දෙන මුදල් ප්‍රමාණය කොපමණද යන්නය. සහතික මිල යටතේ වෙළෙඳපොළට සපයන ඒකක ප්‍රමාණය, ගැනුම්කරුවන් විසින් මිලදී ගන්නා මිලත් රජය විසින් සහතික වූ මිලත් අතර ඌන පූරණය වෙළෙඳපොළේ මුළු සැපයුම් ප්‍රමාණයෙන් ගුණ කොට ඌන පූරණ ගෙවීම සඳහා රජය දරන වියදම ඇස්තමේන්තු කිරීමට අපේක්‍ෂකයින් හට නො හැකි වීමෙන් බහුතර අපේක්ෂකයින්ගේ පිළිතුරු අසාර්ථක වී තිබිණි.

● (iv) වන කොටසේ "උ" අනු කොටස සඳහා අපේක්‍ෂකයින් 27% ක් පමණ නිවැරදි පිළිතුරු සපයා තිබීම මගින් අනාවරණය වන්නේ එම අනු කොටස මගින් විමසා තිබූ පරිදි ඌන පූර්ණ ගෙවීමෙන් පසු පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්තවල ප්‍රමාණ නිවැරදිව ගණනය කිරීමට අපේක්‍ෂකයින් වැඩි දෙනෙකුට නො හැකි වූ බවයි. ඌන පූරණ ගෙවීම් කිරීමෙන් පසු නිෂ්පාදකයාට ලැබෙන මිල ඉහළ යාමෙන් නිෂ්පාදක අතිරික්තය පුළුල් වන බවත්, ගැනුම්කරුවන් ගෙවන මිල පහළ යාමෙන් පාරිභෝගික අතිරික්තය පුළුල් වන බවත් සිසුන් හට අවබෝධ වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය.

වෙළෙඳපොළේ අලෙවි වන භාණ්ඩයක් මත සහතික මිලක් පනවා ඌන පූර්ණ ගෙවීමක් කළ පසු එම මිල යටතේ වෙළෙඳපොළට සපයන ප්‍රමාණය, එම සැපයුම් ප්‍රමාණය වෙළෙඳපොළේ අලෙවි වන මිල, රජය විසින් ඌන පූර්ණ ගෙවීම සඳහා දරන වියදම, ඌන පූර්ණ ගෙවීමෙන් පසු පාරිභෝගික හා නිෂ්පාදක අතිරික්ත, දී ඇති ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ආධාරයෙන් ගණනය කර ගන්නා ආකාරය පිළිබඳ නිපුණතාව සංවර්ධනය වන පරිදි අභ්‍යාස කළ යුතුය.

03 ප්‍රශ්නය

3. (i) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය දැයි දක්වා, ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(අ) හීනවන ඵල හටගන්නා විට, මුළු නිෂ්පාදිතය පහළ වැටීමට පටන් ගනී.

(ආ) දේපොළ බදු, ගොඩනැගිලි සඳහා රක්ෂණ ගාස්තු ගෙවීම් සහ ක්‍රමක්ෂය ගාස්තු (amortization payments) ස්ථාවර පිරිවැය වේ.

(ඉ) හීනවන ඵල සහ අඩුවන පරිමාණානුකූල ඵල යනු එකම දෙයක් වෙනස් ආකාරවලින් ප්‍රකාශ කිරීමකි.

(ඊ) ආන්තික පිරිවැය, සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩි නම්, ආන්තික පිරිවැය පහළ බසිමින් තිබිය යුතු ය. (ලකුණු 08යි)

(ii) කර්මාන්තයක් තුළට 'ප්‍රවේශවීමේ බාධක' යනුවෙන් අදහස් වන්නේ කවරක් දැයි උදාහරණ **දෙකක්** භාවිත කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) පූර්ණ තරගකාරී ආයතනයක සැපයුම් වක්‍රය සහ එහි ආන්තික පිරිවැය වක්‍රය අතර පවතින සම්බන්ධතාවය කුමක් ද? (ලකුණු 04යි)

(iv) ආර්ථික බදු කුලිය සහ සංක්‍රාම ඉපැයීම අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

03. (i) (අ) - අසත්‍යවේ.

- හීනවන ඵල හට ගන්නා විට, මුළු නිෂ්පාදිතය (TP) අඩුවන වේගයකින් ඉහළ නගිමින් පවතී. එහිදී මුළු නිෂ්පාදිත වක්‍රයේ බෑවුම ධන අගයක් පෙන්නුම් කරන අතර බෑවුමේ අගය ක්‍රමයෙන් පහළ බසී.

(ආ) - සත්‍ය වේ.

- මෙම පිරිවැය අයිතමයන් කෙටි කාලයේදී නිමැවුම් මට්ටම සමග වෙනස් නොවේ. ඒවා කර්මාන්ත ශාලාව ක්‍රියාත්මක වූවත් නැතත් නොවැළැක්විය හැකි පිරිවැය වේ.

(ඉ) - අසත්‍ය වේ.

- මේවා වෙනස් සංසිද්ධීන් දෙකක් නිරූපණය කරයි. හීනවන ඵල හටගන්නේ කෙටි කාලයේදී ස්ථාවර යෙදවුම් සමග විචල්‍ය යෙදවුමක් වැඩි වැඩියෙන් භාවිතා කරන විට දීය. සාධක අනුපාතය වෙනස්වේ.

පරිමාණානුකූල ඵල හට ගනුයේ දිගු කාලයේ දී සියලුම යෙදවුම් වෙනස් කරන විට දී ය. එහිදී සාධක අනුපාතය නොවෙනස්ව පවතින අතර පරිමාව වෙනස්වේ.

(ඊ) - අසත්‍ය වේ.

- ආන්තික පිරිවැය සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා ඉහළින් පවතින විට, ආන්තික පිරිවැය ඉහළ නගිමින් තිබිය යුතුය. ආන්තික පිරිවැය වක්‍රය සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා ඉහළින් පවතින විට, සාමාන්‍ය විචල්‍ය පිරිවැය එහි අවම අගය ඉක්මවා ඉහළ නගිමින් පවතී.

(එක් කරුණකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 04යි. සත්‍ය හෝ අසත්‍ය බව පමණක් සඳහන්ව ඇති පිළිතුරුවලට ලකුණු නොලැබේ)

(ii) - කිසියම් කර්මාන්තයකට හෝ වෘත්තියකට හෝ ප්‍රවේශ වීමේ ලා පවත්නා බාධක මින් අදහස් කෙරේ. මේ මගින් කර්මාන්තයේ හෝ වෘත්තියේ හෝ තරගකාරිත්වය සීමා කෙරේ.

- මෙවැනි බාධක විවිධ ස්වරූප ගනී. ඒවා කෘත්‍රිම හෝ ස්වාභාවික හෝ විය හැකිය. නෛතික, තාක්ෂණික, ස්ථානීය හා ආර්ථික සාධක මත හටගත් ඒවා වේ.

(ලකුණු 02 යි)

- උදාහරණ
  - උපාය මාර්ගික වැදගත්කමක් ඇති අමුද්‍රව්‍ය පිළිබඳ හිමිකාරිත්වය හෝ ඒවා පාලනය කිරීමේ අයිතිය
  - බුද්ධිමය දේපොළ අයිතිය
  - ස්වාධිකාර
  - බලපත්‍ර
  - බඳු ගිවිසුම්
  - පරිමාණුකූල පිරිමැසුම්
  - ස්වාභාවික ඒකාධිකාර (මහජන අපයෝජ්‍යතා කර්මාන්ත)

(එක් උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 02 යි)

(iii) - නිෂ්පාදන ආයතනයක සැපයුම් වක්‍රය පෙන්නුම් කරනුයේ වෙළෙඳපොළේ පවත්නා විකල්ප මිලයන්හිදී සැපයීමට අපේක්ෂාකරන හා සපයනු ලබන භාණ්ඩ ප්‍රමාණයන්ය. පූර්ණ තරගකාරී වෙළෙඳපොළක ලාභ උපරිමනය කරන ආයතනයක් සපයනු ලබන්නේ ආන්තික පිරිවැය හා මිල සමාන කෙරෙන නිමැවුම් ප්‍රමාණයයි. මේ අනුව එක් එක් මිලේ දී සපයනු ලබන ප්‍රමාණ තීරණය වන්නේ ආන්තික පිරිවැය වක්‍රයේ අදාළ ලක්ෂ්‍යයන් සමග මිල ගණන් ගැළපීමෙනි. එලෙස පූර්ණ තරගකාරී ආයතනයේ ආන්තික පිරිවැය වක්‍රය ආයතනයේ සැපයුම් වක්‍රයද වේ.

(ලකුණු 02 යි)

- ආයතනයේ සැපයුම් වක්‍රය සමන්විත වනුයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට ඉහළින් පවත්නා ආන්තික පිරිවැය වක්‍රයේ අදාළ කොටසින් සහ අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා පහළ මිල ගණන්වලට අදාළ සිරස් අක්ෂයේ (මිල අක්ෂයේ) කොටසින් ද වේ.

(ලකුණු 02 යි)

(විකල්ප පිළිතුර: පූර්ණ තරගකාරී ආයතනයක සැපයුම් වක්‍රය වන්නේ සාමාන්‍ය විචල්‍ය පිරිවැයෙහි අවම ලක්ෂ්‍යයට ඉහළින් පිහිටි ආන්තික පිරිවැය වක්‍රයයි)

(iv) - කිසියම් නිෂ්පාදන සාධකයක් පවත්නා භාවිතයෙන් ඉවත්ව වෙනත් භාවිතයක් වෙත සංක්‍රාම වීම වළක්වාලීම් වස්, එම සාධකය වර්තමාන භාවිතය තුළ ලැබිය යුතුයයි අපේක්ෂා කරන අවම ඉපැයීම් ප්‍රමාණය සංක්‍රාම ඉපයීම වේ.

- අවශ්‍යයෙන්ම සංක්‍රාම ඉපයීම වූ කලී, කිසියම් සාධකයක් පවත්නා භාවිතයේ රඳවා තැබීමේ ආවස්ථික පිරිවැය වේ. (ලකුණු 02 යි)

- ආර්ථික බදු කුලිය යනු සංක්‍රාම ඉපැයීම ඉක්මවා කිසියම් සාධකයක් හිමිකර ගන්නා අතිරික්තයයි. (ලකුණු 01 යි)

(මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී ප්‍රස්තාර සටහන් අපේක්ෂා නොකෙරේ)

3වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



3 ප්‍රශ්නයට අපේක්ෂකයන්ගෙන් 56%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 40%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 23%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 21%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 16%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 4ක් ඇත. පහසුතාව අඩු ම කොටස (iii) වන කොටස වී ඇති අතර, එහි පහසුතාව 33%කි. පහසුතාව වැඩි ම කොටස (i) වන කොටසේ "ආ" අනු කොටස වී ඇති අතර, එහි පහසුතාව 63%කි.

⋆ ● 3වන ප්‍රශ්නයේ (i) කොටසේ “අ” අනු කොටස සඳහා අපේක්ෂකයින් 33%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එම අනු කොටස මගින් විමසා තිබුණේ හීනවන ඵල හට ගන්නා විට මුළු නිෂ්පාදිතය හැසිරෙන ආකාරය පිළිබඳව ය. අපේක්ෂකයින් වැඩි දෙනෙකු එම සබඳතාව නිවැරදිව අවබෝධ කොට ගෙන නොතිබුණි. එම නිසා හීනවන ඵල පවතින විට මුළු නිෂ්පාදිතය අඩුවන වේගයකින් ඉහළ ගොස් උපරිම අගය කරා ළඟා වී පසුව පහළ යන බව සිසුන් හට අවබෝධ කර දිය යුතුය.

● (i) කොටසේ “ආ” අනු කොටස සඳහා අපේක්ෂකයින්ගෙන් 63%ක් නිවැරදි පිළිතුරු ලබා දී තිබුණි. අදාළ ගැටලුව මගින් විමසා තිබුණේ ස්ථාවර පිරිවැයෙහි සංරචක කවරේද යන්න ය. නිමැවුම වෙනස් කිරීම සමඟ පිරිවැය වෙනස්වීමට බඳුන් නො වන්නේ නම් ඒවා ස්ථාවර පිරිවැය ලෙස හඳුනා ගැනීමට හැකිවන සේ සිසුන් දැනුවත් කළ යුතුය.

● (i) කොටසේ “ඉ” අනු කොටස සඳහා අපේක්ෂකයින් 57%ක් පමණ නිවැරදි පිළිතුරු සපයා තිබුණි. අදාළ අනු කොටස මගින් විමසා තිබුණේ හීනවන ඵල සහ අඩුවන පරිමාණානුකූල ඵල එකම දෙයක්ද යන්න පිළිබඳව ය. අදාළ සංකල්ප පිළිබඳ පූර්ණ අවබෝධයක් නොමැති බැවින් එකී සංකල්ප සමාන අරුතින් යුතු බව අපේක්ෂකයින් පිරිසක් වැරදි ලෙස අවබෝධ කොට ගෙන තිබුණි. එබැවින් එකී සංකල්ප වෙන් වෙන් වශයෙන් අවබෝධ වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කළ යුතුයි.

● (i) කොටසේ “ඊ” අනු කොටස සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ 51%ක් පමණි. අදාළ අනු කොටස මගින් විමසා තිබුණේ ආන්තික පිරිවැය, සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වැඩි වන විට, ආන්තික පිරිවැය වෙනස් වන්නේ කෙසේද යන්න පිළිබඳව ය. එබැවින් කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියක පිරිවැය වක්‍රවල හැසිරීම පිළිබඳ පුළුල් දැනුම හා අවබෝධය සිසුන් වෙත ලබා දිය යුතුයි. එය පහසු වන පරිදි පිරිවැය වක්‍ර ප්‍රස්තාර භාවිත කරමින් මෙවැනි ගැටලුවලට පිළිතුරු සැපයීමට සිසුන්ගේ කුසලතා සංවර්ධනය කළ යුතුය.

⋆ (ii) කොටස සඳහා අපේක්ෂකයින් 41%ක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. මින් අනාවරණය වන්නේ කර්මාන්තය තුළට ප්‍රවේශයට පවතින බාධක හා එම බාධකවලට නිදසුන් ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක් කුසලතාවයක් ලබා නොමැති බවය. කර්මාන්තයට පිවිසීමේ බාධක හා ඊට නිදසුන් සැපයීමට සිසුන් තුළ නිපුණතා වර්ධනය කළ යුතුය.

⋆ (iii) කොටස සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින්ගෙන් 33%ක් පමණි. මෙම කොටස මගින් විමසා තිබුණේ පූර්ණ තරග ආයතනයක සැපයුම් වක්‍රය සහ එහි ආන්තික පිරිවැය වක්‍රය අතර සම්බන්ධතාව පිළිබඳව ය. අපේක්ෂකයින්ගෙන් බහුතරයක් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වූයේ පූර්ණ තරග ආයතනයක සැපයුම් වක්‍රය නිර්වචනය කිරීමේදී ආන්තික පිරිවැය සහ මිල සමානවන නිමැවුම් ප්‍රමාණ, සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යයට ඉහළින් පිහිටි ආන්තික පිරිවැය වක්‍ර ඛණ්ඩ මත නිරූපණය වන බව සඳහන් නො කිරීම හා අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා පහළ මිල ගණන්වලට අදාළ සැපයුම් වක්‍රය සිරස් අක්ෂය මත පිහිටන බව දක්වා නො තිබීම නිසාය. එබැවින් පූර්ණ තරග ආයතනයක කෙටි කාලීන සැපයුම් වක්‍රය හා ආන්තික පිරිවැය වක්‍රය අතර සබඳතාව වඩාත් තාර්කික ලෙස සිසුන්හට පැහැදිලි කළ යුතුය.

උදාහරණ ලෙස



පූර්ණ තරග ආයතනයේ සැපයුම් වක්‍රය OP_1 හා AB වන අතර P_1.....A අතර කොටස පූර්ණ තරග ආයතනයේ සැපයුම් වක්‍රයට අයත් නො වේ. නමුත් කර්මාන්තයේ සැපයුම් වක්‍රය OP_1AB වන බවත් අවධාරණය කළ යුතුයි.

★ iv වන කොටස සඳහා අපේක්ෂකයින් අතුරින් 36% ක් පමණ නිවැරදි පිළිතුරු සපයා ඇත. අදාළ කොටස මගින් විමසා ඇත්තේ සංක්‍රාම ඉපයුම් සහ ආර්ථික බදු කුලිය අතර වෙනස පිළිබඳවය අපේක්ෂකයින් අතුරින් 67% ක් අසාර්ථක වීම මගින් පැහැදිලි වන්නේ අදාළ සංකල්ප අතර වෙනස විස්තර කිරීමට අපොහොසත් වූ බවයි. එම නිසා සංක්‍රාම ඉපැයුම් හා ආර්ථික බදු කුලිය නිවැරදිව අර්ථ දැක්වීමට සහ එම සංකල්ප අතර වෙනස ප්‍රස්තාර සටහන් මගින් පැහැදිලි කිරීමට හැකි වන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩි දියුණු කළ යුතුය.

04 ප්‍රශ්නය

4. (i) කිසියම් රටක, මෙම වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය මිනුම් කිරීමේදී, පහත සඳහන් දෑ අතුරෙන් කවරක් ඇතුළත් කර ගනු ලැබේ ද, කවරක් බැහැර කරනු ලැබේ ද යන්න දක්වා, එක් එක් කරුණ සම්බන්ධයෙන් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(අ) ගෘහණියක් මෙම වර්ෂයේදී තම ගෙවත්තෙහි එළවළු වගාකොට, මුළු අස්වැන්නම තම නිවසේ පරිභෝජනයට ගනී.

(ආ) විශ්‍රාමික සේවකයෙක් තම විශ්‍රාම වැටුප රජයෙන් ලබා ගනී.

(ඉ) මෝටර් රථ වෙළෙන්දෙක් පාවිච්චි කරන ලද මෝටර් රථයක් අලෙවි කොට, ඒ සඳහා කොමිස් මුදලක් උපයා ගනී.

(ඊ) මවක් තම දියණියට නිවසේදී ගණිත පාඩමක් ඉගෙනීමට උදව් කරයි. (ලකුණු 04යි)

(ii) කල්පිත ආර්ථිකයක් පිළිබඳ පහත සඳහන් දත්ත ඔබ වෙත ලබා දී ඇතැයි උපකල්පනය කරන්න.

අයිතමය	වටිනාකම (රුපියල් මිලියන)
දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය	800
පෞද්ගලික පරිභෝජන වියදම්	3 000
ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම්	100
ආණ්ඩුවේ මිල දී ගැනීම්	900
තොග වෙනස්වීම්	– 50
අපනයන	450
ආනයන	600
නිෂ්පාදනය මත ශුද්ධ බදු	150

වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්න. (ලකුණු 04යි)

(iii) කිසියම් ආර්ථිකයක මිනිසුන්ගේ ජීවන තත්ත්වය මැනීමේ මිනුමක් ලෙස, දළ දේශීය නිෂ්පාදිතය යොදා ගැනීමේ සීමාවන් කවරේ ද? (ලකුණු 04 යි)

(iv) පහත දැක්වෙන දෑ පැහැදිලි කරන්න.

(අ) එකතු කළ අගය

(ආ) පරිලේඛන (තොග) ආයෝජනය

(ඉ) දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

(ඊ) නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් (ලකුණු 08යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

04. (i) (අ) - ඇතුළත් කෙරේ.

- කුටුම්බය තුළ නිෂ්පාදනය කෙරෙන සියලුම භාණ්ඩ, වෙළෙඳපොළක අලෙවිකළත්, ස්වයං පරිභෝජනයට ගනු ලැබුවත්, වෙනසකින් තොරව නිෂ්පාදන මායිම තුළට ඇතුළත් කරගැනේ.

(ආ) - බැහැර කෙරේ.

- විශ්‍රාම වැටුප සංක්‍රාම ගෙවීමකි. සාධක ආදායමක් නිරූපණය නොකරයි. දළ දේශීය නිෂ්පාදිතයට හෝ දළ ජාතික ආදායමට හෝ එය ඇතුළත් නොකෙරේ.

(ඉ) - ඇතුළත් කෙරේ

- පාවිච්චි කළ මෝටෝ රථ ආශ්‍රිත වෙළෙඳාමේ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් නොකළත්, මෝටෝ රථ වෙළෙන්දා අතරමැදියකු වශයෙන් ඵලදායී කාර්යයක් හෙවත් වෙළෙඳාමක් කරන බැවින්, ඔහු උපයන කොමිස් මුදල වෙළෙඳාම ආශ්‍රිතව බිහිවන එකතු කළ අගයකි. දළ දේශීය නිෂ්පාදිතයේ එකතු කළ අගයන්ට එයද ඇතුළත් විය යුතුය.

(ඊ) - බැහැර කෙරේ.

- කුටුම්බය තුළ කුටුම්බ සාමාජිකයන් විසින් ඉටුකරනු ලබන කිසිදු සේවාවක් නිෂ්පාදන ඉම තුළට ඇතුළත් නොවේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(ii) - වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය

$$GDP = C+I+G+X-M$$

$$= 3000+800+(-50)+900+450-600$$ (ලකුණු 01 යි)

= රුපි. මිලියන 4500 (ලකුණු 01 යි)

(iii) - ජීවන තත්ත්වය මැනීමේ මිනුමක් ලෙස දළ දේශීය නිෂ්පාදිතයේ සීමාවන්.

- දළ දේශීය නිෂ්පාදිතය රටක නිෂ්පාදනය කරනු ලබන භෞතික භාණ්ඩ හා සේවා ප්‍රමාණය කැටිකොට දක්වන මිනුමක් වන අතර, පුද්ගලයන්ගේ ජීවන තත්වය කෙරෙහි බලපෑම් කරන ගුණාත්මක කරුණු (උදා: සාමකාමී පරිසරයක්, අදහස් ප්‍රකාශනයේ නිදහස, යහපාලනය, තේරීමේ නිදහස යනාදිය) එම මිනුම තුළ සලකා නොබැලේ.

- නොවිධිමත් අංශයේ නිෂ්පාදනයේ වටිනාකම නිවැරදිව පිළිබිඹු නොවන බැවින්, රට තුළ නිපදවනු ලබන සැබෑ භෞතික භාණ්ඩ හා සේවා ප්‍රමාණය වුව ද එමගින් නිවැරදි ව නොමැනේ. නොවිධිමත් අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ ඇස්තමේන්තු කළ අගයන්, සැබෑ අගයට වඩා ඌන තක්සේරු වූ හෝ අධි තක්සේරු වූ හෝ අගයන් විය හැකි ය.

- දළ දේශීය නිෂ්පාදිතයට අදාළ සංඛ්‍යා, රටක ආදායම ව්‍යාප්තියේ ස්වභාවය මුළුමනින් ම අමතක කොට ඇත. ජීවන තත්වය කෙරෙහි සෘජු බලපෑමක් ඇති ආදායම් විෂමතාවන් ජාතික ගිණුම් දත්තවල පිළිබිඹු නොවේ.

- දළ දේශීය නිෂ්පාදිතය සහ ඒ හා අදාළ අනෙකුත් සංකල්ප (ප්‍රතිශීර්ෂ ආදායම, මූර්ත ආදායම) ජීවන තත්වය පිළිබඳ අසම්පූර්ණ මිනුම් වේ. බොහෝ ඵලදායි නිෂ්පාදන ක්‍රියාකාරකම් එමගින් පිළිබිඹු නොවේ. උදාහරණ වශයෙන් තමන් විසින් ම නිවස තුළ ඉටු කරන ඵලදායි කටයුතු, ගෘහණියන්ගේ සේවාවන් යනාදිය දැක්විය හැකි ය.

- නිවැරදි තොරතුරු සපයාගත නොහැකි නිසා නිරීක්ෂණය නොකරනු ලබන ආර්ථිකයේ සිදුවන නීති විරෝධී ආර්ථික ක්‍රියාකාරකම් (උදා: නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ මත්පැන්) වල වටිනාකම දළ දේශීය නිෂ්පාදිතය තුළ ඇතුළත් නොවේ.

- දළ දේශීය නිෂ්පාදිතය තුළ ඇතුළත් භාණ්ඩ හා සේවා මිනිසුන්ගේ ජීවිතයේ ගුණාත්මක තත්ත්වය කෙරෙහි කෙසේ බලපානු ලැබේදැයි එය සලකා නොබලයි. උදාහරණයක් වශයෙන් නාගරික ප්‍රදේශවල ජීවත් වන මිනිසුන්ට තම ආදායමින් සැලකිය යුතු කොටසක් නාගරීකරණය ආශ්‍රිත ගැටලු විසඳාගැනීම සඳහා යොමු කිරීමට සිදුවේ. නිදසුනක් වශයෙන් නාගරික ප්‍රදේශවල මිනිසුන්ට තම නිවාස හා දේපළ සොරසතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීමට විශේෂ ආරක්ෂක විධිවිධාන සහ උපකරණ මිල දී ගැනීමට සිදුවේ.

- මිනිසුන් ජීවත්වන පරිසරයේ ගුණාත්මක තත්ත්වය දළ දේශීය නිෂ්පාදිතසංඛ්‍යා වලින් සොයා නොබැලේ. පරිසර දූෂණය වළක්වා ගැනීමට යොදා ගැනෙන නීති රීති ඉවත් කරනු ලැබුවහොත්, කිසියම් රටකට නිමැවුම් මට්ටම (දළ දේශීය නිෂ්පාදිතය) ඉහළ නංවාගත හැකිය. එහෙත් මෙහි දී ඉහළ ආදායම් මට්ටමක් හෝ ඉහළ ප්‍රතිශීර්ෂ ආදායමක් හෝ තිබූ පමණින්, ජීවන තත්වය උසස් වී ඇතැයි නිගමනය කළ නොහැකි ය. ආදායම ඉහළ ගොස් තිබිය දී වාතය, ජලය සහ වෙනත් සම්පත් දූෂණයට ලක්ව තිබිය හැකි ය.

- මිනිසුන්ගේ ජීවිතයේ ගුණාත්මක තත්ත්වයට ඍජුවම බලපාන විවේක කාලය සඳහා දළ දේශීය නිෂ්පාදිත සංඛ්‍යා මගින් වටිනාකමක් ලබා නොදේ. මිනිසුන් දිනකට පැය 12 ක් සහ සතියකට දින 7 ක් වැඩෙහි යෙදුණොත් රටකට දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නංවා ගත හැකි ය. මිනිසුන්ට විවේක කාලයක් භුක්ති විඳීමට නිදහසක් නොමැති නම් භාණ්ඩ හා සේවා ප්‍රමාණය ඉහළ නංවාගැනීමෙන් උසස් ජීවන මට්ටමක් තහවුරු කරගත නොහැකි වේ.

- දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී යහපත් භාණ්ඩ සහ අයහපත් භාණ්ඩ වශයෙන් ප්‍රභේදයක් නොදකී. කිසියම් රටක භූමි කම්පාවක් හටගෙන නිවාස, ගොඩනැගිලි සියල්ල පුනරුත්ථාපනය කරනු ලැබුවහොත්. දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යයි. පුද්ගලයන් රෝගී තත්ත්වයට පත් වී එයින් වැළැකීම සඳහා රෝහල් ගත වුවහොත්, සහ ඖෂධ මිල දී ගත් විට, දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නගී. එහෙත් භූමි කම්පා හට ගැනීම හෝ මිනිසුන් රෝගී තත්වයට පත්වීම හෝ ජීවන තත්ත්වය උසස් වීමට දායක වෙතියි කිසිවෙක් නොපවසයි.

- තාක්ෂණයේ ප්‍රතිලාභ සැලකිල්ලට ගැනීමට ද දළ දේශීය නිෂ්පාදිත සංඛ්‍යා අසමත්ව සිටී. විවිධ නොමිල මෘදුකාංග (Free Apps) ඔස්සේ ඔබගේ ජංගම දුරකථනයට ලැබෙන විවිධ පහසුකම් (උදා: මාර්ග සිතියම්, කාලගුණ තොරතුරු, මාර්ග තදබදය පිළිබඳ තොරතුරු හා වෙනත් සංනිවේදන පහසුකම්) ගුණාත්මක ජීවන තත්ත්වය උසස් කිරීමට විශාල දායකත්වයක් සපයයි. එහෙත් ඒවා සඳහා මිලක් අය නොකෙරෙන බැවින්, එම ප්‍රතිලාභ ජාතික ගිණුම් වටිනාකම් තුළ පිළිබිඹු නොවේ.

(ඕනෑම එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(iv) (අ) - කිසියම් ආයතනයක නිෂ්පාදනයේ වටිනාකමින් එම නිමැවුම බිහි කිරීම සඳහා වෙනත් ආයතනවලින් ලබාගත් සියලුම යෙදවුම්වල අගය අඩුකළ විට ශේෂ වනුයේ එකතුකළ අගයයි.

- ආයතනයේම ක්‍රියාකාරිත්වය නිසා නිෂ්පාදනයට සිදුවූ දායකත්වය එකතු කළ අගය නිරූපණය කරයි. මෙලෙස ආර්ථිකයේ සිටින සියලුම ආයතනවල එකතුකළ අගයන්ගේ ඓක්‍යය ගත්විට, එය සමස්ත නිෂ්පාදිතයේ වටිනාකම හෙවත් දේශීය නිමැවුම පෙන්නුම් කරයි. **(ලකුණු 02 යි)**

(ආ) - පරිලේඛන ආයෝජන යනුවෙන් අදහස් කරනුයේ නිෂ්පාදන ආයතනයක් සතු අමුද්‍රව්‍ය, අර්ධ නිමි භාණ්ඩ සහ අවසාන භාණ්ඩ තොගයනට කරනු ලබන එකතු කිරීම් ය.

- පරිලේඛන මත කෙරෙන ආයෝජන මට්ටම තීරණය කෙරෙනුයේ අනාගත ඉල්ලුම පිළිබඳව ආයතනය කරනු ලබන පුරෝකථනයන් සහ ඒ අනුව සකසා ගනු ලබන නිෂ්පාදන සැලසුම් මතය.

- නිෂ්පාදන මට්ටම සුමටව පවත්වාගෙන යාම සඳහා සතුටුදායක පරිලේඛන මට්ටමක් අවශ්‍ය වන අතර, ඉහළ නිමැවුම් මට්ටමක් සැලසුම් කරන විට පරිලේඛන ආයෝජන ද ඉහළ නැංවිය යුතු වේ.

(ලකුණු 02 යි)

(ඉ) - ආර්ථිකයක නිෂ්පාදනය කරනු ලබන සියලුම අවසාන භාණ්ඩ හා සේවාවන්ගේ මිල මට්ටම මිනුම් කිරීමට යොදාගැනෙන මිනුමක් වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය සැලකිය හැකිය.

- එය ගණනය කෙරෙනුයේ පවත්නා මිල යටතේ ගණනය කරන ලද දළ දේශීය නිෂ්පාදිතයේ අගයත් ස්ථාවර මිල යටතේ ගණනය කරන ලද දළ දේශීය නිෂ්පාදිතයේ අගයත් අතර අනුපාතයක් වශයෙනි. එය 100 න් ගුණ කිරීමෙන් දර්ශකයක් ලෙස ප්‍රකාශ කෙරේ.

- $$\text{ද.දේ.නි. අවධමනකය} = \frac{\text{වර්තන මිල යටතේ ද.දේ. නි.}}{\text{ස්ථාවර මිල යටතේ ද.දේ.නි.}} \times 100$$

(ලකුණු 02 යි)

(ඊ) - ජාතික ගිණුම්කරණයේ දී නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් වශයෙන් ගැනෙනුයේ රටක නිෂ්පාදන ඉම තුළ නිෂ්පාදනය නොවූ එහෙත් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා යොදා ගතහැකි වත්කම්ය.

- දේශීය ප්‍රාග්ධන තොගයේ සංරචකයක් වන මෙම වත්කම් ගණයට ඇතුළත් වනුයේ
  - සවාභාවික සම්පත් (උදා: භූමිය ඛනිජ සහ බලශක්ති සංචිත, වගා නොකරන ලද ජෛව සම්පත්, වනාන්තර, රේඩියෝ තරංග)
  - ගිවිසුම්, බදුකර, ස්වාධිකාර සහ බලපත්‍ර
  - කීර්තිනාමය, වෙළෙඳනාම, සන්නාම් යනාදිය **(ලකුණු 02 යි)**

4වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



4 ප්‍රශ්නයට අපේක්ෂකයන්ගෙන් 17%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 54%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 18%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 17%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 11%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 4ක් ඇත. පහසුතාව අඩු ම කොටස (iv) (ආ) වී ඇති අතර, එහි පහසුතාව 14%කි. පහසුතාව වැඩි ම කොටස (i) (ඊ) වන අතර, එහි පහසුතාව 65%කි.

★ ● 4 (i) කොටසෙහි "අ" අනු කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 35%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එම අනු කොටස මගින් විමසා තිබුණේ ගෘහණියක් විසින් තම ගෙවත්තෙහි එළවළු වගා කිරීම දළ දේශිය නිෂ්පාදිතයට ඇතුළත් කරනු ලැබේද යන්න පිළිබඳව ය. නමුත් අපේක්ෂකයින් අතුරෙන් වැඩි ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු ලබා දී නො තිබුණි. ගෘහ ඒකක අංශය තුළ නිපදවනු ලබන භාණ්ඩ දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කරන අතර ගෘහ ඒකක අංශය තුළ නිපදවන සේවා දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් නො කරන බව සිසුන් හට අවබෝධ කළ යුතුය.

★ ● 4 (i) කොටසෙහි "ආ" උප කොටසට නිවැරදි පිළිතුරු සපයා තිබුණේ 48%ක් පමණි. අදාළ අනු කොටස මගින් විමසා ඇත්තේ විශ්‍රාමිකයින්ට ගෙවනු ලබන වැටුප දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කරන්නේ ද යන්නයි. විශ්‍රාමිකයින් හට ගෙවන විශ්‍රාම වැටුප එලදායී නො වන ගෙවීමක් බැවින් දළ දේශීය නිෂ්පාදිතයට එකතු නො වන බව අවධාරණය කළ යුතුය. මෙවැනි ගැටලු වලට පිළිතුරු සපයන විට අදාළ ගනුදෙනුව දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කිරීමට හෝ ඇතුළත් නො කිරීමට හේතුව දක්වා තිබීම අනිවාර්ය බව සිසුන් හට වටහා දිය යුතුය.

★ ● 4 (i) කොටසෙහි "ඉ" අනු කොටසට අපේක්ෂකයින් 29%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. අදාළ අනු කොටස මගින් විමසා තිබුණේ මෝටර් රථ වෙළෙන්දෙක්, පාවිච්චි කළ මෝටර් රථයක් අළෙවි කිරීමෙන් ලබන කොමිස් මුදල දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කරයිද යන්නයි. මෙම ගනුදෙනුවේ දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කර ගත යුතු සිදුවීම, මෝටර් රථය අළෙවියෙන් ලද කොමිස් මුදල මිස පාවිච්චි කළ මෝටර් රථයේ වටිනාකම නො වේ. මෝටර් රථය අළෙවියෙන් ලද කොමිස් මුදල එලදායී ගනුදෙනුවක් බැවින් දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කළ යුතුය. නමුත් පාවිච්චි කළ මෝටර් රථය **නැවත අළෙවි කිරීම** දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් නො විය යුතුය.

★ ● 4 (i) කොටසෙහි "ඊ" අනු කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 65%ක් නිවැරදි පිළිතුරු සපයා ඇත. එම අනු කොටස මගින් විමසා තිබූණේ මවක තම දියණියට ගණිත පාඩමක් ඉගෙනීමට උදව් කිරීම දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කරයිද යන්නයි. ගෘහ ඒකක අංශය තුළ ස්ව පරිභෝජනය සඳහා නිපදවෙන සේවා දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කර නො ගන්නා බව සිසුන් හට අවබෝධ කර දිය යුතුය.

ඉහත (i) කොටසෙහි අනු කොටස් මගින් විමසා තිබූ නිෂ්පාදන ඉමට ඇතුළත් කර ගන්නා හෝ නො ගන්නා ඇ පිළිබඳව අපේක්ෂකයන් සියලු දෙනාට නිවැරදි ව අවබෝධයක් නො තිබූ බව පැහැදිලි වේ. එබැවින් දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කරන ඇ පිළිබඳව දැනුම හා අවබෝධය පරිපූර්ණ වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කළ යුතුය.

★ 4 (ii) කොටස සඳහා අපේක්ෂකයින් 32%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. අදාළ කොටස මගින් විමසා තිබුණේ දී ඇති දත්ත උපයෝගී කොට ගෙන වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම පිළිබඳව ය. නමුත් අපේක්ෂකයන්ගෙන් වැඩි ප්‍රතිශතයක් වැරදි පිළිතුරු සැපයීම මගින් අනාවරණය වන්නේ දී ඇති දත්ත අතුරෙන් දළ දේශීය නිෂ්පාදිතය නිවැරදිව තක්සේරු කිරීමේ කුසලතාව ලබා නො තිබෙන බව ය. වියදම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමට ඇතුළත් කළ යුතු අයිතම නිශ්චය කිරීමට අදාළ අභ්‍යාස කරවීම මගින් සිසුන්ගේ දැනුම, භාවිත කිරීමේ කුසලතාවය වැඩි දියුණු කළ යුතුය.

★ 4 (iii) කොටස සඳහා අපේක්ෂකයින්ගෙන් 26%ක් නිවැරදි පිළිතුරු සපයා ඇත. මෙම කොටස මගින් විමසා තිබුණේ මිනිසුන්ගේ ජීවන තත්ත්වය මැනීමෙහිලා දළ දේශීය නිෂ්පාදිතය යොදා ගැනීමේ සීමාවන් පිළිබඳව ය. උක්ත මාතෘකාව පිළිබඳව දැනුමෙහි ඌනතාව අපේක්ෂකයින් වැඩි පිරිසකගේ පිළිතුරු අසාර්ථක වීමට හේතු විය. එබැවින් සංවර්ධනය මැනීමට දළ දේශීය නිෂ්පාදිතය යොදා ගැනීමේ සීමාවන් එකින් එක සිසුන්ට අවබෝධ වන ලෙස දැනුම ලබා දිය යුතුය.

★ ● 4 (iv) කොටසෙහි "අ" අනු කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 29%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එම කොටස මගින් විමසා තිබුණේ එකතු කළ අගය පැහැදිලි කිරීම පිළිබඳව ය. අදාළ සංකල්පය නිවැරදිව පැහැදිලි කිරීමට අපොහොසත් වීම බහුතර සිසුන් තුළ එම සංකල්පය පිළිබඳ දැනුමෙහි අපැහැදිලි බව අනාවරණය කරයි. තවද මෙම කොටසට පිළිතුරු ලබා දීමේදී සියලු ම ආයතනවල එකතු කළ වටිනාකම්වල ඓක්‍යය දළ දේශීය නිෂ්පාදිතය බව සඳහන් කළ යුතුය.

★ ● 4 (iv) කොටසෙහි "ආ" අනු කොටස සඳහා අපේක්ෂකයින් 14%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. ගැටලුව යොමුවී තිබුණේ පරිලේඛන ආයෝජනය පැහැදිලි කිරීම සඳහාය. අපේක්ෂකයින් වැඩි දෙනෙකු "පරිලේඛන ආයෝජන" යන සංකල්පය නිවැරදිව හඳුනාගෙන නො තිබීම පිළිතුරු අසාර්ථක වීමට ප්‍රධාන හේතුව විය. අපේක්ෂකයන් තොග වර්ග නම් කොට තිබුණ ද, එහි වටිනාකම ඉහළ යාම ආයෝජනයක් ලෙස සඳහන් කොට නො තිබීමත්, තොග ආයෝජන ඉහළ යාමට අනාගත ඉල්ලුම පිළිබඳව ආයතන කරන පුරෝකථනයන් හේතු වන බව සඳහන් වී නොමැති වීමත්, පිළිතුරු අසාර්ථක වීමට හේතු විය. පරිලේඛන ආයෝජන පිළිබඳ දැනුම පුළුල් වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කළ යුතුවේ.

★ ● 4 (iv) කොටසෙහි "ඉ" අනු කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 15%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එම අනු කොටස මගින් විමසා ඇත්තේ දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය පැහැදිලි කිරීම පිළිබඳව ය. දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය ගණනය කරන ආකාරය දැක්වීමට හැකියාව තිබුණද, එය නිර්වචනය කිරීමට අපොහොසත් වීම, පිළිතුරු අසාර්ථක වීමට හේතු වූවා යයි පැවසිය හැකිය. මේ නිසා දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය නිවැරදිව නිර්වචනය කිරීමට දැනුම ලබා දිය යුතුයි.

★ ● 4 (iv) කොටසෙහි "ඊ" අනු කොටසට නිවැරදි පිළිතුරු ලබා දී තිබුණේ 23%ක් පමණි. අදාළ අනු කොටස මගින් විමසා තිබුණේ නිෂ්පාදනය නො කළ මූල්‍ය නො වන වත්කම් පැහැදිලි කිරීම පිළිබඳව ය. බහුතර අපේක්ෂකයින්ගේ පිළිතුරු වැරදි සහගත වීමට හේතු වූයේ නිෂ්පාදනය නො කළ මූල්‍ය නො වන වත්කම් අර්ථ දැක්වීමේදී රටක නිෂ්පාදන ඉම තුළ නිෂ්පාදනය නො වූ එහෙත් නිෂ්පාදනය සඳහා යොදා ගත හැකි වත්කම් ලෙස සටහන් කොට නො තිබීමය.

05 ප්‍රශ්නය

5. (i) පෙළැඹුණු පරිභෝජනය සහ ස්වායත්ත පරිභෝජනය අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(ii) කිසියම් ආර්ථිකයක් පිළිබඳ පහත දැක්වෙන සාර්ව ආර්ථික දත්ත සැලකිල්ලට ගන්න.

$C = 60 + 0.8\,Y_D$ $\quad I = 100 \quad G = 200 \quad T = 150 \quad Tr = 75$

Y_D = වැය කළ හැකි ජාතික ආදායම $\quad$ C = පරිභෝජනය

I = ආයෝජනය $\quad$ G = ආණ්ඩුවේ මිල දී ගැනීම්

- පරිභෝජන වියදම් වැයකළ හැකි ආදායමේ අනුලෝම ශ්‍රිතයකි. වැය කළ හැකි ආදායම වෙනස් වන විට පරිභෝජන වියදම ද අනුලෝම වශයෙන් වෙනස් වේ. හුදෙක් ආදායමේ වෙනස් වීම මත වෙනස්වන පරිභෝජන වියදමේ ප්‍රමාණය පෙළැඹුණු පුද්ගලයෙකුගේ සැබෑ පරිභෝජනය ලෙස හැඳින්වේ. පරිභෝජන වියදමෙන් සවායත්ත පරිභෝජනයේ ප්‍රමාණය අඩු කළ විට ශේෂවන්නේ, පෙළැඹුණු පරිභෝජනයයි. උදාහරණයක් වශයෙන් මුළු පරිභෝජනය රුපියල් 2000ක් සහ ස්වායත්ත පරිභෝජනය රුපියල් 800ක් නම්, පෙළැඹුණු පරිභෝජනය රපියල් 1200 කි. **(ලකුණු 02 යි)**

(ii) (අ) - ඉතුරුම් ශ්‍රිතය $(S) = -60 + 0.2\,Y_D$ **(ලකුණු 02 යි)**

(ආ) - සාමාන්‍ය පරිභෝජන නැමියාව $(APC) = \dfrac{C}{Y_D}$,

$Y_D = 500$ නම්, $C = 60 + 0.8\,(500) = 460$ **(ලකුණු 01 යි)**

$$APC = \frac{460}{500} = 0.92$$ **(ලකුණු 01 යි)**

- සාමාන්‍ය ඉතුරුම් නැමියාව $(APS) = \dfrac{S}{Y_D}$

$Y_D = 500$ නම්, $S = -60 + 0.2\,(500) = 40$ **(ලකුණු 01 යි)**

$$(APS) = \frac{40}{500} = 0.08$$ **(ලකුණු 01 යි)**

(ඉ) - **සමතුලිත ජාතිකය ආදායම් මට්ටම:**

$$Y = C+I+G$$

$$Y = 60+08\,Y_D+100+200$$ **(ලකුණු 01 යි)**

$$Y = 60+0.8(Y-T+Tr)+300$$

$$Y = 60+0.8(Y-150+75)+300$$

$$Y = 360+0.8(Y-150+75)$$ **(ලකුණු 01 යි)**

$$Y = 360+0.8Y-120+60$$

$$Y = 360+0.8Y$$

$$Y-0.8Y = 300;\ 0.2Y=300;\ Y=1500$$ **(ලකුණු 02 යි)**

(ඊ) - ආයෝජන ගුණකය $(K) = \frac{1}{1\text{-}MPC} = \frac{1}{1\text{-}0.8} = \frac{1}{0.2} = 5$

(ලකුණු 02 යි)

(iii) - **ශුද්ධ අපනයන ප්‍රමාණය**

$$S+T+M = J+G+X$$

$$S+T-(I+G)=X-M \;(= \text{ශුද්ධ අපනයනය})$$

$$200+300-(250+400) = (X-M)$$

$$500-650 = (X-M)$$

$$150 = (X-M)$$ **(ලකුණු 04 යි)**

5 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය



5 ප්‍රශ්නයට අපේක්ෂකයන්ගෙන් 43%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 17%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 23%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 28%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 32%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 3ක් ඇති අතර (ii) වන කොටස (අ), (ආ), (ඉ), (ඊ) වශයෙන් අනුකොටස් හතරකින් යුක්තය. මෙම ප්‍රශ්නය තුළ වැඩි ම පහසුතාව (ii) කොටසේ 'අ' අනුකොටසට හිමිවන අතර, එහි පහසුතාව 94%කි. අඩු ම පහසුතාව ඇත්තේ (i) කොටසට වන අතර, එහි පහසුතාව 49% කි.

- ⋆ 5 වන ප්‍රශ්නයේ (i) කොටස සඳහා අපේක්ෂකයින් අතුරින් 49%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එම කොටස මගින් විමසා තිබුණේ පෙළඹුණු පරිභෝජනය හා ස්වායත්ත පරිභෝජනය අතර වෙනස ය. අපේක්ෂකයින් වැඩි දෙනෙකුගේ පිළිතුරු නිවැරදි නො වීමට, පෙළඹුණු පරිභෝජනය නිවැරදිව අර්ථ දැක්වීමට නො හැකි වීම හේතු වූ බව සඳහන් කළ හැකිය. මේ නිසා පෙළඹුණු පරිභෝජනය නිවැරදිව අර්ථ දැක්වීමට හා පරිභෝජන ශ්‍රිතය ඇසුරින් එය නිවැරදිව ගණනය කිරීමට සිසුන් තුළ දැනුම හා කුසලතාවයන් ප්‍රගුණ කළ යුතුය.

- ⋆ (ii) කොටසෙහි "අ" අනු කොටස සඳහා අපේක්ෂකයින් 94%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

- ⋆ (ii) කොටසෙහි "ආ" අනු කොටස සඳහා නිවැරදිව පිළිතුරු සපයා තිබුණේ 57%කි. අදාළ අනු කොටස මගින් විමසා තිබුණේ සාමාන්‍ය ඉතුරුම් නැමියාව හා සාමාන්‍ය පරිභෝජන නැමියාව ගණනය කරන ආකාරය පිළිබඳව ය. දෙන ලද ආදායම් මට්ටම්වලදී සාමාන්‍ය පරිභෝජන නැමියාව හා සාමාන්‍ය ඉතුරුම් නැමියාව ගණනය කිරීමේ කුසලතා වැඩි දියුණු කළ යුතුය.

- ⋆ (ii) කොටසෙහි "ඉ" අනු කොටසට අපේක්ෂකයින් 72%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එම අනු කොටස මගින් විමසා තිබුණේ සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කිරීම පිළිබඳවය. සමතුලිත ආදායම ගණනය කිරීම පිළිබඳ වැඩිපුර අභ්‍යාස කිරීම මගින් දැනුම භාවිත කිරීමේ නිපුණතා වර්ධනය කළ යුතුය.

- ⋆ (ii) කොටසෙහි "ඊ" අනු කොටස සඳහා අපේක්ෂකයින්ගෙන් 85%ක් නිවැරදි පිළිතුරු සැපයීම මගින් අනාවරණය වන්නේ එම ගැටලුව පිළිබඳ අපේක්ෂකයින් වැඩි දෙනෙකුගේ දැනුම සතුටුදායක බවය.

- ⋆ (iii) කොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 60%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. අදාළ කොටස මගින් විමසා තිබුණේ කාන්දුවීම් හා විදීම් ප්‍රවේශය ඔස්සේ සමතුලිත නිමැවුම් මට්ටමේ දී කිසියම් සංරචකයක වටිනාකම ගණනය කිරීම පිළිබඳව ය. අපේක්ෂකයින් 40%ක් අදාළ ගැටලුව නිවැරදිව විසඳා ගැනීමට අපොහොසත්ව ඇත. එමගින් පැහැදිළි වන්නේ අපේක්ෂකයින් වැඩි දෙනෙකු කාන්දු වීම් හා විදීම් ප්‍රවේශය ඔස්සේ සමතුලිත නිමැවුම තීරණය වීමේදී, දී ඇති විචල්‍ය සමඟ සම්බන්ධ කරමින් කිසියම් විචල්‍යයක වටිනාකම ගණනය කිරීමේ කුසතලාව ප්‍රගුණ කළ යුතු බවයි.

"ආ" උප කොටස

06 ප්‍රශ්නය

(මෙම කොටසෙන් ද අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

6. (i) ශ්‍රී ලංකාවේ පොදු මිල මට්ටමෙහි වෙනස්කම් දැක්වීමෙහි ලා වර්තමානයේ යොදා ගැනෙන මිනුම් කවරේ ද? (ලකුණු 03යි)

(ii) උද්ධමනයේ අහිතකර ප්‍රතිවිපාක කවරේ ද? (ලකුණු 04යි)

(iii) කිසියම් රටක වාණිජ බැංකු පද්ධතිය තුළ කටයුතු කරන එක් වාණිජ බැංකුවක සරල ශේෂ පත්‍රයක් පහත දැක්වේ.

වගකීම්	වටිනාකම (රුපියල් මිලියන)	වත්කම්	වටිනාකම (රුපියල් මිලියන)
තැන්පතු	100 000	අවශ්‍ය කරන සංචිතය	10 000
කොටස් හිමියන්ගේ ප්‍රාග්ධනය	25 000	අධි සංචිත	5 000
		සුරැකුම්පත්	30 000
		ණය	80 000
මුළු වගකීම්	**125 000**	**මුළු වත්කම්**	**125 000**

(අ) අවශ්‍ය කරන සංචිත අනුපාතය කොපමණ ද? (ලකුණු 02යි)

(ආ) මෙම බැංකුවේ ගනුදෙනුකරුවෙකු තම ජංගම ගිණුමෙන් රුපියල් මිලියන 2 000ක් ආපසු ගනු ලැබේ යැයි සලකන්න. මෙම මුදල් ඉවත් කර ගැනීම නිසා, බැංකුවේ සංචිතය කොපමණ ප්‍රමාණයකින් වෙනස් වන්නේ ද? (ලකුණු 02යි)

(ඉ) අවශ්‍ය කරන සංචිත අනුපාතය නොවෙනස්ව පවතී නම්, රුපියල් මිලියන 2 000ක තැන්පතු ප්‍රමාණය ඉවත් කරගත් විට, මෙම බැංකුවට අලුතින් ලබා දිය හැකි උපරිම ණය ප්‍රමාණය කොපමණ වේ ද? (ලකුණු 02යි)

(iv) මූල්‍ය ප්‍රතිපත්තිය යන්නෙන් කවරක් අදහස් වේ ද? (ලකුණු 03යි)

(v) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ණය පාලන ක්‍රම අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

06. (i) - කොළඹ පාරිභෝගික මිල දර්ශකය
- ජාතික පාරිභෝගික මිල දර්ශකය
- දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය
- නිෂ්පාදකයාගේ මිල දර්ශකය

(එක් මිල දර්ශකයට ලකුණු 01 බැගින්
ඕනෑම මිල දර්ශක තුනකට ලකුණු 03 යි)

(ii) - ජීවන වියදම ඉහළ යාම නිසා සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්ත්වය පහළ වැටේ.

- නිරපේක්ෂ දරිද්‍රතාව ඉහළ නගී.

- ආදායම් ව්‍යාප්තිය අසාධාරණ කෙරේ : විශ්‍රාම වැටුප් මත යැපෙන සමාජයේ දුබල කොටස් උද්ධමනයෙන් පීඩනයට පත්වන අතර වඩා ශක්තිමත් කේවෙල් කිරීමේ ශක්තිය වැඩි අය වැඩි ප්‍රතිලාභ හිමි කරගනී.

- ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලිය උද්ධමනය විසින් විකෘති කෙරේ.

- ණය දෙන්නන්ට සහ ණය හිමියන්ට උද්ධමනයකදී අවාසි සැලසෙන අතර, ණය ගනුවන්ට වාසි සැලසේ. මේ අනුව ණය හිමියන් වෙතින් ණය ගැතියන් කරා ආදායම් පුනර් ව්‍යාප්තියක් ඇති කරයි.

- විනිමය අනුපාතිකය අධිතක්සේරුවීම නිසා වෙළෙඳ ශේෂය කෙරෙහි අයහපත් බලපෑමක් ඇති විය හැකිය.

- අපනයන තරගකාරිත්වය දුර්වලවේ.

- වෘත්තීය සමිති ක්‍රියාකාරකම් නිසා ආර්ථික කටයුතු අඩපණ විය හැකිය.

- අනාගත මිල හැසිරීම පිළිබඳ පවත්නා දැඩි අවිනිශ්චිත බව නිසා දිගුකාලීන ආයෝජන සඳහා යොමු නොවී, තම අරමුදල් කෙටිකාලීන වාසි ලබාගත හැකි ක්ෂේත්‍රවලට යොමුකළ හැකිය.

- සපත්තු සම් පිරිවැය සහ මෙනුපත් පිරිවැය.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(iii) (අ) - අවශ්‍යකරන සංචිත අනුපාතය $= \dfrac{\text{අවශ්‍යකරන සංචිතය}}{\text{මුළු තැන්පතු}}$

$$= \frac{10{,}000}{100{,}000} = 10\%$$ **(ලකුණු 02 යි)**

(ආ) - **සංචිත ප්‍රමාණයේ වෙනස් වීම.**

තැන්පතු ඉවත් කරගැනීමට පෙර මුළු සංචිත = 15000
තැන්පතු ඉවත් කරගත් පසු සංචිත ප්‍රමාණය = 13000
සංචිත වෙනස්වීම = 2000 **(ලකුණු 02 යි)**

(ඉ) - **උපරිම ණය ප්‍රමාණය :**
ලබාදිය හැකි උපරිම ණය ප්‍රමාණය අධි සංචිත ප්‍රමාණයට සමාන වේ.
පවත්නා සංචිතයේ ප්‍රමාණය :

= 10000 + 5000 - 2000
= 13000

අවශ්‍යකරන සංචිතයේ ප්‍රමාණය = 98000 x 10%
= 9,800

අධි සංචිතයේ ප්‍රමාණය = 13000 - 9800
= 3200 **(ලකුණු 02 යි)**

(iv) - සාර්ව ආර්ථික අරමුණු සාක්ෂාත් කරගනු පිණිස මුදලේ සුලබතාව (මුදල් සැපයුම සහ ණය සැපයුම) සහ මුදලේ මිල (පොලී අනුපාතිකය) පාලනය කරමින් සමාහාර ඉල්ලුම කෙරෙහි බලපෑම මූල්‍ය ප්‍රතිපත්තිය වේ.

- මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවනු ලබන්නේ රටක මහ බැංකුව විසිනි.

(ලකුණු 03 යි)

(විකල්ප පිළිතුරු

- සාර්ව ආර්ථික අරමුණක් වන මිල ස්ථායිතාව අත් කරගැනීම පිණිස මහා බැංකුව විසින් මුදලේ සැපයුම සහ එහි මිල පාලනය කිරීමේ ක්‍රියාවලිය මූල්‍ය ප්‍රතිපත්තිය වේ.

- ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමක් වේ. එහිලා මහා බැංකුව ප්‍රධාන වශයෙන් නිරත වී සිටිනුයේ ප්‍රතිපත්ති පොලී අනුපාතික තීරණය කිරීමට සහ ආර්ථිකයේ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමටය.

(v) - සමස්ත ආර්ථිකයේ ණය පරිමාව සහ ණයෙහි පිරිවැය පාලනය කිරීම සඳහා යොදාගැනෙන ණය පාලන ක්‍රම, ප්‍රමාණාත්මක ණය පාලන ක්‍රම ලෙස දැක්වේ. එම ණය පාලන ක්‍රම ආර්ථිකයේ එක් එක් අංශ කෙරෙහි විශේෂත්වයක් නොදක්වන අතර පොදුවේ සමස්ත ආර්ථිකයම ඒවායේ බලපෑමට යටත්වේ.

- ප්‍රතිපත්ති පොලී අනුපාතික (උදා: නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සහ බැංකු අනුපාතිකය), විවට වෙළෙඳපොළ කටයුතු සහ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා නියම කිරීම ප්‍රමාණාත්මක ණය පාලන ක්‍රම වේ.

(ලකුණු 02 යි)

- ආර්ථිකයේ තෝරාගත් ක්ෂේත්‍රයන් තුළ ණය ගලා යාම් සහ ඒවායේ දිශානතිය හැසිරවීම ගුණාත්මක ණය පාලනය මගින් සිදුවේ. එම පාලන ක්‍රම පොදු බලපෑමක් ඇතිකරන ඒවා නොව, විශේෂ වශයෙන් තෝරාගත් අංශ මත පමණක් බලපෑම් ඇති කරයි.

- ණය පිළිබඳ ප්‍රමාණාත්මක සීමා කිරීම්, පොලී අනුපාතික පිළිබඳ සීමාවන් නියම කිරීම, ප්‍රති මූල්‍ය පහසුකම් සැපයීම, ආන්තික අවශ්‍යතා නියම කිරීම, යහ පෙළඹුම වැනි දෑ ගුණාත්මක ණය පාලන ක්‍රම වේ.

(ලකුණු 02 යි)

6 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



6 ප්‍රශ්නයට අපේක්ෂකයන්ගෙන් 61%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 26%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 29%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 31%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 14%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 5ක් ඇති අතර (iii) 'අ' කොටසෙහි පහසුතාව උපරිම වන අතර එහි පහසුතාව 71%කට සීමා වී ඇත. පහසුතාව අඩු ම අනු කොටස (iii) 'ඉ' වන අතර, එහි පහසුතාව 17%කි.

- ⋆ 6 වන ප්‍රශ්නයේ (i) කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 67%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එම කොටස මගින් විමසා තිබුණේ ශ්‍රී ලංකාවේ පොදු මිල මට්ටමෙහි වෙනස්කම් දැක්වීමෙහිලා වර්තමානයේ යොදා ගන්නා මිනුම් පිළිබඳව ය. අපේක්ෂකයන් අතරෙන් යම් ප්‍රතිශතයක් උක්ත ගැටලුව පිළිබඳ අවශ්‍ය දැනුම ලබා නො තිබිණි. එම නිසා ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය සංවිධානය කිරීමේදී සිසුන්ගේ දැනුම යාවත්කාලීන කළ යුතුය.

- ⋆ (ii) කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 58%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එම කොටස මගින් විමසා තිබුණේ උද්ධමනයේ අහිතකර ප්‍රතිවිපාක පිළිබඳව ය. අපේක්ෂකයින් අතරෙන් 42%ක පිළිතුරු අසාර්ථක වීමට උද්ධමනයේ අහිතකර ප්‍රතිවිපාක වෙන් වශයෙන් හඳුනාගෙන නො තිබීම හේතු විය. එසේ ම උද්ධමනයේ ප්‍රතිවිපාක එකක් දෙකක් නො ව සැලකිය යුතු ප්‍රමාණයක් ඉදිරිපත් කිරීමට සිසුන් පෙළඹවිය යුතුය.

- ⋆ (iii) (අ) කොටස සඳහා අපේක්ෂකයන් 71%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එම කොටස මගින් විමසා තිබුණේ වාණිජ බැංකු පද්ධතිය තුළ එක් වාණිජ බැංකුවක ශේෂ පත්‍රය ඇසුරින් අවශ්‍ය කරන සංචිත අනුපාතය ගණනය කිරීම පිළිබඳව ය. සිසුන් වැඩි ප්‍රතිශතයක් සාර්ථකව පිළිතුරු සපයා තිබීම නිසා දැනුම භාවිත කිරීම පිළිබඳ කුසලතාවය සිසුන් වැඩි දෙනෙකුට තිබූ බව පැහැදිලිය.

★ (iii) (ආ) අනු කොටස සඳහා අපේක්ෂකයින්ගෙන් 37%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එම අනු කොටස මගින් විමසා තිබුණේ බැංකුවේ ගනුදෙනුකරුවකු තම ජංගම ගිණුමෙන් රුපියල් මිලියන 2000/- ක් ආපසු ඉවත් කර ගත් විට බැංකුවේ සංචිතය වෙනස් වන ප්‍රමාණය පිළිබඳවයි. අපේක්ෂකයින්ගෙන් 63% ක් පමණ වැරදි පිළිතුරු සැපයීම මගින් අනාවරණය වන්නේ මුදල් තැන්පතුව ආපසු ඉවත් කරගත් විට බැංකු තැන්පතුවලට ක්ෂණිකව හා දිගු කාලීනව ඇති වන බලපෑමත් වෙන් වෙන්ව හඳුනාගෙන නොමැති බවයි. තැන්පතු ආපසු ගත් විට තැන්පතු ප්‍රමාණයත් බැංකුවේ සංචිත මුදල් ප්‍රමාණයත් අඩු වීම ක්ෂණිකව සිදු වන බව පැහැදිලි කල යුතුය.

★ (iii) (ඉ) අනු කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 17% ක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. මෙම අනු කොටස මගින් විමසා තිබුණේ රුපියල් මිලියන 2000/- ක තැන්පතුව ඉවත් කරගත් පසු බැංකුවට අලුතින් ලබා දිය හැකි ණය ප්‍රමාණය කොපමණ ද යන්නයි. අපේක්ෂකයන්ගෙන් 83% ක් වැරදි පිළිතුරු ලබා දීම මගින් අදාළ ගැටලුව විසඳා ගැනීම පිළිබඳ නිවැරදි දැනුමක් නොතිබූ බව අනාවරණය වේ. රුපියල් මිලියන 2000/- ක තැන්පතු ඉවත් කරගත් විට තැන්පතු හා අධි සංචිත අඩු වන බවත් ඒ ඔස්සේ නව අධි සංචිතය සොයා ගැනීමෙන් අලුතෙන් ලබා දිය හැකි ණය ප්‍රමාණය සෙවීමට හැකි බව අපේක්ෂකයින් අවබෝධ කරගෙන නො තිබිණි. ඒ බව දී ඇති පිළිතුරුවලින් පැහැදිලි වේ. මෙහිදී **බැංකු පද්ධතිය තුළ එක් වාණිජ බැංකුවකට** අලුතෙන් ලබා දිය හැක්කේ බැංකුව සතු **අධි සංචිතය පමණක්** බව අවධාරණය කළ යුතුය.

★ (iv) කොටස සඳහා අපේක්ෂකයන් අතුරෙන් නිවැරදි පිළිතුරු සපයා තිබුණේ 48%ක් පමණි. ගැටලුව මගින් විමසා තිබුණේ මූල්‍ය ප්‍රතිපත්තිය යන්නෙහි අදහසය. මූල්‍ය ප්‍රතිපත්තිය නිර්වචනය කිරීමේදී සාර්ව ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස මුදලේ සුලභතාව හා මුදලේ මිල පාලනය කිරීම යැයි අපේක්ෂකයන් වැඩි දෙනෙකු සඳහන් නො කිරීම හා මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවනු ලබන්නේ මහ බැංකුව බව ප්‍රකාශ නො කිරීමත් අපේක්ෂකයින් වැඩි දෙනෙකුගේ පිළිතුරු අසාර්ථක වීමට හේතු විය. එසේම **මූල්‍ය ප්‍රතිපත්තිය** හා **රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය** අතර වෙනස අපේක්ෂකයින් අවබෝධ කරගෙන නො තිබීමද අඩු ලකුණු ගැනීමට හේතු විය.

★ (v) කොටස සඳහා අපේක්ෂකයින් 43%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි අදාළ ගැටලුව මගින් විමසා තිබුණේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක ණය පාලන ක්‍රම අතර වෙනස පිළිබඳව ය. සමස්ත ආර්ථිකයේ ණය පරිමාව හා ණයෙහි පිරිවැය පාලනය සඳහා යොදා ගැනෙන ක්‍රම, ප්‍රමාණාත්මක ණය පාලන ක්‍රම ලෙස සඳහන් නො කිරීම හා ප්‍රමාණාත්මක ණය පාලන උපකරණ නිවැරදිව නො දැක්වීම එනම් තෝරාගත් ක්ෂේත්‍රයන් තුළ ණය ගලායාම සහ ඒවායේ දිශානතිය හැසිරවීම සඳහා යොදා ගැනෙන ණය පාලන ක්‍රම ගුණාත්මක ණය පාලන ක්‍රම යැයි සඳහන් නො කිරීම සිසුන් වැඩි ප්‍රතිශතයකගේ පිළිතුරු වැරදි සහගත වීමට හේතු වී ඇත.

07 ප්‍රශ්නය

7. (i) පහත දැක්වෙන ඇ පෞද්ගලික භාණ්ඩ ද, පොදු භාණ්ඩ ද නැතහොත් පොදු සම්පත් ද යන්න නිශ්චය කරන්න.

(අ) සාගරයේ සිටින මත්ස්‍යයින්

(ආ) රූපවාහිනි විකාශන සංඥා

(ඉ) ජීවන රටාව හා කොලෙස්ටරෝල් මට්ටම පිළිබඳ කෙරෙන මූලික පර්යේෂණ

(ඊ) ස්වාධිකාර බලපත්‍රයක් (patent) හිමිකර ගත හැකි, කොලෙස්ටරෝල් මට්ටම පහළ හෙළීමේ ඖෂධයක් සඳහා සිදු කෙරෙන විශේෂ පර්යේෂණයක් (ලකුණු 04යි)

(ii) නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ ආණ්ඩුවේ මැදිහත්වීම් ඔබ සාධාරණය කරනුයේ කෙසේ ද? (ලකුණු 04යි)

(iii) බදු අය කිරීමේ සිරස් සාධාරණත්වය සහ තිරස් සාධාරණත්වය අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04යි)

(iv) අයවැය හිඟයන් වෙළෙඳපොළ පොලී අනුපාතිකය ඉහළ යාමටත්, පෞද්ගලික ආයෝජන පහළ යාමටත් දායක වන්නේ යැයි ඇතැම් ආර්ථික විද්‍යාඥයින් තර්ක කරනුයේ ඇයි? (ලකුණු 04යි)

(v) "කලාපයේ අන් රටවල් සමග සංසන්දනය කරන විට, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය හා දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය තවමත් ඉහළ අගයක පවතී." රාජ්‍ය ණය, මැදි හා දිගු කාලීනව තිරසාර මට්ටමක පවත්වා ගැනීම සහතික කිරීම් වස්, රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

07. (i) (අ) **සාගරයේ සිටින මත්ස්‍යයින්** - **පොදු සම්පත්**

(ආ) **රූපවාහිනී විකාශන සංඥා** - **පොදු භාණ්ඩ**

(ඉ) **ජීවන රටාව හා කොලෙස්ටරෝල් මට්ටම පිළිබඳ මූලික පර්යේෂණ** - **පොදු භාණ්ඩ**

(ඊ) **ස්වාධිකාර බලපත්‍රයක් හිමි කරගත හැකි ඖෂධ සඳහා සිදු කෙරෙන පර්යේෂණ** - **පෞද්ගලික භාණ්ඩ**

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(ii) **වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ ආණ්ඩුවේ මැදිහත් වීම:**

- වෙළෙඳපොළ ආර්ථිකයේ කාර්යක්ෂමතාව සඳහා අවශ්‍ය කෙරෙන නෛතික රාමුව ස්ථාපිත කිරීම, විශේෂයෙන් පෞද්ගලික දේපොළ සුරක්ෂිත කිරීමට අදාළ නීති හා ගිවිසුම් සම්පාදනය සහ බලගැන්වීම.
- වෙළෙඳපොළ අසමත්වීම් කෙරෙහි බලපාන හේතු (බාහිරතා, ශුභසාධන භාණ්ඩ, පොදු භාණ්ඩ, ඒකාධිකාරය) ඉවත් කරමින් සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.
- සාධාරණ ආදායම් ව්‍යාප්තියක් ඇති කිරීම
- සාර්ව ආර්ථික ස්ථායිතාව තහවුරු කිරීම
- ආර්ථික වර්ධනය හා සංවර්ධනය ඉහළ නැංවීම
- යටිතල පහසුකම් සංවර්ධනය
- පරිසරය ආරක්ෂා කිරීම සහ නියාමනය

(එක් කරුණකට ලකුණු 01 බැගින්
ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

(iii) - බදු අය කිරීමේදී සමාන ආර්ථික තත්ත්වයක සිටින පුද්ගලයන් මත සමාන බදු බරක් ඇති කිරීමෙන් සාධාරණත්වයක් ඇති වේ. "සමාන අයට සමාන ලෙස සැලකීමේ" මෙම මූලධර්මය තිරස් සාධාරණත්වය නමින් හැඳින්වේ.

(ලකුණු 02 යි)

- ආර්ථික තත්ත්වයෙන් අසමාන වූ ගෙවීමට ඇති හැකියාව වෙනස් පුද්ගලයන් මත, බදු බර අසමාන ලෙස පතිත කිරීම සාධාරණත්වය සඳහා අවශ්‍ය කෙරේ යන්න සිරස් සාධාරණත්ව මූල ධර්මයෙන් ප්‍රකාශ කෙරේ.

(ලකුණු 02 යි)

(iv) - අයවැය හිඟයන් රාජ්‍ය ඉතුරුම් පහළ හෙළීමට හේතුවේ. රාජ්‍ය ඉතුරුම් යනු රාජ්‍ය අයභාරය සහ රාජ්‍ය වර්තන වියදම් අතර පරතරයයි. පෞද්ගලික ඉතුරුම් නොවෙනස්ව තිබිය දී රාජ්‍ය ඉතුරුම් පහළ වැටීම ජාතික ඉතුරුම් පහළයාමට හේතුවේ. ණය අරමුදල් වෙළෙඳපොළ මත මෙම වෙනස්කම් පතිත වේ. ඉතුරුම් සැපයුම අඩු වීමේ ප්‍රතිඵල වශයෙන් මූර්ත පොලී අනුපාතික ඉහළ යන අතර, පෞද්ගලික ආයෝජනය පහළ වැටේ.

- අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා ආණ්ඩුව අරමුදල් වෙළෙඳපොළෙන් ණය ලබා ගැනීම නිසා ඉතුරුම් මත ඇති කෙරෙන පීඩනය වැඩිවේ. සීමිත අරමුදල් සඳහා රජය සමග තරග කිරීමට පෞද්ගලික ආයෝජකයන්ට සිදුවේ. මෙහි සමස්ත ප්‍රතිඵලය වනුයේ මූර්ත පොලී අනුපාතික ඉහළ යාමත් ආයෝජනය ආකර්ශණීය නොවීමත් ය. අයවැය හිඟය පියවීම සඳහා ආණ්ඩුව දේශීය ඉතුරුම් යොදා ගැනීමෙන් පෞද්ගලික ආයෝජනය මත ඇති කෙරෙන අයහපත් ප්‍රතිඵල 'තෙරපුම් ප්‍රතිවිපාකය' (Crowdin-out effect) නමින් හැඳින්වේ.

(ලකුණු 04 යි)

(v) - රජයේ මැදි කාලීන අරමුණක් වශයෙන් මධ්‍යම රජයේ සමස්ත අයවැය හිඟය 2020 වන විට අවම වශයෙන් 3.5% ක් දක්වා අඩු කිරීමටත්, මධ්‍යම රජයේ ණය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 70% දක්වා අඩු කිරීමටත් ඉලක්ක නියම කොට ඇත.

- නිවැරදි බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහ බදු පරිපාලනය ශක්තිමත් කිරීමට සහාය දීම සඳහා ක්ෂේත්‍ර කීපයක් කේන්ද්‍ර කරගනිමින් රජය විසින් පසුගිය අවුරුදු කීපය තුළ පියවර රැසක් ගනු ලැබීය. එම ක්ෂේත්‍ර වනුයේ (අ) බදු පදනම පුළුල් කිරීම, (ආ) බදු පද්ධතිය තාර්කීකරණය කිරීම, (ඇ) ආදායම් පරිපාලන හැකියාවන් වැඩි දියුණු කිරීම සහ (ඈ) රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම යනාදියයි.

- රාජ්‍ය වියදම් තාර්කීකරණය කිරීම සහ රජය සතු වාණිජ ව්‍යවසායන්ගෙන් මගින් ඇති විය හැකි රාජ්‍ය මූල්‍ය අවදානම් අවම කිරීම සඳහාද අවධානය යොමු කොට ඇත.

- වාණිජමය ලෙස ලාභදායි මෙහෙයුම් ඇති කිරීමට හැකිවන පරිදි රජය සතු වාණිජ ව්‍යවසායන් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යොමුවීම.

- 2016 නොවැම්බර් මාසයේ දී සංශෝධිත එකතු කළ අගය මත බදු (VAT) පනත බලාත්මක කොට එමගින් බදු පදනම පුළුල් කිරීම, බදු අනුපාත ඉහළ නැංවීම සහ බදු නිදහස් කිරීම අඩු කිරීම

- දේශීය ආදායම් පනත නැවත කෙටුම්පත් කිරීම මගින් ආදායම් බදු රෙගුලාසි සංශෝධනය කිරීම.

- බදු සහන ප්‍රදානය කිරීමට ආයෝජන මණ්ඩලයට පැවැති හැකියාව සීමා කරමින් ආයෝජන මණ්ඩල පනත සංශෝධනය කිරීම.

- ආදායම් බදු සහ එකතු කළ අගය මත බදු සඳහා අන්තර්ජාලය ඔස්සේ බදු වාර්තා පියවීමද ඇතුළත් ප්‍රධාන දේශීය බදු වර්ග කීපයකට අදාළව නව තොරතුරු තාක්ෂණික පද්ධතියක් (RAMIS) හඳුන්වාදීම.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

7 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



7 ප්‍රශ්නයට අපේක්ෂකයන්ගෙන් 80%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 34%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 36%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 23%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 7%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 5ක් ඇති අතර (i) "අ"කොටස පහසු ම කොටස වී ඇත. එහි පහසුතාව 95%කි. පහසුතාව අඩු ම කොටස (v) කොටස වී ඇති අතර, එහි පහසුතාව 20%කි. (ii), (iii) සහ (iv) කොටස්වල පහසුතා පිළිවෙළින් 51%, 41% සහ 24% වේ.

- 7 වන ප්‍රශ්නයේ (i) කොටසෙහි "අ" අනු කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 95%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එබැවින් අපේක්ෂකයන් වැඩි දෙනෙකුගේ අවබෝධය ඉහළ මට්ටමක පැවතුනි.

- (i) කොටසෙහි "ආ" අනු කොටස සඳහා අපේක්ෂකයන් 71%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එම අනු කොටස මගින් විමසා තිබුණේ රූපවාහිනී විකාශන සංඥා කවර භාණ්ඩ වර්ගයකට අයත් ද යන්නයි. අපේක්ෂකයින් වැඩි දෙනෙකු නිවැරදිව වර්ගීකරණය කිරීමේ කුසලතාව ලබා තිබුණි.

- (i) කොටසෙහි "ඉ" අනු කොටස සඳහා අපේක්ෂකයින්ගෙන් 56%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. අපේක්ෂකයින් ප්‍රතිශතයක් මූලික පර්යේෂණ පොදු භාණ්ඩ යැයි වර්ග කිරීමට අපොහොසත් වී ඇත.

- (i) කොටසෙහි "ඊ" අනු කොටස සඳහා අපේක්ෂකයින් 83%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. ස්වාධිකාර බලපත්‍රයක් හිමි කර ගැනීමට කෙරෙන ඖෂධ සඳහා පර්යේෂණ, පෞද්ගලික භාණ්ඩයක් ලෙස නිවැරදිව වර්ග කිරීමට අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයකට හැකි වී තිබුණි.

- (ii) කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 51%ක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. එම කොටස මගින් විමසා තිබුණේ නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ ආණ්ඩුවේ මැදිහත්වීම සාධාරණීකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳව ය. අපේක්ෂකයින් සැළකිය යුතු ප්‍රතිශතයක පිළිතුරු අසාර්ථක වීම කෙරෙහි බලපාන ලද්දේ වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ අසමත්වීම් පැහැදිලි කිරීමට හා ඒවා නිවැරදි කිරීමට රජය මැදිහත් විය යුතු ආකාරය විග්‍රහ කිරීමට අපොහොසත් වීම නිසාය.

- (iii) කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 41%ක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. එම කොටස මගින් විමසා තිබුණේ බදු අය කිරීමේ සිරස් හා තිරස් සාධාරණත්වය අතර වෙනස පිළිබඳව ය. නමුත් වැඩි අපේක්ෂකයින් පිරිසකට සිරස් සාධාරණත්වය හා තිරස් සාධාරණත්වය අතර වෙනස නිවැරදිව විග්‍රහ කිරීමට හැකියාව නො තිබුණි. ඇතැම් අපේක්ෂකයින් මෙම සංකල්පවල අර්ථ මාරු කර පිළිතුරු සැපයීමද පිළිතුරු අසාර්ථක වීමට හේතු විය.

- (iv) කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 24%ක් නිවැරදිව පිළිතුරු ලබා දී තිබුණි. ගැටලුව මගින් විමසා තිබුණේ අයවැය හිඟය වෙළෙඳපොළ පොලී අනුපාතිකය ඉහළ යාමටත් පෞද්ගලික ආයෝජන පහළ යාමටත් ඒ ඔස්සේ තෙරපුම් ප්‍රතිවිපාකය ක්‍රියාත්මක වන ආකාරයත් පිළිබඳව ය. අපේක්ෂකයින් ඉතා ඉහළ ප්‍රතිශතයක් අයවැය හිඟය රාජ්‍ය ඉතුරුම් පහළ යාමටත් ඒ ඔස්සේ ජාතික ඉතුරුම් පහළ යාමටත් හේතු වන බව නිවැරදිව විග්‍රහ කර නො තිබුණි. මෙහි පැවති ප්‍රධාන දුර්වලතාව වූයේ රාජ්‍ය ඉතුරුම් පහළ යාම මුදල් වෙළෙඳපොළෙහි ඉතුරුම් සැපයුම් අඩු වීම, මූර්ත පොලී අනුපාතිකය ඉහළ යාම මගින් පෞද්ගලික ආයෝජන පහළ වැටෙන බව තාර්කිකව සඳහන් කර නො තිබීමය. පොලී අනුපාතිකය ඉහළ නැගීමට හා රජය ණය ගැනීම නිසා පෞද්ගලික ආයෝජන සීමා වීම තෙරපුම් ප්‍රතිවිපාකය ලෙස සඳහන් නො කිරීමද පිළිතුරු අසාර්ථක වීමට හේතු විය.

- (v) කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් නිවැරදි පිළිතුරු සපයා තිබුණේ 20%ක් පමණි. උක්ත ගැටලුව මගින් විමසා තිබුණේ රාජ්‍ය ණය, මැදි හා දිගු කාලීනව තිරසාර මට්ටමක පවත්වා ගැනීම සහතික කිරීමට රජය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳව ය. රාජ්‍ය ණය, මැදි හා දිගු කාලීනව තිරසාර මට්ටමක පවත්වා ගැනීම සහතික කිරීම සඳහා රජය මෑත කාලීනව ගත් ක්‍රියා මාර්ග සුවිශේෂ ලෙස සඳහන් කිරීමට අපොහොසත් වීම පිළිතුරු අසාර්ථක වීමට හේතු විය. විශේෂයෙන් රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට, රාජ්‍ය වියදම තාර්කිකකරණයට හා අයවැය හිඟය අඩු කිරීමට ගත් මෑත කාලීන ක්‍රියා මාර්ග සඳහන් කිරීමට සිසුන් තුළ දැනුම සංවර්ධනය කළ යුතුය.

08 ප්‍රශ්නය

8. (i) A රට උරුම කරගත් ශ්‍රම සම්පත් ප්‍රමාණය ඒකක 200ක් ද, B රට උරුම කරගත් ශ්‍රම සම්පත් ප්‍රමාණය ඒකක 200ක් ද වේ යැයි සලකන්න. එක් එක් රටෙහි X සහ Y යන භාණ්ඩ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කරන ශ්‍රම ඒකක ප්‍රමාණ පහත සඳහන් වගුවේ දැක්වේ.

A රට		B රට	
භාණ්ඩය	**ශ්‍රම ඒකක**	**භාණ්ඩය**	**ශ්‍රම ඒකක**
X	5	X	4
Y	4	Y	8

(අ) එක් එක් රට සඳහා නිෂ්පාදන හැකියා වක්‍ර වෙන් වෙන්ව ඇඳ, ඒවා නිවැරදිව නම් කරන්න. (ලකුණු 04යි)

(ආ) එක් එක් රටට කවර භාණ්ඩයක් සඳහා නිරපේක්ෂ වාසි තිබේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ඉ) එක් එක් රටට කවර භාණ්ඩයක් සඳහා සාපේක්ෂ වාසි තිබේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ii) සාපේක්ෂ වාසි බිහි කෙරෙන ඕනෑම මූලාශ්‍ර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(iii) ගෙවුම් ශේෂ ලේඛනයක ජංගම ගිණුමෙහි ප්‍රධාන සංරචක නම් කරන්න. (ලකුණු 02යි)

(iv) නාමික විනිමය අනුපාතිකය සහ සඵල විනිමය අනුපාතිකය අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(v) නිදහස් වෙළෙඳාමට පක්ෂව ඉදිරිපත් කෙරෙන තර්ක මොනවා ද? (ලකුණු 04යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

08. (i) (අ)





(ලකුණු 02 යි) **(ලකුණු 02 යි)**

(ආ) - A රටට Y භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ දී නිරපේක්ෂ වාසියක් පවතී. මක්නිසාදයත් Y භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ නිරපේක්ෂ පිරිවැය B රටට වඩා A රටෙහි අඩුය.

(ලකුණු 01 යි)

- B රටට X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේදී නිරපේක්ෂ වාසියක් පවතී. මක්නිසාද යත් X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ නිරපේක්ෂ පිරිවැය A රටට වඩා B රටෙහි අඩුය.

(ලකුණු 01 යි)

(i) A රටට Y භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ දී සාපේක්ෂ වාසියක් පවතී. මක්නිසාදයත් A රටෙහි Y භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය B රටට වඩා අඩුය.

A රටෙහි X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය $= \frac{5}{4} = 1.25$

A රටෙහි Y භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය $= \frac{4}{5} = 0.8$

(ලකුණු 01 යි)

B රටට X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ දී සාපේක්ෂ වාසියක් පවතී. මක්නිසාද යත් B රටෙහි X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය A රටට වඩා අඩුය.

B රටෙහි X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය $= \frac{4}{8} = 0.5$

B රටෙහි Y භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය $= \frac{8}{4} = 2.0$

(ii) සාපේක්ෂ වාසි මූලාශ්‍ර

- සම්පත් උරුමය
- තාක්ෂණය
- විශේෂ ප්‍රාගුණ්‍යනය (ශ්‍රම ඵලදායිතාව)
- අභිරුචිය
- ස්ථානගත වීම (පිහිටීම)
- ආරම්භක තත්වය (first mover advantage)
- පරිමාණානුකූල ඵල
- රටවල විශාලත්වයේ වෙනස්කම්
- පර්යේෂණ හා සංවර්ධනය සඳහා කෙරෙන ආයෝජන
- රාජ්‍ය ප්‍රතිපත්ති

(එක් කරුණකට ලකුණු 01 බැගින්
ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි)

(iii) ජංගම ගිණුමේ ප්‍රධාන සංරචක

- භාණ්ඩ හා සේවා ගිණුම
- ප්‍රාථමික ආදායම් ගිණුම
- ද්විතියික ආදායම් ගිණුම (ලකුණු 02 යි)

(සංරචක තුනම දක්වා නොමැතිනම් ලකුණු නොලැබේ)

(iv) - එක් මුදල් වර්ගයක මිල තවත් මුදල් වර්ගයකින් ප්‍රකාශ කිරීම නාමික විනිමය අනුපාතිකය වේ.

(ලකුණු 01 යි)

- නාමික විනිමය අනුපාතිකය දෙයාකාරයකින් ප්‍රකාශ කෙරේ.
  (අ) විදේශ මුදල් ඒකකයක මිල දේශීය මුදල් ඒකකවලින් දැක්වීම (සෘජු කියවීම)

(ආ) දේශීය මුදල් ඒකකයක මිල විදේශ මුදල් ඒකකවලින් දැක්වීම (වක්‍ර කියවීම)

(ලකුණු 01 යි)

- සඵල විනිමය අනුපාතිකය යනු කිසියම් මුදල් ඒකකයක අගය තවත් මුදල් වර්ග රාශියක බරතබන ලද සාමාන්‍ය අගයකට සාපේක්ෂව ප්‍රකාශ කිරීමය. එය ප්‍රකාශ කරනුයේ දර්ශක අංකයක් වශයෙනි. බර තැබීම සඳහා යොදා ගැනෙන මුදල් ඒකක සමන්විත වනුයේ, සලකා බලන රටෙහි වෙළඳහවුල්කාරී සහ වෙළෙඳ තරගකාරී රටවල මුදල් ඒකකවලිනි.

(ලකුණු 01 යි)

- සඵල විනිමය අනුපාතිකයන්ගේ ස්වරූප දෙකකි එනම් නාමික සඵල විනිමය අනුපාතිකය සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය වශයෙනි.

(ලකුණු 01 යි)

(v) **නිදහස් වෙළෙඳාමට පක්ෂව නැගෙන තර්ක**

- නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව ඉහළ නගී. විදේශීය තරගයට මුහුණ දීම නිසා දේශීය නිෂ්පාදන ආයතන පිරිවැය අඩු කරගැනීමට සහ කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමට උත්සාහ කරයි.
- විශේෂ ප්‍රාගුණ්‍යනය කිරීමට අවස්ථාව සැලසේ. එමගින් ඵලදායිතාව ඉහළ නංවාගත හැකිවේ.
- විශේෂීකරණය නිසා පාරිභෝගිකයන්ට අඩු මිලට භාණ්ඩ මිලදී ගැනීමට අවස්ථාව සැලැසේ.
- තාක්ෂණය හුවමාරු කරගැනීමට ඉඩ ලැබේ.
- විවෘත වෙළෙඳාම නිසා රටවල ආර්ථික වෘද්ධිය වේගවත්වී ඇති බවට ප්‍රත්‍යමූල සාක්ෂි ඇත. ප්‍රතිශීර්ෂ ආදායම ඉහළ නංවාගැනීමට හා නිරපේක්ෂ දරිද්‍රතාව අඩුකරගැනීමට එය ඉවහල් වේ.
- අබාධ වෙළෙඳාම නිසා වෙළෙඳාමට සහභාගීවන දෙපාර්ශ්වයටම අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වේ.
- අබාධ වෙළෙඳ ප්‍රතිපත්ති නිසා ගෝලීය වෙළෙඳපොළෙහි තරගකාරීත්වයක් බිහි කොට තිබෙන බැවින්, එහි ප්‍රතිඵල වශයෙන් ගුණාත්මක තත්ත්වයෙන් උසස් නවෝත්පාදන ලබා ගත හැකි වන අතර, ඉහළ වැටුප් සහිත රැකියා, අළුත් වෙළෙඳපොළවල්, ඉතුරුම් හා ආයොජන ඉහළ යාම් දක්නට ලැබේ.
- තම රටවල නිපදවාගත නොහැකි භාණ්ඩ, අත්කර ගැනීමට අබාධ වෙළෙඳාම නිසා සෑම රටකටම අවස්ථාව උදාවේ.
- සාපේක්ෂ පිරිවැය පදනම් කරගත් වෙළෙඳාම කරනකොට, සමස්ත නිෂ්පාදන ප්‍රමාණයත් පරිභෝජන ප්‍රමාණයත් ඉහළ යනු ලැබේ.
- ජාත්‍යන්තර වෙළෙඳාම නිසා, අළුත් අදහස් සහ සංකල්ප (නව්‍යතා, බුද්ධිමය දේපොළ) ගෝලීය වශයෙන් විකාශනය වේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින්
ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

8 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



8 ප්‍රශ්නයට අපේක්ෂකයන්ගෙන් 49%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 33%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 31%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 25%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 11%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 5ක් ඇති අතර (i) "ආ" කොටස වඩාත් ම පහසු වී ඇත. එහි පහසුතාව 71%කි. පහසුතාව අඩු ම කොටස iv වී ඇත. එහි පහසුතාව 17%කි.

- 8 වන ප්‍රශ්නයේ (i) කොටසේ "අ" අනු කොටස සඳහා අපේක්ෂකයින් අතරෙන් 23%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. අනු කොටස මගින් විමසා තිබුණේ දෙන ලද සංඛ්‍යා තොරතුරු ඇසුරෙන් A හා B යන රටවල් දෙක සඳහා නිෂ්පාදන හැකියා මායිම් නිර්මාණය කිරීම පිළිබඳව ය. අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයකට නිවැරදි පිළිතුරු ලිවීමට නො හැකි වී ඇත්තේ ඒ ඒ රට සතු ශ්‍රම ඒකක ප්‍රමාණය උපරිම වශයෙන් එක් එක් භාණ්ඩ වර්ග නිපදවීම සඳහා යෙදවුවහොත් නිපදවිය හැකි X භාණ්ඩ උපරිම ප්‍රමාණය හා Y භාණ්ඩ උපරිම ප්‍රමාණය නිවැරදිව ගණනය කර ගැනීමට නො හැකි වීම නිසා ය. එබැවින් රටවල් සතු ශ්‍රම ඒකක ප්‍රමාණය හා ඒ ඒ භාණ්ඩ වර්ග නිපදවීමට අවශ්‍ය ශ්‍රම අවශ්‍යතාව දී ඇති විට, ඒ ඒ රට සඳහා නිෂ්පාදන හැකියා මායිම් ඇඳීම සඳහා අභ්‍යාස ලබා දී සිසුන් තුළ දැනුම භාවිත කිරීමේ කුසලතාව වැඩි දියුණු කළ යුතුයි. **ප්‍රශ්නය ඉදිරිපත් කිරීමේදී දත්ත ලබා දී ඇත්තේ සම්පත් ඒකකයක නිමැවුම් හැකියාවද, නැතහොත් නිමැවුම් ඒකකයක පිරිවැයද යන්න පිළිබඳවද සැලකිළිමත් වීමට සිසුන් යොමු කළ යුතුය.**
- (i) කොටසේ "ආ" අනු කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 71%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. අදාළ අනු කොටස මගින් විමසා තිබුණේ දෙන ලද දත්ත භාවිත කර ඒ ඒ රටට නිරපේක්ෂ වාසි පවතින භාණ්ඩ වර්ග නම් කිරීම පිළිබඳව ය. අපේක්ෂකයින් සැළකිය යුතු ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සැපයීම මගින් අනාවරණය වූයේ අදාළ සිද්ධාන්තය පිළිබඳ දැනුම භාවිත කිරීමේ කුසලතාව අපේක්ෂකයින් වැඩි දෙනෙකුට පැවති බවයි.
- (i) කොටසේ "ඉ" අනු කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 60%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. අදාළ අනු කොටස මගින් විමසා තිබුණේ දෙන ලද දත්ත ඇසුරු කොටගෙන එක් එක් රටට සාපේක්ෂ වාසි සහිත භාණ්ඩ වර්ගය කුමක්ද යන්න පිළිබඳව ය. අපේක්ෂකයින් අතුරෙන් 40% ක ගේ පමණ පිළිතුරු අසාර්ථක වී ඇත්තේ ඒ ඒ භාණ්ඩ වර්ගය නිපදවීමේ ආවස්ථික පිරිවැය නිවැරදිව ගණනය කර ගැනීමට නො හැකි වූ බැවිනි. එබැවින් යෙදවුම් ඇසුරෙන් ආවස්ථික පිරිවැය ගණනය කොට සාපේක්ෂ වාසි සහිත නිෂ්පාදිත හඳුන්වාදීමට සිසුන් තුළ දැනුම භාවිතය සම්බන්ධ කුසලතාව ප්‍රවර්ධනය කළ යුතුය. **ප්‍රශ්නයේ දී ඇති වගන්ති කෙරෙහි අවධානය යොමු නො වීම නිසා යෙදවුම් පිරිවැය ඇසුරෙන් ආවස්ථික පිරිවැය ගණනය කරනු වෙනුවට නිමැවුම් හැකියාව ඇසුරෙන් ආවස්ථික පිරිවැය ගණනය කිරීම බොහෝ පිළිතුරු අසාර්ථක වීමට හේතුවයි.**
- (ii) කොටස සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින් අතුරෙන් 59%ක් පමණි. ගැටලුව මගින් විමසා තිබුණේ සාපේක්ෂ වාසි බිහි කෙරෙන මූලාශ්‍ර පිළිබඳව ය. අපේක්ෂකයින් අතරින් 41% ක් පමණ ප්‍රතිශතයක් වැරදි පිළිතුරු සැපයීමට හේතු වී තිබුණේ සාපේක්ෂ වාසි බිහි කෙරෙන මූලාශ්‍ර නිශ්චිතව දැක්වීමේ දැනුම ලබා නො තිබීම නිසාය. මේනිසා සාපේක්ෂ වාසි මූලාශ්‍ර පිළිබඳ අවබෝධයක් සිසුන්ට ලබා දීම වැදගත් වේ.
- (iii) කොටස සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින් අතුරෙන් 63%ක් පමණි. මෙම කොටස මගින් විමසා තිබුණේ ගෙවුම් ශේෂ ලේඛනයේ ජංගම ගිණුමේ ප්‍රධාන සංරචක පිළිබඳව ය. අයවැය ලේඛනයේ ජංගම ගිණුමේ සංරචක හා ගෙවුම් ශේෂ ලේඛනයේ ජංගම ගිණුමේ සංරචක වෙන් කොට හඳුනාගෙන නො තිබීම අපේක්ෂකයින් බොහෝ දෙනෙකු තුළ තිබූ දුර්වලතාවකි. එසේ ම ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ වුව ද සංරචක හතර ම ඉදිරිපත් කළ නො හැකි වීම තවත් දුර්වලතාවකි.
- (iv) වන කොටස සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින් අතුරෙන් 17%ක් වැනි සුළු ප්‍රතිශතයකි. මේ මගින් නාමික විනිමය අනුපාතිකය හා සඵල විනිමය අනුපාතිකය අතර වෙනස විමසා ඇත. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී විනිමය අනුපාතික දෙක සඳහා නිර්වචන පමණක් දක්වා තිබීම ලකුණු අඩු වීමට ප්‍රබල හේතුවකි. එසේ ම නාමික විනිමය අනුපාතිකය ඉදිරිපත් කළ හැකි ඍජු හා වක්‍ර කියවීම් පිළිබඳව බොහෝ අපේක්ෂකයින් සඳහන් කර නො තිබීමත් විශේෂයෙන් ම සඵල විනිමය අනුපාතිකයේ ස්වරූප දෙක සඳහන් කර නො තිබීමත් නිසා මුළු ලකුණු ලබා ගැනීමට අපොහොසත් වී ඇත.
- (v) වන කොටස සඳහා අපේක්ෂකයින් 47%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. අදාළ කොටස මගින් විමසා ඇත්තේ නිදහස් වෙළෙඳාමට පක්ෂව ඉදිරිපත් කරන තර්ක පිළිබඳව ය. අපේක්ෂකයින් බහුතරයක් නිදහස් වෙළෙඳාම මගින් රටකට ලැබෙන වාසි පෙන්වා දීමට අසමත් වී ඇත. එබැවින් විදේශ වෙළෙඳාම මගින් රටකට ලැබෙන වාසි විග්‍රහ කිරීමටත්,නිදහස් වෙළෙඳාමේ හා ආරක්ෂණවාදී වෙළෙඳාමේ වාසි අවාසි විග්‍රහ කිරීමටත් සිසුන්ගේ දැනුම සංවර්ධනය කළ යුතුයි.

09 ප්‍රශ්නය

9. (i) 'ආර්ථික වෘද්ධිය' නිර්වචනය කොට, ආර්ථික වෘද්ධියේ ඉතා වැදගත් මූලාශ්‍ර සඳහන් කරන්න. (ලකුණු 05යි)

(ii) දිළිඳුකම තුරන් කිරීම සඳහා ආර්ථික වෘද්ධිය ප්‍රමාණවත් කොන්දේසියක් වේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iii) 'තිරසාර සංවර්ධනය' යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05යි)

(iv) ස්ත්‍රී ශ්‍රම හමුදා සහභාගිත්වය ඉහළ යාම, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වැදගත් වන්නේ ඇයි? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

9 (i) - ආර්ථික වෘද්ධිය යනු රටක නිෂ්පාදන ධාරිතාව හෙවත් විභව නිමැවුම ඉහළයාමක් වන අතර, කාලයක් තිස්සේ මූර්ත ජාතික නිෂ්පාදිතයේ සහ ආදායමේ සිදුවන අඛණ්ඩ වැඩිවීමක් මගින් එය හඳුනාගත හැකිය. **(ලකුණු 02 යි)**

- සම්පත් සම්භාරය ඉහළයාම : භෞතික ප්‍රාග්ධනය, ස්වාභාවික ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය සහ සමාජ ප්‍රාග්ධනය වැඩිවීම.

- **ඵලදායිතාව ඉහළයාම : තාක්ෂණික දියුණුව, නව්‍යතාවන් බිහිවීම, පර්යේෂණ සහ සංවර්ධනය සඳහා කෙරෙන ආයෝජන ඉහළ යාම, කළමනාකරණය උසස් වීම.**

- **ආර්ථික ස්ථායිතාව (මූලික සාර්ව ආර්ථික කොන්දේසි - Macroeconomic fundamentals හිතකර තත්ත්වයක පැවැතීම.)**

- **ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය වීම.**

- **අබාධ වෙළෙඳාම සහ ආයෝජනය**

- **සානුබල (ප්‍රෝත්සාහන) පැවැතීම.**

- **දේශපාලන හා සමාජයීය ස්ථාවරත්වය**

- **යහපාලනය තහවුරු වීම.**

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03 යි)

(ii) - ආර්ථික වෘද්ධිය, දරිද්‍රතාව දුරැලීමේ ඉතා ප්‍රබල බලවේගයක් ලෙස ලොවපුරා පිළිගැනේ.

- වෘද්ධි ක්‍රියාවලිය නිසා සමාජයට ආර්ථික සෞභාග්‍යය සහ ආර්ථික අවස්ථා (opportunities) බිහිකෙරේ. රැකියා අවස්ථා පුළුල් වීමත් ආදායම් මට්ටම් ප්‍රසාරණය වීමත් නිසා තම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීමට දෙමාපියනට විශාල හැකියාවක් ලැබේ.

- කෙසේ වෙතත් විවිධ සමාජ ආර්ථික පරිසරයක් තුළ, ආර්ථික වෘද්ධිය දරිද්‍රතාව මත ඇති කරනු ලබන බලපෑම් වෙනස් විය හැකිය. වෘද්ධිය කෙතෙක් දුරට දරිද්‍රතාව අඩුකිරීමට දායකවන්නේද යන්න රඳා පවතිනුයේ, වෘද්ධියේ ප්‍රතිලාභ භුක්ති විඳීමට දිළිඳු ජනකොටස්වලට අවස්ථාව සැලසේද යන්න මතය. වෘද්ධි ක්‍රියාවලියට දිළිඳු ජන කොටස් කොතෙක් දුරට සහභාගීවන්නේ ද යන්න මතය. මෙනිසා නුදෙක් ආර්ථික වෘද්ධියේ ප්‍රමාණය පමණක් නොව වෘද්ධියේ රටාවද මෙහි දී වැදගත් වේ.

- වෘද්ධි ක්‍රියාවලිය බොහෝ අවස්ථාවන්හි දී ආදායම් විෂමතා වර්ධනය කිරීමට දායක වී තිබේ. එවැනි තත්ත්වයක දී දිළිඳුකම දුරලීමට වෘද්ධියට කළහැකි බලපෑම සීමාවනු ඇත.

- දිළිඳුකම දුරලීමේ දී ආර්ථික වෘද්ධිය ඉතා තීරණාත්මක විචල්‍යයක් වුවද, වෘද්ධිය තුළින් දිළින්දන්ට ප්‍රතිලාභ සැලසෙන ආකාරයේ ඌනපූරණ ප්‍රතිපත්ති ඒ සමග ක්‍රියාවට නොනැගුවහොත්, දිළිඳුකම අඩුකිරීමට වෘද්ධි ක්‍රියාවලිය අසමත් වනු ඇත.

- වෘද්ධි ප්‍රවර්ධන ප්‍රතිපත්ති සමග, දිළින්දන් ද වෘද්ධි ක්‍රියාවලියට සම්බන්ධ කෙරෙන ප්‍රතිපත්ති හඳුන්වාදිය යුතු වේ. උදාහරණ වශයෙන් ශ්‍රම වෙළෙඳපොළ වඩාත් කාර්යක්ෂම කිරීම, ස්ත්‍රී-පුරුෂ වශයෙන් වෙනස්කම් හා විෂමතාවන් ඉවත් කිරීම, මූල්‍ය පහසුකම් සඳහා අවස්ථා සියල්ලන්ටම විවෘත වීම මෙහිදී වැදගත් වේ.

- වෘද්ධි ක්‍රියාවලි සාර්ව සහභාගීත්ව වෘද්ධි ක්‍රියාවලියක් නොවූවහොත්, වෘද්ධියේ ප්‍රතිලාභ අඩු ආදායම් සහිත ජන කොටස්වලට ගලා නොයයි.

(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 05 යි)

(iii) - තිරසාර සංවර්ධනය යන්නෙන් අදහස් කරනුයේ වර්තමාන පරපුර තම අවශ්‍යතා සපුරාගත යුත්තේ අනාගත පරම්පරාවලට ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීම ඇති හැකියාව කැප නොකරමින් බවයි.

(ලකුණු 02 යි)

- තිරසාර සංවර්ධනයේ හරය වශයෙන් පවතිනුයේ තීරණ ගැනීමේ දී ප්‍රධාන ස්තම්භ තුනක් එක්වර සැලකිල්ලට ගත යුතු බවයි. එනම් සමාජය, ආර්ථිකය සහ පරිසරයයි.

(ලකුණු 02 යි)

- සමාජය, ආර්ථිකය සහ පරිසරය ඉතා කිට්ටුවෙන් එකිනෙකට බැඳී පවත්නා බැවින් තීරණ ගත යුත්තේ ඒවා අතර සමබරතාවක් පවත්වාගැනීමට හැකිවන පරිදිය.

- සංවර්ධනය තිරසාර වනුයේ මෙම අංශ අතර මනා සම්බන්ධයක් හා සමබරතාවක් තිබුණහොත් පමණි. එක් අංශයක් පසෙකට ලා තවත් අංශයක් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමෙන්, සමස්ත සංවර්ධන ක්‍රියාවලියම පසුබෑමකට ලක්වනු ඇත.

(ලකුණු 01 යි)

(iv) - අධ්‍යාපනය හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හි ස්ත්‍රී-පුරුෂ සමතාව ඉහළ නැංවීමෙහිලා කලාපය තුළ පුරෝගාමී කාර්යභාරයක් ශ්‍රී ලංකාව විසින් ඉටුකොට තිබුණද කාන්තාවන්ගේ ශ්‍රම හමුදා සහභාගීත්වය තුළ එම ලක්ෂණය පිළිබිඹු නොවේ. සෙසු නැගී එන ආර්ථිකයන් සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල තත්ත්වය සමග සසඳන විට, ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම හමුදා සහභාගීත්වය ඉතා පහළ මට්ටමක පවතී. 2017 දී ස්ත්‍රී ශ්‍රම හමුදා සහභාගීත්ව අනුපාතිකය 37%ක් වූ අතර, පුරුෂයන්ගේ ශ්‍රම හමුදා සහභාගීත්වය 75%ක් විය.

- ජනගහනය වියපත් වීමේ ප්‍රශ්නයට දැඩිව මුහුණ පා සිටින ශ්‍රී ලංකාව වැනි රටක ස්ත්‍රී ශ්‍රම හමුදා සහභාගීත්වය ඉහළ නැංවීම අතිශයින් වැදගත් වේ. 2026 තරම් මෑත වර්ෂයක පටන් ශ්‍රී ලංකාවේ ශ්‍රම හමුදාවේ ප්‍රමාණය සංකෝචනය වීමට පටන් ගන්නා බව ප්‍රජා විද්‍යාත්මක පුරෝකථන පෙන්නුම් කරයි. අනිකුත් කරුණු නොවෙනස්ව තිබියදී ජනගහනයෙන් ශ්‍රම හමුදාවට ප්‍රවේශවන පිරිස කුඩාවන විට, මූර්ත ප්‍රතිශීර්ෂ ආදායම් වර්ධනය පහළ වැටෙනු ඇත. උසස් පෙළ හෝ ඊට අඩු සුදුසුකම් සහිත අධ්‍යාපනයක් ලැබූ කාන්තා පිරිස, ශ්‍රම හමුදාව තුළට අන්තර්ග්‍රහණය කරගැනීමට හැකියාවක් ඇත්නම් මේ ප්‍රවණතාව ආපස්සට හැරවිය හැකිය.

- ශ්‍රම වෙළෙඳපොළේ ස්ත්‍රී-පුරුෂ පරතරය දැඩිව පැවැතීම නිසා ශ්‍රී ලංකාව වාර්ෂිකව සැලකිය යුතු ආදායම් ප්‍රමාණයක් අහිමිකර ගන්නා බව පර්යේෂණ පෙන්නුම් කරයි. සේවා නියුක්තිය, ස්වයංරැකියා, ශ්‍රම බලකා සහභාගීත්වය සහ වැටුප් සම්බන්ධයෙන් දැරිය හැකි ස්ත්‍රී-පුරුෂ පරතරය හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ප්‍රතිශීර්ෂ ආදායමෙන් 20% ක් අහිමිවන බව ලෝක බැංකුව පෙන්වා දෙයි.

- ශ්‍රම හමුදා සහභාගීත්වයෙහි දැකිය හැකි ස්ත්‍රී-පුරුෂ පරතරය අඩුකිරීම මගින් ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ අහිතකර බලපෑම්වලින් ආරක්ෂා වීමට ද හැකියාවක් පවතී. ලෝක බැංකු පුරෝකථනයන්ට අනුව සෑම පුද්ගලයන් සිව් දෙනෙකුගෙන් කෙනෙකු වයස අවුරුදු 60ට වැඩි වීමත් සමග, අනාගතයේ දී යැපුම් අනුපාතය ඉහළ යතියි අපේක්ෂා කෙරේ. අඩු පුද්ගල සංඛ්‍යාවකගේ ආදායම වැඩි යැපෙන්නන් සංඛ්‍යාවක් සඳහා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දරිද්‍රතා ගැටලුව ද බරපතළ විය හැකිය. එබැවින් ස්ත්‍රී ශ්‍රම හමුදා දායකත්වය ඉහළ නැංවීම මෙම තත්ත්වය තුළ ඉතා වැදගත් කරුණක් වේ.

(එක් කරුණකට ලකුණු 02 බැගින්
ඕනෑම කරුණු තුනකට ලකුණු 05 යි)

9 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



9 ප්‍රශ්නයට අපේක්ෂකයන්ගෙන් 36%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 64%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 25%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 8%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 3%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 4ක් ඇති අතර (i) කොටස වඩාත් ම පහසු වී ඇත. එහි පහසුතාව 34%කි. පහසුතාව අඩු ම කොටස (iv) කොටස වී ඇත. එම කොටසේ පහසුතාව 13%කි.

- 9 ප්‍රශ්නයේ (i) කොටස සඳහා අපේක්ෂකයින් අතුරෙන් 34%ක් පමණක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. ආර්ථික වෘද්ධිය නිර්වචනය කිරීම හා ආර්ථික වෘද්ධියේ මූලාශ්‍ර පිළිබඳව විමසා ඇති මෙම කොටස සඳහා නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇත්තේ ආර්ථික වෘද්ධිය යනු විභව නිෂ්පාදන හැකියාව අඛණ්ඩව වර්ධනය වීම බව දැක්වීමටත්, වෘද්ධියේ මූලාශ්‍ර පුළුල් ලෙස පෙළගස්වා ඉදිරිපත් කිරීමටත් නො හැකි වීම නිසා ය.

- (ii) කොටස සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින් අතුරෙන් 18%ක් පමණි. අදාළ කොටස මගින් විමසා තිබුණේ දිළිඳුකම තුරන් කිරීම සඳහා ආර්ථික වෘද්ධිය පමණක් ප්‍රමාණවත් වේද යන්නය. අපේක්ෂකයින්ගෙන් 82% ක් වැනි විශාල ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වූයේ ආර්ථික වෘද්ධියේ ප්‍රතිලාභ දරිද්‍රතාව පහළ යාමට බලපාන ආකාරය සම්බන්ධ කොට ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හේතුවෙනි. විශේෂයෙන් ඇතැම් අවස්ථාවලදී ආර්ථික වෘද්ධිය ආදායම් විෂමතාව වර්ධනය වීමටද හේතුවන බව අපේක්ෂකයින් සඳහන් කර නො තිබිණි. ආර්ථික වෘද්ධියේ ප්‍රතිලාභ එනම් සේවා නියුක්තිය ඉහළ නැගීම, ආදායම් ප්‍රසාරණය, ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාම වැනි සාධක නිසා දරිද්‍රතාව පහළ යන බව සිසුන් වෙත අවබෝධ කර දිය යුතුය. ආර්ථික වෘද්ධිය දිළිඳු ජනතාවට වඩාත් හිතෛෂී විය යුතු බවත් සර්ව සහභාගිත්ව පදනමකින් වෘද්ධි ක්‍රියාවලිය සංවිධානය වීම දරිද්‍රතාව පහළ යාමට හේතුවන බවත් අවධාරණය කළ යුතුය.

- (iii) වන කොටසට නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින් අතුරෙන් 24%ක් පමණි. අදාළ කොටස මගින් විමසා ඇත්තේ තිරසාර සංවර්ධනය යන්නෙන් කවරක් අදහස් වන්නේද යන්නය. අපේක්ෂකයින් ඉහළ ප්‍රතිශතයක් සාර්ථක ලෙස පිළිතුරු සැපයීමට අසමත් වීම කෙරෙහි තිරසාර සංවර්ධනය යන සංකල්පය නිවැරදි ලෙස අර්ථ දැක්වීමට අපොහොසත් වීම හා තිරසාර සංවර්ධනයේ ප්‍රධාන ස්ථම්භ නිවැරදිව නො දක්වා තිබීම හේතු වී ඇත. සංවර්ධනය, මානව සංවර්ධනය, තිරසාර සංවර්ධනය ආදී සංකල්ප වෙන් වෙන්ව නිර්වචනය කිරීමටත් තිරසාර සංවර්ධනයේ පැතිකඩ සඳහන් කිරීමටත්, සංවර්ධනය සඳහා හේතුවන සාධක වෙන් වෙන්ව හඳුනා ගැනීමටත් හැකි වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

- (iv) වන කොටස සඳහා නිවැරදිව පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින් අතුරෙන් 13%ක් වැනි සුළු ප්‍රතිශතයකි. මෙම කොටස මගින් විමසා තිබුණේ ස්ත්‍රී ශ්‍රම හමුදා සහභාගීත්වය ඉහළ යාම ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වැදගත් වන්නේ කෙසේද යන්නයි.

  අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වූයේ මෑත කාලීන ස්ත්‍රී ශ්‍රම හමුදා සහභාගිත්වය සාපේක්ෂව අඩු බවට සංඛ්‍යා දත්ත ඉදිරිපත් නො කිරීම, ස්ත්‍රී ශ්‍රම හමුදා සහභාගිත්වය පහළ යාම නිසා ශ්‍රම හමුදාවේ ප්‍රමාණය සංකෝචනය වන බව නො දැක්වීම, ශ්‍රම හමුදා සහභාගිත්වයෙහි ස්ත්‍රී පුරුෂ පරතරය අඩු කිරීම මගින් ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ අහිතකර බලපෑම්වලින් ආරක්ෂා වීමට හැකි බව සඳහන් නො කිරීම ආදී හේතු නිසාවෙනි. ජනගහණය හා සේවා නියුක්තිය පිළිබඳව කාලීන විග්‍රහයන් ඇතුළත් මූලාශ්‍ර (මහ බැංකු වාර්තා, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු වාර්තා) පරිශීලනය කිරීමට යොමු වීමෙන් මෙවැනි ප්‍රශ්නවලට සාර්ථකව පිළිතුරු සැපයිය හැකි වේ.

10 ප්‍රශ්නය

10. (i) ගෝලීය වෙළෙඳපොළ තුළ, ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය ඉහළ නැංවීමෙහි ලා යෝග්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 05යි)

(ii) 2002 - 2016 කාලපරිච්ඡේදය තුළ, ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ සහ ආදායම් විෂමතාවයේ උපනති පරීක්ෂා කරන්න. (ලකුණු 05යි)

(iii) 1977 දී ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබූ ආර්ථික නිර්බාධිකරණ ප්‍රතිසංස්කරණවල ප්‍රධාන අංග වූයේ කවර ඒවා ද? (ලකුණු 05යි)

(iv) තිරසාර හා වේගවත් ආර්ථික වෘද්ධියක් අත්කර ගැනීමෙහි ලා ශ්‍රී ලංකාව විසින් ජය ගත යුතු ප්‍රධාන අභියෝග කවරේ ද? (ලකුණු 05යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

10. (i)

- ස්ථාවර ජාතික සංවර්ධන ප්‍රතිපත්තියක අවශ්‍යතාව :
  දේශපාලන පක්ෂවල න්‍යාය පත්‍ර අනුව කලින් කලට වෙනස් නොවන, ස්ථාවර භාවයෙන් හා විනිවිද භාවයෙන් යුතු, දිගුකාලීන ජාතික සංවර්ධන ප්‍රතිපත්තියක් සකසා ක්‍රියාත්මක කළ යුතුවේ.

- යටිතල පහසුකම්වල ගුණාත්මක භාවය ඉහළ නැංවිය යුතුය. (උදා : විදුලි බලය)

- නිලධාරිවාදී සීමා කිරීම් අඩුකොට පෞද්ගලික අංශය වෙත පහසුකම් සැපයීම කාර්යක්ෂම කළ යුතුය. කලාපීය රටවල් සමග සසඳන විට, නව ව්‍යාපාර ඇරඹීමේ දී, ගිවිසුම් බලගැන්වීමේ දී, දේපොළ ලියාපදිංචි කිරීමේ දී සහ ණය ලබා ගැනීමේ දී පවතින අධික නිලධාරිවාදී ක්‍රියාපටිපාටි හේතුවෙන් ව්‍යාපාර පවත්වාගෙන යාමේ දර්ශකය තුළ ශ්‍රී ලංකාව දැඩි පහසුබෑමකට ලක්ව සිටී.

- පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයත් නවෝත්පාදකයනුත් දිරිගැන්විය යුතුය. ගෝලීය තරගකරුවන් අතර ශ්‍රී ලංකාවේ තරගකාරීත්වය ඉහළ නැංවීම පිණිස ආර්ථිකය නවීකරණය කිරීම් ක්‍රියාවලියක් සඳහා ප්‍රතිපත්ති සකසා ගත යුතුවේ.

- සාර්ව ආර්ථික ස්ථායිතාව වැඩි දියුණු කළ යුතුය. මූර්ත විනිමය අනුපාතිකය අධි ප්‍රමාණයවීම, අයවැය හිඟය පුළුල් වීම, ඉහළ රාජ්‍ය ණය අනුපාතය, ජංගම ගිණුමේ අඛණ්ඩ හිඟය වැනි කරුණු සාර්ව ආර්ථිකයේ දැඩි අස්ථාවරත්වයක් ඇති කරයි.

- ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීම : තාක්ෂණය හා අධ්‍යාපන නවීකරණය වැදගත් වේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 05 යි)

(ii) **2002 - 2016 කාලපරිච්ඡේදය තුළ දරිද්‍රතාවේ සහ ආදායම් විෂමතාවේ උපනති :**

දර්ශක	2002	2006/07	2009/10	2012/13	2016
ජනගහන දරිද්‍රතා දර්ශකය	22.7	15.2	8.9	6.7	4.1
කුටුම්බ මාසික ආදායමේ ගිනි සංගුණකය	0.48	0.49	0.49	0.48	0.45
ධනවත් 20% ආදායමෙන් හිමිකරගත් %	53.7%	54.7%	54.1%	52.9%	50.8%
දිළිඳු 20% ආදායමෙන් හිමිකරගත් %	4.8%	4.6%	4.5%	4.5%	4.8%

- 2002 - 2016 කාලය තුළ ජාතික දරිද්‍රතාව මටට්ම අඛණ්ඩ පහළ යාමක් පෙන්නුම් කරයි. **(ලකුණු 01 යි)**

- අඩු වශයෙන් වර්ෂ 2ක වත් දරිද්‍රතා දර්ශක දක්වා ඇත්නම් **(ලකුණු 02 යි)**

- 2010 වර්ෂයෙන් පසු ආදායම් විෂමතා මන්දගාමීව අඩුවීමක් පෙන්නුම් කොට ඇත.
(එක් වර්ෂයකවත් විෂමතා දර්ශක දක්වා ඇත්නම් ලකුණු 01)

(iii) ආර්ථික නිර්බාධකරණ ප්‍රතිසංස්කරණවල ප්‍රධාන අංග

- ආනයන මත පනවා තිබූ ප්‍රමාණාත්මක සීමා ඉවත්කොට ආනයන තීරුබදු ක්‍රමයක් හඳුන්වාදීම.

- විනිමය පාලනයන් ලිහිල් කිරීම සහ බහුවිධ විනිමය අනුපාතික වෙනුවට ඒකීය විනිමය අනුපාතිකයක් හඳුන්වාදීම.

- දේශීය මුදලේ විදේශ අගය වෙළෙඳපොළ බලවේග මත ප්‍රධාන වශයෙන් තීරණය වීමට ඉඩ හැරීම - පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක් හඳුන්වාදීම.

- විදේශ සංචාර, විදේශ අධ්‍යාපනය සහ ආනයන මත පනවා තිබූ සීමාවන් රැසක් ලිහිල් කිරීම.

- මිල පාලනයන් සහ නියාමනයන් සැලකිය යුතු ලෙස ඉවත් කිරීම.

- තිරිඟු පිටි, පොහොර, කිරි ආහාර වර්ග, ඛනිජ තෙල් නිෂ්පාදිත මත ලබා දුන් සහනාධාර අඩු කිරීම.

- විදේශ ප්‍රාග්ධනය ආකර්ශණය කරගනු පිණිස කොළඹ කොටස් වෙළෙඳපොළෙහි විදේශීය ආයෝජකයන් මත පනවා තිබූ සීමාවන් ලිහිල් කිරීම.

- ආයෝජන මණ්ඩලය (මහ කොළඹ ආර්ථික කොමිෂම) යටතේ විදේශ ආයෝජකයන් සඳහා ඉතා පුළුල් පහසුකම් සමූහයක් ලබාදීම.

- බැංකු පද්ධතිය තුළට ප්‍රවේශ වීම වළක්වමින් තිබූ සීමා ඉවත්කොට දේශීය හා විදේශීය බැංකුකරුවනට බැංකු ක්ෂේත්‍රය විවෘත කිරීම.

- පොලී අනුපාතික මත තිබූ පාලනයන් ඉවත් කිරීම.
(එක් කරුණකට ලකුණු 1 බැගින් ඕනෑම අංග පහකට ලකුණු 05 යි)

(iv) - ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධි ක්‍රියාවලියෙහි ව්‍යුහාත්මක අසමත්වීම් රැසක් පෙනෙන්නට තිබේ. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධිය හටගෙන තිබුනේ, රජය විසින් විශාල වශයෙන් වාණිජ ණය ලබා ගනිමින් ගොඩනගන ලද යටිතල පහසුකම් ඔස්සේ සිදු වූ වෙළෙඳ නොවන ක්ෂේත්‍රයන්හි ආර්ථික ක්‍රියාකාරකම් පදනම් කර ගනිමිනි. අඛණ්ඩ අයවැය හිඟය හා ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ හිඟය වැනි මූලික සාර්ව ආර්ථික පරාමිතීන්හි දුර්වලතාව ආයෝජක විශ්වාශණීයත්වය පලුදුවීමටත්, දේශීය හා විදේශීය ආයෝජන පහළ වැටීමටත් බලපෑවේය. මෙම ප්‍රවණතාවන් ආපස්සට හැරවීම තිරසාර ආර්ථික වෘද්ධිය මුහුණදෙන ප්‍රධාන අභියෝගයයි.

- ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ සාධනය අතිශය දුර්වල තත්ත්වයක පවතී. ශ්‍රී ලංකාවේ අපනයන තවමත් ඉතා අඩු මට්ටමේ තාක්ෂණය පදනම් කරගත් භාණ්ඩ අතළොස්සක් මත සංකේන්ද්‍රණය වී පවතී. තරගකාරී නොවන විනිමය අනුපාතික පවත්වාගෙන යාමත් ඉතා ඉහළ මට්ටමේ සඵල ආරක්ෂණ අනුපාතිකයනුත් නිසා ඉතා ප්‍රබල අපනයන විරෝධි අහිතතියන් (anti-export bias) නිෂ්පාදන ක්‍රියාවලියෙහි ගොඩ නැගී ඇත.

- රාජ්‍ය මූල්‍ය හැසිරීමද තිරසාර වෘද්ධි ක්‍රියාවලියක් සඳහා දැඩි බාධකයක් ව පවතී. කාලයක් තිස්සේ රාජ්‍ය අයභාරය පහළ වැටීමත් රාජ්‍ය ණය ඉහළ නැගීමත්, විදේශ ණය මත රඳා පැවැත්ම වැඩිවීමත් සාර්ව ආර්ථික අස්ථායිතාව වැඩි කිරීමට දායක වී ඇත.

- නියාමන ක්‍රියාවලිය ද දේශීය හා විදේශීය දෙපාර්ශ්වයේම ආයෝජකයන් අධෛර්යට පත් කොට තිබේ.

- ශ්‍රම හමුදාවේ නිපුණතා ව්‍යුහය තරගකාරී ගෝලීය ආර්ථිකයේ අවශ්‍යතාවන් සමග නොගැලපේ. වයස අවුරුදු 15ට වැඩි ජනගහනයේ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව 22%කි. පරිගණක සාක්ෂරතාව 23%කි. වයස අවුරුදු 15ට වැඩි ජනගහනය තුළ තෘතියික අධ්‍යාපනය ලැබූ සංඛ්‍යාව 3.1%කි. 2015 වර්ෂයේ දී සාමාන්‍ය පෙළ ගණිතය අසමත් ප්‍රතිශතය 45%කි.

- යටිතල පහසුකම් ව්‍යුහයේ ගුණාත්මක භාවය දුර්වල වන අතර, ඒවායේ මිල ගණන් ද ආයෝජකයන්ට අහිතකරය බලශක්ති මිල, ප්‍රවාහන ගාස්තු, මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශ වීම යන කරුණු ආයෝජන හිතකාමී නොවේ. විශේෂයෙන් ඒවා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට අවාසිදායක වී ඇත.

- රාජ්‍ය ව්‍යවසායකයන්ගේ සාධනය ඉතා දුර්වල මට්ටම පැවැතීම රාජ්‍ය මූල්‍ය මත පීඩනය වැඩි කරයි. අකාර්යක්ෂම රාජ්‍ය ව්‍යවසායන් නඩත්තු කිරීමට රාජ්‍ය සම්පත් වැඩි වැඩියෙන් යොමු කිරීමට සිදුවී ඇත.

- දිගුකාලීන පැහැදිලි ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් නොතිබීම.

(එක් කරුණකට ලකුණු 01 බැගින්
ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

10වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



අපේක්ෂකයන්ගෙන් 6%ක් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වෙයි.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 82%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 10%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 6%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 2%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.



මෙම ප්‍රශ්නයේ කොටස් 4ක් ඇති අතර (ii) කොටස වඩාත් ම අපහසු වී ඇත. එහි පහසුතාව 05%කි. පහසුතාව වැඩි ම කොටස (iv) වේ. එහි පහසුතාව 22%කි. (i) වන සහ (iii) වන කොටස් ද අඩු පහසුතාවක් ගෙන ඇති අතර ඒවායේ පහසුතා 16% හා 6% බැගිනි. සමස්තයක් ලෙස ගත්විට අඩු ම පහසුතාව සහිත ප්‍රශ්නයයි.

- 10වන ප්‍රශ්නයේ (i) කොටස සඳහා අපේක්ෂකයින් 16%ක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. අදාළ කොටස මගින් විමසා තිබුණේ ගෝලීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ තරගකාරීත්වය ඉහළ නැංවීමෙහිලා යෝග්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග පිළිබඳව ය. අපේක්ෂකයින් ඉතා ඉහළ ප්‍රතිශතයක් අසාර්ථක පිළිතුරු සැපයීමට හේතු වී තිබුණේ පිළිතුරු ලෙස අපේක්ෂා කළ ස්ථාවර ජාතික සංවර්ධන ප්‍රතිපත්ති, නිලධාරි වාදය සීමා කිරීම, නවෝත්පාදන ප්‍රතිපත්ති, සාර්ව ආර්ථික ස්ථායීතාව වැඩි දියුණු කිරීමේ ප්‍රතිපත්ති සඳහන් කොට නො තිබීමය. මෙහිලා කාලීන තොරතුරු මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු නො කිරීම ප්‍රබල ම දුර්වලතාව වී ඇත.

- (ii) කොටස සඳහා අපේක්ෂකයින් 5%ක් වැනි අවම ප්‍රතිශතයක් පමණක් නිවැරදි ලෙස පිළිතුරු ලබා දී තිබුණි. අදාළ කොටස මගින් විමසා තිබුණේ 2002 - 2016 කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව සහ ආදායම් විෂමතාවයේ උපනති පරීක්ෂා කරන ලෙසය. නමුත් අපේක්ෂකයින්ගෙන් 95% ක් වැනි ඉහළ ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇත්තේ අදාළ ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමට අවශ්‍ය කරන සංඛ්‍යා දත්ත පිළිබඳ දැනුම නොමැතිවීම නිසාය. **ප්‍රවණතා විමසා ඇති විට එක් වර්ෂයක දත්ත ඉදිරිපත් කිරීම නො සෑහේ. වර්ෂ කිහිපයක දත්ත අතර සැසඳීමක්** කළ යුතුය.

- (iii) කොටස සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින්ගෙන් 6%ක් වැනි සුළු ප්‍රතිශතයකි. මෙම ගැටලුව මගින් විමසා තිබුණේ 1977 දී ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබූ ආර්ථික නිර්බාධීකරණ ප්‍රතිසංස්කරණවල ප්‍රධාන අංග පිළිබඳව ය. අපේක්ෂකයින් 94%ක් පමණ නිවැරදි පිළිතුරු සැපයීමට අසමත් වී ඇත්තේ 1977 දී හඳුන්වා දෙන ලද නිර්බාධීකරණ ප්‍රතිසංස්කරණවල ප්‍රධාන අංග ලෙස ආනයන ලිහිල් කරණය, විනිමය පාලනයන් ලිහිල් කිරීම, මුදලේ විදේශ අගය තීරණය වීම ඉල්ලුම් හා සැපයුම් බලවේග මත සිදුවීමට ඉඩ දීම ආදී ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුම ප්‍රමාණවත් නො වීම නිසාත් ය. නිදහසෙන් පසු ශ්‍රී ලංකාවේ විවිධ අවධීන්වලදී ක්‍රියාත්මක වූ ආර්ථික ප්‍රතිපත්ති හා ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුම සංවර්ධනය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය. විශේෂයෙන් විෂය නිර්දේශයේ 12වන නිපුණතාව කෙරෙහි වැඩි අවධානය යොමු කරමින් සිසුන්ට දැනුම ලබා දීමට කටයුතු කළ යුතුය.

- (iv) වන කොටස සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින් අතුරෙන් 22%ක් පමණි. අදාළ කොටස මගින් විමසා තිබුණේ තිරසාර හා වේගවත් ආර්ථික වෘද්ධියක් අත්කර ගැනීමට ශ්‍රී ලංකාව ජය ගත යුතු ප්‍රධාන අභියෝග පිළිබඳව ය. අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇත්තේ ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික තත්වය පිළිබඳව මනා අවබෝධයක් නො තිබීම නිසා ඒ මත පිහිටා තීරණ ගැනීමේ හැකියාව අපේක්ෂකයින් තුළ නොමැති වීම නිසයි. මෙහි දී ආර්ථික වෘද්ධිය ප්‍රධාන වශයෙන් ණය මත ගොඩනගන ලද යටිතල පහසුකම් මත පදනම් වීම, එම නිසා ඇතිවන අයවැය හිඟය හා ගෙවුම් ශේෂ හිඟය ආයෝජන විශ්වාසය පළුදු කිරීමට හේතු වීම, ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ සාධනීයත්වය දුර්වල වීම, සඵල ආරක්ෂණය නිසා අපනයන විරෝධී අභිනතීන් නිෂ්පාදන ක්‍රියාවලිය තුළ ගොඩ නැගීම ආදී කරුණු පිළිතුරු මගින් අපේක්ෂා කෙරේ. කාලීන මූලාශ්‍ර ඇසුරෙන් පවත්නා ආර්ථික වෘද්ධි වේගය, අපේක්ෂිත තිරසාර ආර්ථික වෘද්ධි වේගය, ඉලක්ක ළඟා කර ගැනීමේ දී මුහුණ දීමට සිදුවන අභියෝග ආදිය සංසන්දනය කරමින් කරුණු විග්‍රහ කිරීමට සිසුන් තුළ කුසලතා සංවර්ධනය කළ යුතුය.

2.2.3. 2018 වර්ෂයේ සිසුන්ගේ පිළිතුරු පත්‍රවල දක්නට ලැබුණු පොදු දුර්වලතා හා ඒ සඳහා විසඳුම් යෝජනා

පිළිතුරු සැපයීමේදී විභාග අපේක්ෂකයින් සඳහා සුවිශේෂී මගපෙන්වීම

පහත දක්වා ඇත්තේ 2018 වර්ෂයේ පැවැත්වූ අ.පො.ස. (උ.පෙළ.) විභාගයට පෙනී සිටි අපේක්ෂකයින් දෙදෙනෙකු ආර්ථික විද්‍යාව ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයේ 1 වන ප්‍රශ්නය සඳහා සපයන ලද පිළිතුරුය. එක් පිළිතුරක් උපරිම ලකුණු ලබා ගත් පිළිතුරක් වන අතර අනෙක ඉතා අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගත් පිළිතුරක් වේ.

උපරිම ලකුණු ලබා ගත් පිළිතුර



i) ශ්‍රමය	ව්‍යවසායකත්වය
නිශ්චිත වැටුපක් හෝ ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් කායික හෝ මානසික වෙහෙසක් වැය කිරීමයි	නිෂ්පාදන සාධක සංවිධානය කර අවදානම් දරමින් නව නිෂ්පාදන සිදු කිරීම සඳහා කටයුතු කිරීමයි.
ලක්ෂණ	ලක්ෂණ
• ශ්‍රමයේ ඉපයීම වැටුප් වේ.	• වැටුප් නොලබයි.
• ලාභ නොලබයි.	• ව්‍යවසායකත්වයේ ඉපයීම ලාභය
• අවදානම් දරා නොගනියි.	• අවදානම් දරා ගනියි.
• ව්‍යාපාරය සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ නොගනියි.	• ව්‍යාපාරය පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගනියි.
• සෙසු නිෂ්පාදන සාධක සංවිධානය නොකරයි.	• සෙසු නිෂ්පාදන සාධක සංවිධානය කරයි.
• නව්‍යකරණ සම්පාදනය නොකරයි.	• නව්‍යකරණ සම්පාදනය කරයි.

ඉහත වගුව අනුව පැහැදිලි වන්නේ ව්‍යවසායකත්වය, ශ්‍රමයෙන් වෙනස් වන්නේ කෙසේද යන්නයි

අඩු ලකුණු ලබා ගත් පිළිතුර

i)

නිෂ්පාදන සාධකයක් ලෙස , ව්‍යවසායකත්වය යනුවෙන් අදහස් කරනුයේ සම්පත් හෝ ප්‍රාග්ධනය යොදා ගෙනවත් නව නිමැවුම් සොයා - ක නවෝත්පාදනය කිරීමයි.

ව්‍යවසායකත්වයේ ලක්ෂණ ලෙස,

* නිශ්චිත සම්පත් සංවිධ කරන්නා නව්‍යතා නිසා වීම.
* ඉහළ ව්‍යවසායක ගෙවීම ලාභ වේ
* අවදානම් දැරීමට සිදු වේ.

නිෂ්පාදන සාධකයක් ලෙස ශ්‍රමය යනුවෙන් අදහස් කෙරෙනුයේ යම් කාර්යයක් කිරීමට දායක වන ශක්තිය නොහොත් ශ්‍රම සම්පතයි.

එහි ඇති ලක්ෂණ ලෙස,

* ශ්‍රමයට හිමිවන්නේ වැටුප්ය
* ශ්‍රමය විශේෂිකරණය කළ හැකිය.

i කොටස -

මෙම පිළිතුරු දෙකෙහි පැහැදිලිතාවය, නිර්වචනය කිරීම, ප්‍රශ්නයට අදාළව වෙනස්කම් සන්සන්දනාත්මකව දැක්වීම හා ඒවා ඉදිරිපත් කිරීමෙහි පැහැදිලි වෙනසක් දැකගත හැකිය. ඒ අනුව විභාග අපේක්ෂකයන් පිළිතුරු සැපයීමේදී ප්‍රශ්නයෙන් කරුණු විමසන ආකාරයට පිළිතුරු සැපයීම ඉතා වැදගත් බව අවධාරණය කරගත යුතුය.

උපරිම ලකුණු ලබා ගත් පිළිතුර

ii) වැඩෙන ආවස්ථික පිරිවැය නියමය යනු යම් නිශ්චිත ආර්ථිකයක ආර්ථිකයක් සතු ස්ථාවර සම්පත් සම්භාරය තාක්ෂණ තත්ත්වය යටතේ පූර්ණ හා උපරිම මට්ටමෙන් සියලු භාණ්ඩ දෙකක් සම්පත් නිෂ්පාදනය සඳහා යෙදූ විට එම භාණ්ඩ දෙකේ විකල්ප සංයෝග එකිනෙක හා සසඳමින් දක්වන ලබන නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත එක් ලක්ෂ්‍යයක සිට තවත් ලක්ෂ්‍යයකට ගමන් කිරීමේ දී එක් භාණ්ඩයක නිෂ්පාදන සමාන ඒකක ප්‍රමාණයකින් වැඩි කරගැනීම සඳහා අනෙක් භාණ්ඩ නිෂ්පාදනයෙන් කැප කරන ඒකක ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවීම් ~~සහ~~ ක්‍රමය නැතහොත් ආවස්ථික පිරිවැය අනුපාතය

ක්‍රමයෙන් ඉහළ යාම් කරන්වයයි.

වැඩෙන ආවර්ජිත පිරිවැය වක්‍රයක් [illegible] මූලයට අවතල වූ හැඩයක් ගනී.

වැඩෙන ආවර්ජිත පිරිවැය නීතියට හේතු -

* සම්පත් සංයෝග ලබාදෙන අනුපාතය හොඳින් නිෂ්පාදන ශිල්ප ක්‍රමය සමාන නොවීම

* ~~[illegible]~~ යොදාගන්නා සම්පත් විශේෂිත වීම

* යොදාගන්නා සම්පත් අතර පූර්ණ ආදේශනයක් නොමැති වීම ([illegible]

අඩු ලකුණු ලබා ගත් පිළිතුර

ii) වැඩෙන ආවර්ජිත පිරිවැය යනු එක් භාණ්ඩයක් නිෂ්පාදනය සඳහා අනෙක් භාණ්ඩයෙන් වැඩි ප්‍රමාණයක් කැප කිරීමට සිදුවන නිසා වැඩෙන ආවර්ජිත පිරිවැය නීතිය ලෙස සඳහන්වේ. වැඩෙන ආවර්ජිත පිරිවැය මූලයට අවතල හැඩයක් [illegible] යන මඟින් පෙන්නුම් කරනු ලබයි.



* ~~වැඩෙන~~ ආවර්ජිත පිරිවැයට හේතු වලින,
- නිෂ්පාදන සාධක විශේෂිත වීම
- ශ්‍රම හැකියා විවිධත්ව යුතු විට
- [illegible] විශේෂිත විට
- [illegible] හා [illegible] වල [illegible] [illegible] යුතු.

ii කොටස

මෙවැනි ව්‍යුහගත රචනාමය ස්වරූපයේ ප්‍රශ්නයක විමසන කරුණු ඉදිරිපත් කිරීමේ දී පිළිතුර ක්‍රමානුකූලව ගොඩනගා ගත යුතුය. තමන්ගේ පිළිතුර ගොඩ නගා ගැනීමේ දී භාෂාව හැසිරවීම පිළිබඳව ද සැලකිලිමත් විය යුතුය. පිළිතුරක් නිවැරදි හා පහසුවෙන් කියවා වටහා ගැනීමට හැකි වීම පිළිතුරුපත් පරීක්ෂකයන්ගේ විශ්වාසය තහවුරු කිරීමට හේතු වේ. කරුණු ඉදිරිපත් කිරීමේ දී නිවැරදි රටාවක් අනුගමනය කළ යුතුය. අනවශ්‍ය කරුණු ඉදිරිපත් කරන විට ඒ සඳහා ලකුණු හිමි නොවන අතරම අපේක්ෂකයාට වෙනත් පිළිතුරක් සැපයීමට ලැබෙන කාලය සීමිත වේ. ඒ පිළිබඳවද අවධානය යොමු කළ යුතුය.

උපරිම ලකුණු ලබා ගත් පිළිතුර



අඩු ලකුණු ලබා ගත් පිළිතුර





iv කොටස -

නිවැරදි විස්තර කිරීමක් ප්‍රස්තාරයක් මගින් දැක්වීමේ දී නිවැරදිව ප්‍රස්තාරයේ මූලික කොටස් නම් කිරීම හා ලකුණු කිරීම සිදු කළ යුතුය. හොඳින් දන්නා කරුණු ඉදිරිපත් කිරීමේ දී වුව ද, අතපසුවීම් හා නොසැලකිල්ල හේතුවෙන් ලකුණු අහිමි කර ගැනීම මෙම පළමු පිළිතුරෙහි දැකගත හැකිය. විශේෂයෙන් නිෂ්පාදන හැකියා මායිමක අක්ෂ නම් කිරීමේ දී භාණ්ඩ වර්ග දෙකක් යොදා ගැනීම කළ යුතුය.

v) එකඟ නොවේ.

- ආර්ථික නොවන භාණ්ඩයක් යනු සමාජයේ කවර පාර්ශවයක් විසින් හෝ සැබෑ පිරිවැයක් දරා නොමැති, ශූන්‍ය ආවස්ථික පිරිවැයක් පවතින, නිෂ්පාදන ක්‍රියාවලියක් තුලින් බිහි නොවූ භාණ්ඩයකි.

~~ආර්ථික නොවන භාණ්ඩයක් ... නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැයක් නො~~

ඒ අනුව කිසියම් භාණ්ඩයක් පරිභෝජනය කරන විට මිලක් අය කරනු ලැබේද නොලැබේද යන කරුණ මත ආර්ථික භාණ්ඩයක් හෝ ආර්ථික නොවන භාණ්ඩයක් ලෙස වෙන් කළ නොහැක.

පරිභෝජනයේ දී ඒ සඳහා මිලක් නොලැබුණද ඒ භාණ්ඩය නිෂ්පාදනයේ සමාජයේ කවර පාර්ශවයක් විසින් ඒ සඳහා සැබෑ පිරිවැයක් දරා, ශූන්‍ය නොවන ආවස්ථික පිරිවැයක් පවතින, නිෂ්පාදන ක්‍රියාවලියක් තුලින් බිහි කරන ලද භාණ්ඩයක් විය හැක. එවැනි වූ විට එය ආර්ථික භාණ්ඩයක් විය යුතුය.

මේ අනුව පැහැදිලි වන්නේ කිසියම් භාණ්ඩයක් පරිභෝජනයේදී මිලක් අයකරනු නොලැබුවද ඒ සඳහා නිෂ්පාදනයේ සැබෑ පිරිවැයක් කවර පාර්ශවයක් විසින් හෝ දරා ඇති නම් එය ආර්ථික නොවන භාණ්ඩයක් නොවේ එය ආර්ථික භාණ්ඩයක් වන බවයි.

උදා :- පාසල් ළමුන්හට නොමිලයේ ලැබෙන පාසල් පෙළපොත්.

මෙහිදී පාසල් පෙළපොත් සිසුන්හට නොමිලයේ ලැබුණද මේ සඳහා රජය විසින් පිරිවැයක් දරා ඇති නිසා මේවා ආර්ථික භාණ්ඩයකි.

අඩු ලකුණු ලබා ගත් පිළිතුර


v)

එකඟ වේ.

කිසියම් කාර්යයක් පරිභෝජනය කරන විට එම කාර්යය සඳහා මිල නියම නොකෙරෙනුයේ නම් එම කාර්යය ආර්ථික කාර්යයක් නොවේ. ~~එම~~ ආර්ථික කාර්යයක් නම් ඇ එම කාර්යය නිෂ්පාදනය සඳහා යම් කිසි පිරිවැයක් දැරිය යුතු වේ. එවිට එයට මිලක් කරනු ලබයි. එහෙත් ~~එම~~ මෙම කාර්යයට මිලක් නොනියමිට ~~...~~ ඒකාන පොදු ලෙස මෙම කාර්යයේ පිරිවැය ඇතැයි සිතිය නැත. ~~...~~ නිදසුනක් ලෙස සූර්යයා ලෝකය ~~... කාර්යයක්~~ ආර්ථික නොවන කාර්යයක් වේ. ඇඳුම් රෙදි වේලීමට සූර්යයා ලෝකය පොදු ගත හැකිය එවිට ඒ සඳහා පිරිවැයක් දැරීමට සිදු නොවේ. එම නිසා එය ආර්ථික කාර්යයක් නොවේ. එයට පිරිවැයක් නොමැති හෙයින් මිල නියමවද නොහැකිය. එම නිසා කාර්යයක් පරිභෝජනය කරන විට මිලක් අයකරනු නොලැබුවේ ~~එම පොදුම නිසා~~ එය ආර්ථික නොවන කාර්යයක් නිසා වේ.

V කොටස -

පිළිතුරු සැපයීමේ දී සංකල්ප හා න්‍යායාත්මක කරුණු නිවැරදිව හඳුනාගෙන එම අවබෝධය භාවිතයට ගත යුතුය. මෙහි දෙවන පිළිතුර සැපයීමේ දී ප්‍රශ්නයෙන් විමසා ඇති දේ වටහාගෙන නැති අතර ඉදිරිපත් කර ඇති කරුණු ප්‍රශ්නයෙන් අපේක්ෂිත පිළිතුරට අදාලව නිවැරදිව ගලපා නොමැත.

පිළිතුරු සැපයීමේදී විභාග අපේක්ෂකයින් සඳහා සුවිශේෂී මගපෙන්වීම

ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයේ 6 වන ප්‍රශ්නයට අපේක්ෂකයින් දෙදෙනෙකු විසින් සපයන ලද පිළිතුරු පහත දැක්වේ. එක් පිළිතුරක් ඉහළ ලකුණු ලබා ගත් පිළිතුරක් වන අතර අනෙක ඉතා අඩු ලකුණු ලබා ගත් පිළිතුරක් වේ.

උපරිම ලකුණු ලබා ගත් පිළිතුර

මේ වන විට ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ භාවිතවන උද්ධමන මිල දර්ශක 4 කි. එනම්

- කොළඹ පාරිභෝගික මිල දර්ශකය
- ජාතික පාරිභෝගික මිල දර්ශකය
- නිෂ්පාදකයන්ගේ මිල දර්ශකය
- ගම්‍ය මිල දර්ශකය

i කොටස

පිළිතුරු සැපයීමේ දී මෙම ආකාරය ඉතා යෝග්‍ය වන බැවින්, ඒ සඳහා ශිෂ්‍යයන්ට මඟ පෙන්විය යුතුය. පිළිතුරක් සැපයීමේ දී ප්‍රශ්නයේ විමසන පිළිවෙලට පිළිතුරු ලබා දීම වැදගත් වේ. මිල දර්ශක හතරක් නිවැරදිව නම් කොට ඇත.

අඩු ලකුණු ලබා ගත් පිළිතුර

ශ්‍රී ලංකාවේ පොදු මිල මට්ටම මැනීම සඳහා විවිධ මිනුම් යොදා ගනු ලබයි. උද්ධමනය, අවධමනය, ආයෝජන, උත්පාදන හා අපනයන එනම උදාහරණ වේ.

i කොටස

ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ පොදු මිල මට්ටම මනින මිනුම් වුවත් මෙම පිළිතුරේ එවැනි කිසිදු මිනුමක් ඉදිරිපත් කර නැත. පිළිතුර කිසිසේත් ම අදාළ නො වේ.

උපරිම ලකුණු ලබා ගත් පිළිතුර

ii) මුදලේ අගය අඩු වේ
මූර්ත ආදායම අඩු වේ
මූර්ත පොලිය අඩු වේ
ඉතුරුම් අධෛර්යමත් වේ
දේශීය භාණ්ඩවල විදේශීය තරගය අඩු වේ
මෙනුපත් පිරිවැය
සපත්තු සම් පිරිවැය

ii කොටස

උද්ධමනයේ අහිතකර ප්‍රතිවිපාක සංක්ෂිප්තව නිවැරදිව දක්වා ඇත.

අඩු ලකුණු ලබා ගත් පිළිතුර

(ii). මූර්ත ආදායම පහළ යාම.
[illegible] ආදායම පහළ යාම.
අපනයන අඩු වී සංචිත ලැබීම් අඩු වීම.
වෙළෙඳපොළ සැපයුම අඩු වී ඉල්ලුම ද අඩු වී වෙළෙඳපොළ අසාර්ථකවීම
කළු මුදල් / කළු කඩ වෙළෙඳපොළක් ඇති වීම
ආයෝජනය අඩු වීම,

ii කොටස

පහසු ප්‍රශ්නයකට වුවද පිළිතුරු සැපයීමේ දී තාර්කිකව කරුණු ගොඩනගා ගැනීම කල යුතුය. තමන් ඉදිරිපත් කරන කරුණු පිළිබඳව ද වඩාත් සැලකිලිමත් විය යුතුය. උද්ධමනයේ අහිතකර ප්‍රතිවිපාක ලෙස දක්වා ඇති පිළිතුරු වඩා නිවැරදිව දක්වා නැත.

උපරිම ලකුණු ලබා ගත් පිළිතුර

iii)
අ) අවශ්‍ය සංචිත අනු. $= \frac{10\,000}{100\,000} \times 100$
$= 10\%$

iii (අ) කොටස
දී ඇති තොරතුරු මත අවශ්‍ය සංචිත අනුපාතය නිවැරදි ලෙස ගණනය කොට ඇත.

අඩු ලකුණු ලබා ගත් පිළිතුර



iii (අ) කොටස
මෙහි ගණනය සඳහා යොදා ගෙන ඇත්තේ තැන්පතු සංගුණකය වේ. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ගණනය කළ යුත්තේ මුළු තැන්පතු ප්‍රමාණය හා අවශ්‍ය සංචිත ප්‍රමාණය අනුපාතය ලෙස ගෙනය.

උපරිම ලකුණු ලබා ගත් පිළිතුර



iii (ආ) කොටස

තැන්පතු අඩුවන ප්‍රමාණය හා සංචිත අඩුවන ප්‍රමාණ නිවැරදිව සඳහන් කර ඇත.

අඩු ලකුණු ලබා ගත් පිළිතුර



iii (ආ) කොටස
සංචිත අඩුවන ප්‍රමාණය දක්වා ඇත්තේ වැරදි ලෙසය. එය අඩුවන ප්‍රමාණය ගණනය කළ ආකාරය සඳහන් කර නැත.

උපරිම ලකුණු ලබා ගත් පිළිතුර

ඉ) ගණනය

අධි සංචිතය $= \left(13\,000 - 98\,000 \times \frac{10}{100}\right)$

$= 13\,000 - 9\,800$

$= 3\,200$ //

* බැංකුවට අළුතින් ලබාදිය හැකි උපරිම ණය ප්‍රමාණය 3 200 //

iii (ඉ) කොටස

සංචිත අඩුවීම නිසා අලුතින් සැපයිය හැකි ණය අඩුවන ප්‍රමාණය නිවැරදි ප්‍රවේශය ඔස්සේ ගණනය කර පෙන්වා ඇත. ගණනය කිරීම පැහැදිලිව දැක්වීමට හුරු පුරුදු විය යුතුය. එසේම අවසානයේ පිළිතුර ලිවීම ද ඉතා වැදගත්ය.

අඩු ලකුණු ලබා ගත් පිළිතුර

ඉ) රු. 80 000

iii (ඉ) කොටස

සංචිත අඩුවීම නිසා අලුතින් සැපයිය හැකි ණය අඩුවන ප්‍රමාණය දක්වා ඇත්තේ වැරදි වටිනාකමකි. එය ලබා ගත් ප්‍රවේශයක්ද පෙන්වා නැත.

උපරිම ලකුණු ලබා ගත් පිළිතුර

iv) මූල්‍ය ප්‍රතිපත්තිය යනු ආර්ථිකයක මුදල් සැපයුම හා පොලී අනුපාතය යන උපකරණ මගින් සාර්ව ආර්ථික විචල්‍යයන්ට බලපෑම් කොට සාර්ව ආර්ථික අරමුණු ඉටු කරගැනීම සඳහා මහබැංකුව දරන උත්සාහයයි.

iv කොටස

මූල්‍ය ප්‍රතිපත්තිය සතුටුදායක ලෙස විස්තර කර ඇත.

අඩු ලකුණු ලබා ගත් පිළිතුර


(iv) "මූල්‍ය ප්‍රතිපත්තිය" යනු මහ බැංකුව විසින් ආර්ථික ස්ථායීතාවය පවත්වාගෙන යාම සඳහා, ක්‍රියාත්මක කර ඇති මිල ස්ථායී උපකරණයකි,

iv කොටස

මූල්‍ය ප්‍රතිපත්තිය විස්තර කර ඇති ආකාරය සතුටුදායක නො වේ. විශේෂයෙන් සාර්ව ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීමට, මුදල් සැපයුම සහ පොළී අනුපාතය පාලනය කරමින් සමාහාර ඉල්ලුමට බලපෑම් කරන ප්‍රතිපත්ති යන්න පිළිතුරට ඇතුළත් කර නැත.

උපරිම ලකුණු ලබා ගත් පිළිතුර



v) ප්‍රමාණාත්මක ණය පාලන ක්‍රම	ගුණාත්මක ණය පාලන ක්‍රම
මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම සඳහා ණය පාලනය කිරීම සඳහා ප්‍රමාණාත්මක වශයෙන් ගන්නා ක්‍රියාමාර්ග වේ.	මහබැංකුව විසින් සාර්ව ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේදී ණය පාලනය කිරීම සඳහා ගුණාත්මක වශයෙන් ගන්නා ක්‍රියාමාර්ග වේ.
• ප්‍රතිපත්ති පොලී අනුපාත වෙනස්කිරීම - බැංකු පොලී අනුපාතය - නිත්‍ය තැන්පතු පහසුකම් පොලී අනුපාතය - නිත්‍ය ණය පහසුකම් පොලී අනුපාතය	• ණය සඳහා සීමා නියම කිරීම • ණය සඳහා ඇප සුරැකුම් නියම කිරීම • ණයවර ලිපි සඳහා ආන්තික තැන්පතු නියම කිරීම
• ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වෙනස් කිරීම • විවෘත වෙළඳපොළ කටයුතු සිදුකිරීම	• විභේදනාත්මක ණය පොලී අනුපාත නියම කිරීම • යහ පෙළඹවීම් .

v කොටස

ප්‍රමාණාත්මක ණය පාලන ක්‍රම හා ගුණාත්මක ණය පාලන ක්‍රම වෙනස සංසන්දනය වන ලෙස නිවැරදිව විස්තර කර එම ණය පාලන උපකරණද ඉදිරිපත් කර ඇත.

(ආ). “ප්‍රමාණාත්මක ණය පාලන ක්‍රම” යනු, ගුණාත්මක නොවන යනු
මහජනතාවට තේරුම්ගත හැකි බව, එනම් ඔවුන්ට දැනෙන
පාලන ක්‍රම වේ. උදා:- (ඉහළ පොළී අය කිරීම ආදි,
“ගුණාත්මක ණය පාලන ක්‍රම” යනු, අදාළ රටේ මුදල්
පාලනය අයකරන නොවන රටේ සාධාරණ රටේ
අයකිරීම් වැනි කිසිදු මග පාලන ක්‍රම වේ.
උදා:- අධි අදායම් ලාභීන්ගෙන් අධි බදු ද, අඩු අදායම්
ලාභීන්ගෙන් බදු මැඩියුර ද අය කිරීම. එවිට අදායම්
බෙදී යාම ද සාධාරණ වී මුදල් ප්‍රමාණය ද පාලනය වේ
පවතී.
* ප්‍රමාණාත්මක ණය පාලනය මුදල් හා හිත තේරුම්ගත දැනෙන
නිසා ගුණාත්මක ණය පාලනය හා හිත කරන්නේ වෙනැ වේ.

V කොටස

ප්‍රමාණාත්මක හා ගුණාත්මක ණය පාලන ක්‍රම අර්ථ දැක්වීම වැරදි වන අතර එම ණය පාලන උපකරණය වෙන් වශයෙන් සඳහන් කර නැත. වෙනස්කම් දැක්වීමේ දී නිවැරදි ක්‍රම භාවිත කල යුතුය.

2.2.4 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

මෙම ඇගයීම් වාර්තාව සැකසීමේදී භාවිත කරන ලද තොරතුරු සංවිධානය කිරීමෙන්, II පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි තෝරාගැනීමේ ප්‍රතිශත හා පහසුතාව දැක්වෙන පහත සඳහන් ප්‍රස්තාරය සහ වගුව ගොඩනැගිය හැකිය.



ප්‍රශ්න අංකය	1	2	3	4	5	6	7	8	9	10
තෝරා ගැනීමේ ප්‍රතිශතය	98	84	56	17	43	61	80	49	36	6
පහසුතාව %	60	42	42	29	66	50	43	43	22	12

ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් ප්‍රශ්න “අ”කොටසට ද අංක 6 සිට 10 තෙක් ප්‍රශ්න “ආ” කොටසට ද අයත් ය. අපේක්ෂකයන් විසින් “අ” කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද “ආ” කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද වන සේ ප්‍රශ්න තෝරා ගනිමින් ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු විය.

“අ” කොටසේ ප්‍රශ්න පහ අතුරින් වැඩියෙන් ම තෝරාගැනීමට ලක්ව ඇත්තේ අංක 1 සහ 2 ප්‍රශ්න වන අතර “ආ” කොටසේ ප්‍රශ්න පහ අතුරින් වැඩියෙන් ම තෝරා ගැනීමට ලක්ව ඇත්තේ අංක 7 සහ 6 ප්‍රශ්න වේ. ඒවා තෝරාගනු ලැබීමේ ප්‍රතිශත පිළිවෙළින් 98%, 84%, 80% සහ 61% වේ. ඊළඟට වැඩි ම තෝරාගනු ලැබීමට පත්ව ඇත්තේ 3වන ප්‍රශ්නය යි. විකල්ප ප්‍රශ්න හයක් අතුරින් වැඩි ම තෝරාගනු ලැබීමට ලක්ව ඇති එම ප්‍රශ්නයට අපේක්ෂකයින්ගෙන් අඩකට වැඩි (56%) සංඛ්‍යාවක් පිළිතුරු සපයා ඇත. විෂය නිර්දේශයෙහි, මෙම ප්‍රශ්නවලට පාදක වූ තේමා සහ විෂය කරුණු, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ වැඩි අවධානයට ලක් වූ හා සිසුන් අතර වඩාත් ජනප්‍රිය වූ ඒවා ය. එබැවින් එම ප්‍රශ්නවල පහසුතා සාපේක්ෂ වශයෙන් ඉහළ අගය ගත යුතුය. ප්‍රශ්න තෝරා ගනු ලැබීමේ ප්‍රතිශතවල අවරෝහණ පටිපාටියෙහි මුලින් ම පිහිටන ප්‍රශ්න අනුපිළිවෙළින් අංක 1, 2, 7, 6 සහ 3 වේ. එහෙත් පහසුතාවල එම පටිපාටියෙහි මුලින් ම පිහිටන ප්‍රශ්න අනුපිළිවෙළින් 5, 1, 6, 7 සහ 8 වේ. අංක 1 සහ 2 ප්‍රශ්න වැඩියෙන් තෝරා ගනු ලැබ ඇති නමුදු, ඒවාට සපයන ලද පිළිතුරු එතරම් සතුටුදායක නොවන බවත් වැඩියෙන් ලකුණු උපයා ගැනීමට සමත් වී නොමැති බවත් මෙම තොරතුරුවලින් ගම්‍ය වේ. එබැවින් සිසුන්ගේ වැඩි අවධානයට ලක්වන මෙවැනි ප්‍රශ්නවලින් ඉහළ ලකුණු ලබාගැනීම සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුනට මඟ පෙන්වීම වඩාත් සාර්ථක ප්‍රතිඵල ලැබීමට මහෝපකාරී වේ.

වැඩි ම තෝරාගැනීම ඇති අංක 1 ප්‍රශ්නයෙහි වුව ද පහසුතාව 60%කට සීමා වී තිබීම ද ආර්ථික විද්‍යාව විෂයයෙහි ප්‍රගතිය අපේක්ෂා කරන්නන්ගේ අවධානයට ලක්විය යුතු කරුණකි. ස්ව අභිප්‍රේරණයෙන් යුතුව ප්‍රශ්නයකට පිළිතුරු සපයන්නෙකුට, සාමාන්‍ය වශයෙන් ප්‍රශ්නයට හිමි මුළු ලකුණුවලින් වැඩි ප්‍රතිශතයක් උපයා ගැනීමට හැකිවන ආකාරයට තම පිළිතුර නිවැරදි විෂය කරුණු ඇසුරෙන් සංවිධානය කර නිශ්චිතව ඉදිරිපත් කිරීමට ද මඟ පෙන්වනු ලැබිය යුතුය.

අඩුවෙන් ම තෝරා ගනු ලැබ ඇත්තේ අංක 10 ප්‍රශ්නය වන අතර එහි පහසුතාව ද 12%ක අවම අගයකට සීමා වී ඇත. ඊට පාදක වී ඇති විෂය කරුණු කෙරෙහි පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ප්‍රමාණවත් අවධානයක් යොමු වී නැති බව පෙනේ. 13වන ශ්‍රේණියේ අවසාන වාරයේ දී සිසුන්ගේ පැමිණීම දුර්වල වීම මෙම තත්ත්වයට ප්‍රධාන හේතුවක් ලෙස සැලකිය හැකිය.

II පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සැලකූ විට පහසුතම ප්‍රශ්නයේ පහසුතාව වුවද 60%කට සීමාවීමත් අංක 5, 1 හා 6 හැර අනෙක් ප්‍රශ්න හතක පහසුතාව 50%ට වඩා අඩුවීමත් මෙම විෂයය හා සම්බන්ධ සියලු ම පාර්ශ්වකරුවන්ගේ අවධානයට ලක් විය යුතු කරුණකි. එමෙන් ම II ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව ද 46%කට සීමා වී ඇත. මෙම තොරතුරු ඇසුරෙන් අවධාරණය කෙරෙන්නේ ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලිය අනාවරණ පරීක්ෂණ කෙරෙහි යොමුවීමේත් ඉලක්ක ගත ප්‍රතිකාරක වැඩ සටහන් නො පමාව ක්‍රියාත්මක කරනු ලැබීමේත් වැදගත් අවශ්‍යතාවයි.

III කොටස

3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

පොදු උපදෙස්

* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කරගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය. එකම ප්‍රශ්නය කොටස් දෙකක් ලෙස එකට ලියැවී ඇති විට, කොටස් දෙකට ම පිළිතුරු සැපයීම කෙරේ අවධානය යොමු විය යුතුය.

* I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී වඩාත් නිවැරදි එක් වරණයක් තෝරා ගත යුතුය. තව ද පැහැදිලිව එම වරණයේ අංකය පමණක් උත්තර පත්‍රයේ යෙදිය යුතුය.

* II පත්‍රයේ (අ) හා (ආ) කොටස්වල ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.

* අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

* ප්‍රශ්න අංක හා කොටස් අංක හෝ අක්ෂර නිවැරදිව ලිවිය යුතුය.

* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නො කිරීම මෙන් ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීම ද නො කළ යුතුය.

* ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය. රූප සටහන් හෝ ප්‍රස්තාර සටහන් මගින් කරුණු නිරූපණය කිරීම බොහෝ විස්තර කිරීම් සංක්ෂිප්ත කර ගැනීමට උපකාර වේ.

* පිළිතුරු ලිවීමේදී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.

* ප්‍රශ්නයට අදාළ ලකුණු ප්‍රමාණය හා කාලය අතර පවතින සම්බන්ධය අනුව කාලය කළමනාකරණය කරගත යුතුය.

* ප්‍රස්තාර ඇඳීමේ දී අන්තඃඛණ්ඩ නිවැරදි ව දක්වා අංකනය කළ යුතු අතර, අක්ෂ හා ප්‍රස්තාර රේඛා නම් කිරීම ද ඉතා වැදගත් ය.

* සමීකරණ විසඳීමේ දී පිළිගත් ගණිත මූලධර්ම මත පියවරින් පියවර දැක්වීම වැදගත් ය.

* ඊතල හා වෙනත් සංකේත මගින් අර්ථ නිරූපණය කිරීමේ දී ඒවා අර්ථ කථනය කිරීම ද වැදගත් ය.

විශේෂ උපදෙස් :

* ආර්ථික විද්‍යා විෂයයේ භාවිත වන පාරිභාෂික යෙදුම් භාවිත කළ යුතුය.
  උදා : ස්වායත්ත පරිභෝජනය

* අවශ්‍ය තැන්හිදී සංඛ්‍යාත්මක වගු, ප්‍රස්තාර, සූත්‍ර හා සමීකරණ මගින් පිළිතුරු පැහැදිලි කළ යුතුය. ප්‍රස්තාර සටහන් ඇඳීමේදී නිවැරදි පරිමාණයකට ඇඳීමටත්, අක්ෂ නිවැරදිව නම් කිරීමටත් සැලකිලිමත් විය යුතුය.

* ගණනය කිරීම්වලදී එක් එක් පියවර පැහැදිලිව සඳහන් කළ යුතුය. අදාළ අවස්ථාවලදී නිවැරදි ව ඒකක සඳහන් කළ යුතුය.

* අවශ්‍ය තැන්හිදී නිවැරදි සංකේත භාවිත කළ යුතුය.

* අදාළ රූප සටහන් අඳින විට රේඛා නිවැරදිව නම් කිරීම හා ප්‍රවාහවල දිශාව නිවැරදිව දැක්වීම කළ යුතුය.

* ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අදාළ ඉතා වැදගත් සංඛ්‍යා, මෑත කාලීන දත්ත මතක තබා ගැනීමෙන් පිළිතුරු සැපයීම පහසු කරවයි. ඒ සඳහා පහත දැක්වෙන ක්ෂේත්‍ර වෙත අවධානය යොමු කරන්න.

  - ආර්ථික වෘද්ධි අනුපාතය
  - ප්‍රතිශීර්ෂ ආදායම
  - උද්ධමන අනුපාතය
  - විරැකියා අනුපාතය
  - දරිද්‍රතා දර්ශකය
  - අයවැය හිඟය
  - ගෙවුම් ශේෂ හිඟය
  - රාජ්‍ය ණය අනුපාතය
  - ආයෝජන අනුපාතය

* ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී තාර්කිකව පිළිතුරු සංවිධානය කරගෙන, අසා ඇති ප්‍රශ්නයට ගැලපෙන සේ පිළිතුරු පෙළ ගැස්වීමේ පරිචය ශිෂ්‍යයාට ලබා දීමට පන්ති කාමර ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

* ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවන්හි විශේෂ සටහන්, කුටුම්භ ආදායම් වියදම් සමීක්ෂණ වාර්තා, ශ්‍රම බලකා සමීක්ෂණ වාර්තා, දරිද්‍රතා තොරතුරු ආදිය පරිශීලනයට ශිෂ්‍යයා යොමු කරවන්න.

ප්‍රස්තාර සඳහා පොදු උපදෙස් :

- දත්තවලට අනුව ප්‍රස්තාර ඇඳීමේදී ප්‍රස්තාර කඩදාසි යොදා ගැනීම ඉතා වැදගත් වේ. ප්‍රස්තාර කඩදාසි භාවිත නො කිරීම නිසා නිවැරදි ව ගණනය කිරීම් කළ නො හැකි වීමෙන් අපේක්ෂකයින්ට ලකුණු අහිමි වන බව උත්තර පත්‍ර පරීක්ෂා කිරීමේ දී පෙනී යයි.

- අක්ෂ නිවැරදිව නම් නො කිරීම හා ප්‍රස්තාර රේඛා නම් නො කිරීම ලකුණු අඩු වීමට හේතුවකි. උදා-: නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ අක්ෂ නම් කරන විට X හා Y ලෙස පමණක් නම් කර ඇත්නම් ලකුණු දිය නො හැක. එය X භාණ්ඩය හා Y භාණ්ඩය ලෙස සටහන් කළ යුතුය.

- නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර අඳිනු ලබන විට අක්ෂ දෙක ස්පර්ශ වන පරිදි ඇඳීම ඉතාමත් ම වැදගත් වේ. එසේ නොමැති විට එය නිෂ්පාදන හැකියා මායිමක් නො වේ.

- සමීකරණ ප්‍රස්තාර ගත කිරීමේ දී ප්‍රස්තාර රේඛාවෙහි අන්තඃඛණ්ඩය හා බෑවුම නිවැරදිව අංකනය කළ යුතුය.

උදා-: QS = -1 + P



- සාර්ව ආර්ථික සමතුලිතය පෙන්වීමේ දී ආදායම් හා සමාහාර වියදම් ලකුණු කරන විට අක්ෂ දෙකෙහිදීම දත්ත (ඉලක්කම්) යොදන පරිමානය සමාන වන පරිදි ලකුණු කර, සම ආදායම් වියදම් රේඛාව ඇඳිය යුතුය. එසේම ස්වායත්ත විචල්‍යය වන ආදායම අනිවාර්යයෙන් ම තිරස් අක්ෂයේ සටහන් කළ යුතුය.

උදා-:



* සාර්ව ආර්ථික සමතුලිතය පෙන්වීමේ දී කාන්දුවීම් දැක්වෙන වක්‍රය ඍණ අන්තඃඛණ්ඩයකින් ආරම්භ වේ නම්, එය නිවැරදිව දැක්විය යුතුය.

උදා-:



3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

* සංකල්ප පිළිබඳ ව නිවැරදි හා නිශ්චිත දැනුම තිබිය යුතු අතර, සංකල්ප පිළිබඳ ප්‍රායෝගික භාවිත ප්‍රගුණ කළ යුතුය.

* ආර්ථික හා සමාජයීය කරුණුවල කාලීනව හටගන්නා වෙනස්වීම් හා ප්‍රවණතා පිළිබඳ ව සතුටුදායක අවබෝධයක් ලබා ගත යුතුය.

* මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය වැනි ආයතනවලින් නිකුත් කෙරෙන වාර්තා හා ප්‍රකාශන පරිශීලනය කිරීමට හුරුවිය යුතුය. එමගින් තම දැනුම යාවත්කාලීන කර ගත යුතුය.